# ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1. හැඳින්වීම

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, සමාජ ආරක්ෂණය, කාර්මික සාමය තහවුරු කිරීම, රැකියා වෙළඳපොල සඳහා පුහුණු ශ්‍රමිකයින් යොමු කිරීම, රැකියාගත කිරීම, රැකියා සුරක්ෂිතභාවය තහවුරු කිරීම සහ රට තුළ ඵලදායිතාවය ප්‍රවර්ධනය කිරීම තුළින් දේශීය ශ්‍රම බලකාය ආර්ථික සංවර්ධනයට වන දායකත්වය ඉහළ නැංවීමට අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම කම්කරු අමාත්‍යාංශයේ ප්‍රධාන මෙහෙවර වේ.

මෙම මෙහෙවර ඉටු කිරීමේදී තිරසර සංවර්ධන අරමුණු සහ ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර සම්මුතීන් මත පිහිටා 2022.07.22 දිනැති අංක 2289/43 සහ 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් නිවේදන ප්‍රකාරව පැවරී ඇති කාර්යභාරය සහ ජාතික ප්‍රතිපත්තීන් අනුව කම්කරු විෂය පථයට සහ අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතනයන්හි විෂය පථයන්ට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම මෙම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයභාරය වේ.

## 1.2. දැක්ම, මෙහෙවර හා අරමුණු

**දැක්ම**

තෘප්තිමත් ඵලදායි ශ්‍රී ලාංකික ශ්‍රම බලකායක්

**මෙහෙවර**

කාර්මික සාමය හා සහයෝගීතාව, සමාජ සුරක්ෂිතතාවය, කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ඵලදායිතාව ප්‍රවර්ධනය තුළින් සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීම

**අරමුණු**

- ත්‍රෛපාර්ශවීය සවිබල ගැන්වීම තුළින් සේව්‍ය-සේවක සබඳතා ශක්තිමත් කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව සේවා තත්ත්වයන් හා සේවක අයිතීන් තහවුරු කිරීම
- ළමා ශ්‍රම යෙදවුම් තුරන් කිරීම
- රැකියාවල නියුතු කාන්තාවන් සවිබල ගැන්වීම, වෘත්තීමය ආරක්ෂාව ශක්තිමත් කිරීම හා වෘත්තීමය නීති, අයිතිවාසිකම් තහවුරු කිරීම
- කම්කරු නීති රීති හා පරිපාටිවල නම්‍යශීලීත්වය ඉහළ නැංවීම
- වැඩ කරන ජනතාවගේ සමාජ සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා සුදුසු ක්‍රමෝපායන් සකස් කිරීම

## 1.3. අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයන්

- රජයේ ජාතික ප්‍රතිපත්තිය මත පිහිටා කම්කරු විෂයන්ට අදාළව ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සහ ව්‍යාපෘති සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසුවිපරම
- අමාත්‍යාංශ විෂය පථයට අයත්වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යයභාර්ය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම

- කම්කරු විනිශ්චය සභා පරිපාලනයට අදාළ අනෙකුත් කරුණු පිළිබඳව කටයුතු කිරීම
- ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව කම්කරු සබඳතා, ප්‍රමිතීන්, සේවක පරිපාලනය, සුභසාධනය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් ප්‍රතිපත්ති සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ ජාත්‍යන්තර සමාජ ආරක්ෂණ සංවිධානය සමඟ අන්තර් සහයෝගීතාව පවත්වා ගැනීම
- සේවක අර්ථසාධක අරමුදල, පෞද්ගලික අර්ථසාධක අරමුදල් සහ පෞද්ගලික විශ්‍රාම ගැන්වීමේ ක්‍රම පරිපාලනය හා නියාමනය කිරීම
- කාර්මික සබඳතා සහ කාර්මික ආරවුල් නිරාකරණය කිරීම
- කම්කරු සබඳතාවලට අදාළ නීති රීති සම්පාදනය සහ නියාමනයට අදාළ කටයුතු
- වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරයන් හඳුන්වා දීම සහ ක්‍රියාත්මක කිරීම
- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම
- පෞද්ගලික අංශයේ සියලු මට්ටම්වල සේවකයින් ආවරණය වන පරිදි සමාජ ආරක්ෂණ අරමුදලක් නිර්මාණය කිරීම
- සියලු සේවකයින් ආවරණය වන පරිදි සමාජ ආරක්ෂණ අරමුදලක් නිර්මාණය කිරීම
- කාන්තාවන්ට විධායක සහ කළමනාකරණ තනතුරුවල ඵලදායී ලෙස සේවයේ යෙදීමට ඇති බාධා ඉවත් කිරීම
- ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ලියාපදිංචි සේවකයින් සඳහා දිගුකාලීන රක්ෂණ සැලැස්මක් සහ විශ්‍රාමික ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමයක් හඳුන්වා දීම

## 1.4. අමාත්‍යාංශය යටතේ පවතින අංශ

### 1.4.1. පාලන සහ ආයතන අංශය

අමාත්‍යාංශයේ පරිපාලනය, කළමනාකරණය, සාමාන්‍ය නඩත්තුව, පුහුණු කිරීම සහ අමාත්‍යාංශය සහ ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතන සම්බන්ධීකරණය කිරීම සහ මානව සම්පත් කළමනාකරණය හා ඒ ආශ්‍රිත රාජකාරි මෙම අංශය යටතේ සිදු වේ.

ඒ අනුව,

- අමාත්‍යාංශයට අනුයුක්ත සියලුම රාජ්‍ය නිලධාරීන්ගේ මෙන්ම ගරු අමාත්‍යතුමන්ලාගේ සහාය කාර්ය මණ්ඩලයට අදාළ පෞද්ගලික ලිපිගොනු නඩත්තුව හා ඒ ආශ්‍රිත අනෙකුත් ආයතන කටයුතු හා කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීම
- අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවය කරන නිලධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය මඟින් සිදුකළ යුතු ආයතන හා පරිපාලන කටයුතු
- අමාත්‍ය මණ්ඩල සංදේශ සැකසීම හා අමාත්‍ය මණ්ඩල තීරණ පිළිබඳ ක්‍රියා කිරීම
- පවතින නීති යාවත්කාලීන කිරීම හා නව නීති පැනවීම තුළින් කාර්මික සහයෝගිතාවය, රැකියා ප්‍රවර්ධනය හා සුරක්ෂිතතාවය ඇති කිරීමට ප්‍රතිපත්තිමය දායකත්වය සැපයීම
- උපදේශක කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා වෙතින් සිදු කරන යොමු කිරීම් සඳහා පිළිතුරු සැපයීම මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම
- ජනාධිපති කාර්යාලය හා අගමැති කාර්යාලය මඟින් යොමු කරන මහජන පැමිණිලි මෙන්ම සෘජුව ම ලැබෙන මහජන ගැටළු අදාළ අංශ වෙත යොමු කිරීම
- අමාත්‍යාංශයේ වාහන පරිපාලනය, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම, පුහුණු කටයුතු, ප්‍රාග්ධන භාණ්ඩ හා උපකරණ

කළමනාකරණය, අතිකාල, නිවාඩු දින වැටුප්, අග්‍රහාර රක්ෂණ සහ ආපදා ණය අනුමත කිරීම ආදී කටයුතු සිදු කරනු ලබයි.

### 1.4.2. සංවර්ධන අංශය

ජාත්‍යන්තර කම්කරු සංවිධානය සමග එම සංවිධානයේ සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව විසින් ඇති කරගත් බැඳීම, අන්තර්ජාතික වශයෙන් පිළිගත් සම්මුතීන් හා නිර්දේශයන් යටතේ මෙරට කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම සහ කම්කරු ක්ෂේත්‍රයේ ගැටළු විසඳීම සඳහා උපයෝගී කර ගැනීම මගින් කම්කරු අමාත්‍යාංශය වෙනුවෙන් කටයුතු කිරීම මෙම අංශය මගින් ඉටු කරනු ලබයි.

- ශ්‍රී ලංකාව විසින් අපරානුමත කර ඇති ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ කම්කරු ප්‍රඥප්තීන්, ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම සම්බන්ධ ප්‍රගතිය නියමිත කාල වකවානුව තුල ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කිරීම.
- ශ්‍රී ලංකාව කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති ප්‍රගතිය මත පදනම්ව ජාත්‍යන්තර ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කිරීම
- කම්කරු ක්ෂේත්‍රය සම්බන්ධව පවතින ගැටළු විසඳීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබා ගැනීමට කටයුතු කිරීම.
- අමාත්‍යාංශය හා ඒ යටතේ වූ ආයතනවල නිලධාරීන් සඳහා විදේශ පුහුණුව ලබාදීමට ක්‍රියා කිරීම.
- නව නීති ඇති කිරීම හා පවත්නා කම්කරු නීති කාලයට ගැලපෙන ලෙස සංශෝධනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම, සහ ක්‍රියාත්මක කිරීම සහ පසු විපරම.
- නව අවබෝධතා ගිවිසුම් / එකඟතාවලට එළඹීම, ගිවිසුම් යාවත්කාලීන කිරීම, ගිවිසුම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳව පසු විපරම් කිරීම / ඒකාබද්ධ කමිටු රැස්වීම්වලට අදාළ කටයුතු සහ කලාපීය/ ගෝලීය සංවාද හා සම්බන්ධ කටයුතු.
- ජංගම සේවා වැඩසටහන් සංවිධානය කිරිම

### 1.4.3. සැලසුම් හා අධීක්ෂණ අංශය

අමාත්‍යාංශය හා ඒ යටතේ වන සියලුම අනුබද්ධිත ආයතනවල සංවර්ධන වැඩසටහන් නිවැරදි ඉලක්ක ඔස්සේ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීම, ඒවා ක්‍රියාත්මක කර වීම, ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම් කිරීම ප්‍රධාන කාර්යයභාරය වන අතර පහත සඳහන් කාර්යයන් ද ඉටු කරනු ලබයි.

- අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතන විසින් සිදු කරනු ලබන සංවර්ධන ඉලක්කයන් ඇතුළත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර අදාළ පාර්ශව වෙත යොමු කිරීම, ක්‍රියාත්මක කරවීම සහ සෑම මසකම ප්‍රගතිය ඇගයීම මඟින් ඉලක්ක වෙත ළඟා වීම අධීක්ෂණය හා දිරි ගැන්වීම
- ජාතික අයවැය චක්‍රලේඛ අනුව ජනාධිපති ලේකම් කාර්යාලය, මුදල් අමාත්‍යාංශය, ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය පැවැත්වීම හා ප්‍රගති වාර්තා මාසිකව හා ත්‍රෛමාසිකව ඉදිරිපත් කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ව්‍යාපෘති යෝජනා හඳුනා ගැනීම හා ඉදිරිපත් කිරීම
- අමාත්‍යාංශය විසින් අත්කරගත් ප්‍රගතිය ඇතුලත් වාර්ෂික කාර්යසාධන වාර්තාව සහ අයවැය කාරක සභා විවාදය සඳහා වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කොට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
- විෂයපථයට අදාළව සංවර්ධන ව්‍යාපෘති යෝජනා ඇගයීම සහ අදාළ පරිදි ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම
- වෙනත් අමාත්‍යාංශ විසින් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියාකාරී සැලසුම් සඳහා අදාළ පරිදි දායකත්වය සැපයීම

### 1.4.4. මූල්‍ය අංශය

වාර්ෂික අයවැය මඟින් අමාත්‍යාංශයට වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අදාළ අරමුණු ඉටුකර ගැනීම සඳහා කාර්යක්ෂමව හා ඵලදායී ලෙස භාවිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම ගිණුම් අංශයේ ප්‍රධාන වගකීම වේ.


- අදාල චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම
- මූල්‍ය අධිකාරියේ නියෝජිතායතනය සම්බන්ධ වාර්තා සකස් කිරීම සහ මූල්‍ය බලතල පැවරීමේ කටයුතු සිදු කිරීම
- වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම
- වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම
- රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා වාර්තාව සකස් කිරීම, මහා භාණ්ඩාගාරයට හා අදාළ අනෙකුත් ආයතනවලට මාසිකව හා කාර්තුමය වශයෙන් මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීම
- විගණන විමසුම් ලේඛන යාවත්කාලීන කර පවත්වා ගෙන යාම හා අදාළ විගණන විමසුම් සඳහා පිළිතුරු විගණකාධිපති වෙත යොමු කිරීම

### 1.4.5. අභ්‍යන්තර විගණන අංශය

- ජාතික විගණන පනතේ 38 (ආ) සහ (ඊ) හි දක්වා ඇති පරිදි ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම ඉටු වන බවට සහතික කිරීම සඳහා එම පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව සිදුකර ඇති පත් කිරීම් හා මු.රෙ. 133 හා 134 ප්‍රකාරව අභ්‍යන්තර විගණන අංශයට ලැබී ඇති බලතල හා කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අංක 01/2019 හා 2019/01/12 දිනැති චක්‍රලේඛය සහ ඊට අදාළ සංශෝධනයන්හි නියමයන් පරිදි අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු වේ.
- කම්කරු අමාත්‍යාංශය හා ඒ යටතේ පවතින දෙපාර්තමේන්තු හා ආයතනවල අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේ වගකීම හා අවශ්‍යතාවය අනුව විශේෂ පරීක්ෂණ සිදු කිරීම අභ්‍යන්තර විගණන විෂයට අදාළ විෂයපථය වේ.
- ආයතනයන් තුළ ක්‍රියාත්මක වන අභ්‍යන්තර සෝදිසි හා පාලන ක්‍රමයෙහි ක්‍රියාකාරීත්වයේ සාර්ථකත්වය සොයා බැලීම
- ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි සහ රාජ්‍ය පරිපාලන විෂයභාර අමාත්‍යාංශය විසින් සහ මහා භාණ්ඩාගාරය විසින් වරින්වර නිකුත් කරනු ලැබ ඇති හා නිකුත් කරනු ලබන චක්‍රලේඛ හා වෙනත් පරිපූරක උපදෙස් පිළිපදිනු ලබන්නේ ද යන්න සොයා බැලීම
- කම්කරු අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශය යටතට අයත් වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතනවල මෙහෙවර හා අරමුණු, විගණන මූලධර්ම පද්ධතියට අනුකූලව අභ්‍යන්තර විගණන කටයුතු ඵලදායි ලෙස කළමනාකරණය කිරීම
- අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි ප්‍රතිපත්ති, සැලසුම්, ක්‍රියා පටිපාටි, නීති සහ රෙගුලාසිවලට අනුකූල වීම සම්බන්ධව සහතික කිරීම සඳහා ස්ථාපිත කර ඇති පාලන පද්ධති ඇගයීමට ලක් කිරීම
- වත්කම් ආරක්ෂා කිරීම හා වත්කම්වල පැවැත්ම තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඇගයීම හා සත්‍යාපනය කිරීම
- භෞතික හා මූල්‍ය ප්‍රගතිය අමාත්‍යාංශයේ ස්ථාපිත අරමුණුවලට අනුකූලව ලබාගෙන ඇද්ද යන්න සොයා බැලීම සඳහා ක්‍රියාකාරකම් හෝ වැඩසටහන් ඇගයීමට ලක් කිරීම සහ තොරතුරු පරීක්ෂාව
- ආයතනයේ එක් එක් අංශ සඳහා සුදුසු අභ්‍යන්තර පාලන ක්‍රියාවලීන් සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලීන් ඇති කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම ලබා දීම
- විගණන ක්‍රියාවලියෙන් අනතුරුව සන්නිවේදනය කිරීම හා අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාවලියෙන් අනතුරුව ඉදිරිපත් කිරීම

- වාර්ෂික විගණන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම
- කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යැවිය යුතු වාර්තා නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම කැඳවීම සිදුකිරීම සහ පැවැත්වීම
- පාලනාධිකාරිය විසින් අවස්ථානුකූලව පවරනු ලබන විශේෂිත රාජකාරී ඉටුකිරීම සහ වාර්තා කිරීම

## 1.5 සංවිධාන සටහන


කම්කරු අමාත්‍යාංශය
අමාත්‍යාංශ ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (නීති)
අතිරේක ලේකම් (සංවර්ධන)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ප්‍රධාන ගණකාධිකාරී
ගණකාධිකාරී
නීති නිලධාරී
පරිපාලන නිලධාරී

## 1.6 අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන

### 1.6.1. කම්කරු දෙපාර්තමේන්තුව

කම්කරු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත ප්‍රධාන ආයතනයක් වන කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වනුයේ ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවක ප්‍රජාවට කම්කරු නීති මගින් හිමිකර දී ඇති අයිතිවාසිකම් තහවුරු කිරීම වේ. එසේම කම්කරු දෙපාර්තමේන්තුව සේව්‍ය-සේවක සබඳතාවයන් පෝෂණය කරමින් සහ සේවා යෝජකයන්ගේ සහයෝගය ඇතිව සේවක අයිතීන් ශක්තිමත් කරමින් කාර්මික සාමය ප්‍රවර්ධනය උදෙසා වර්තමානයේ ක්‍රියාකාරීව කටයුතු කරයි.

එසේම, ආයෝජන දිරි ගැන්වීම සඳහා වඩාත් හිතකර වූ පරිසරයක් නිර්මාණය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය අනුව, දශක ගණනාවක් පැරණි සහ සංකීර්ණ වූ කම්කරු නීති වෙනුවට සරල වූ ද සේව්‍ය සහ සේවක සම්බන්ධතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා දායක වන්නා වූ ද නව කම්කරු නීතිය හඳුන්වා දීමේ මූලික කටයුතු සඳහා කම්කරු දෙපාර්තමේන්තුව, කම්කරු අමාත්‍යාංශය වෙත අවශ්‍ය සහය ලබා දෙයි.

කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය ප්‍රධාන අංශ 14ක් යටතේ ක්‍රියාත්මක වන අතර, කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාල 11ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 40ක්, උප කම්කරු කාර්යාල 17ක් සහ දිස්ත්‍රික් කම්කරු කාර්යාල 10ක් යටතේ සිය සේවාවන් දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමේ දී ඉටු කරයි.

**ප්‍රධාන කාර්යයන්**

- සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම මගින් ආයතන මට්ටමින් සේව්‍ය හා සේවක සබඳතාවය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කිරීම
- කම්කරු නීති ක්‍රියාත්මක කිරීම තුළින් සේවක අයිතීන් ආරක්ෂා කිරීම
- නිරවුල් කිරීම, සාමූහික ගිවිසුම් සහ බේරුම්කරණය මගින් කාර්මික ආරාවුල් නිරවුල් කිරීම
- සේවක අර්ථසාධක අරමුදල මගින් සේවකයින්ගේ සමාජ ආරක්ෂණය සඳහා කටයුතු කිරීම
- සේවකයින්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- ළමා ශ්‍රමය තුරන් කිරීම සහ සේවයේ නියුක්ත කාන්තාවන්ගේ රැකවරණය සම්බන්ධයෙන් කටයුතු කිරීම
- වැටුප් හා සේවා කොන්දේසි ශක්තිමත් කිරීම මඟින් ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට කටයුතු කිරීම

### 1.6.2. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ගෝලීය හා දේශීය ශ්‍රම වෙළඳපොළ ප්‍රවණතා හඳුනාගනිමින්, ශ්‍රී ලංකාවේ මානව සම්පත ශ්‍රම වෙළඳපොළ හා ගැලපීම අරමුණු කරගනිමින් මානව සම්පත සංවර්ධනය, ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, වෘත්තීය මාර්ගෝපදේශනය හා රැකියා උත්පාදනය තුළින් ජාතික ආර්ථිකයට තරුණ ප්‍රජාවේ දායකත්වය ලබා ගැනීම යන අරමුණු සපුරා ගැනීම සඳහා මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව 2010.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

**ප්‍රධාන කාර්යයන්**

- ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම.
- රැකියා නිර්මාණ හා ප්‍රවර්ධන කටයුතු
- වෘත්තීය මාර්ගෝපදේශනයට අයත් කටයුතු
- ශ්‍රම වෙළඳපළ තොරතුරු එක්රැස් කිරීම, විශ්ලේෂණය හා බෙදාහැරීම
- මහජන රැකියා සේවයට අදාළ සිදු කෙරෙන සියලු සේවාවන්

මෙහි පළමු කාර්යය ලෙස දක්වා ඇති ජාතික මිනිස්බල හා රැකීරක්ෂා ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීමේ වගකීම ජාතික මානව සම්පත් සංවර්ධන සභාව වෙත මේ වන විට පවරා ඇති බැවින්, එහි පාර්ශවකාර ආයතනයක් ලෙස ඉහත අරමුණු ඉටු කර ගැනීමට දායකත්වය ලබා දීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

## 1.6.3. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2007 සැප්තැම්බර් 11 වන දින ස්ථාපිත කරන ලද අතර 2010 අංක 12 දරණ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතන පනත මඟින් බලාත්මක කරන ලදී. කම්කරු ක්ෂේත්‍රයේ ත්‍රෛපාර්ශව හවුල්කරුවන් වන සේව්‍ය, සේවක හා රජයේ සේවකයින්ගෙන් සැදුම්ලත් පාලක මණ්ඩලයක් මඟින් ආයතනය පාලනය වේ.

**ප්‍රධාන කාර්යයන්**

- දේශීය හෝ විදේශීය ආයතන සමඟ සහයෝගීත්වයෙන් ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සේවකයන් සංවර්ධන ක්‍රියාවලියෙහි ක්‍රියාකාරී කොටස්කරුවන් කර ගැනීම සඳහා ඔවුන්ගේ සුභසාධනය සහතික කරනු පිණිස පියවර ගැනීම
- ශ්‍රම අධ්‍යයන පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩමුළු, සම්මේලන සහ රැස්වීම් පැවැත්වීම සහ සඟරා, ජර්නල්, වාර ප්‍රකාශන සහ පොත් පළ කිරීම
- පර්යේෂණ පැවැත්වීම, සමීක්ෂණ පැවැත්වීම සහ ශ්‍රම අධ්‍යයනයට අදාළ පාඨමාලා සඳහා විධිවිධාන යෙදීම පුස්තකාල හා තොරතුරු සැපයීමේ සේවා පිහිටුවීම හා ඒවා නඩත්තු කිරීම
- මේ හා සමාන අරමුණු සහිත, ජාතික හා විදේශීය ආයතන, සංවිධාන, සංගම් සහ සමිති සමඟ සමීප සහයෝගීත්වයෙන් කටයුතු කිරීම
- විශ්ව විද්‍යාල සහ ඒ හා සමාන ආයතනවල සහය ඇතිව ශ්‍රම අධ්‍යයනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා ඇතුළු පාඨමාලා පැවැත්වීම සහ අවශ්‍ය අවස්ථාවලදී සහතික සහ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම
- කාර්මික සාමය පවත්වා ගැනීම අරමුණු කරගත් ක්‍රියාකාරකම්වල නිරත වීම

## 1.6.4. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතනය

ශ්‍රී ලංකාව තුල යහපත් වෘත්තීය ආරක්ෂණ ක්‍රියාමාර්ග හා යහපත් සෞඛ්‍යය පුරුදු අනුගමනය කරමින් සුරක්ෂිත හා සෞඛ්‍යය සම්පන්න ශ්‍රම බලකායක් බිහි කරලීමේ අරමුණින් 2009 අංක දරණ 38 දරණ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ ආයතන පනත මඟින් මෙම අමාත්‍යාංශයට අනුබද්ධ ආයතනයක් ලෙසින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය ස්ථාපිත කර ඇත.

දෛනිකව සිදු කරනු ලබන පාරිසරික මිණුම් සමීක්ෂණ, අවදානම් ඇගයීම හා වෛද්‍ය පරීක්ෂණ මගින් මෙන්ම විශේෂ වැඩසටහන් ලෙස ක්‍රියාත්මක කරනු ලබන පුහුණුවීම්, ව්‍යාපෘති මඟින් හා වෙනත් රටවල් සමඟ අන්තර් ජාතික සහයෝගීතාවය මත සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාව තුළ වැඩදායී ශ්‍රම බලකායක් බිහි කරවාලීමට මෙම ආයතනය විසින් කටයුතු කරනු ලබයි.

**ප්‍රධාන කාර්යයන්**

- සේවායෝජකයන්ගේ සහ සේවාදායකයින්ගේ ආරක්ෂාව සහ රැකියාවේ ආරක්ෂාව සහ රැකියාවේ ස්වභාවය සැලකිල්ලට ගනිමින් ඒ සේවායෝජකයින්ගේ සහ සේවාදායකයින් යන දෙපාර්ශවයේම සේවා පරිසරය පිළිබඳ වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමේදී රජයට උපදෙස් දීම.

- සේවා ස්ථානවල දී රැකියාවට අදාළව සිදුවන හදිසි අනතුරු සහ තුවාල වැළැක්වීම සඳහා ගතයුතු පියවර පිළිබඳව රජයට උපදෙස් දීම
- වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විමර්ශන අධ්‍යාපන වැඩසටහන් සමීක්ෂණ සහ පර්යේෂණ, පැවැත්වීම සහ ඒවාට සහාය වීම.
- උපකරණ, අන්තරායකර ද්‍රව්‍ය, භෞතික, රසායනික හෝ ජීව විද්‍යාත්මක කාරක හෝ නිෂ්පාදන හෝ වෙනත් යම් අන්තරායකර ද්‍රව්‍ය නිවැරදිව භාවිතා කිරීම පිළිබඳව යම් ආයතනයකට හෝ තැනැත්තෙකුට උපදේශන සේවා සැපයීම.
- වෙනත් යම් ආයතනයක් හෝ ශ්‍රී ලංකාවේ හෝ පිටරටක විශ්ව විද්‍යාලයක් සමඟ සහයෝගීතාවයෙන් හෝ ආයතනය විසින් සේවා නියුක්තිකයන්ට, පදිංචිකරුවන්ට, සේවකයන්ට හෝ වෙනත් යම් පාර්ශවයන්ට වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ සහ ආශ්‍රිත විෂයයන් පිළිබඳ දැනුම සහ පුහුණුව ලබාදීම සහ ඒ සඳහා සහතික පත්‍ර හෝ ඩිප්ලෝමා ප්‍රදානය කිරීම.
- උපකරණ, අන්තරායදායක ද්‍රව්‍ය, භෞතික, රසායනික, ජීවවිද්‍යාත්මක ද්‍රව්‍ය හෝ නිෂ්පාදන නිවැරදිව භාවිත කිරීම පිළිබඳ සහ මනෝසමාජ අන්තරායන් සහ හඳුනාගත් අන්තරායන් වැළැක්වීම පිළිබඳ අවශ්‍ය කරන සේවාවන් සැපයීම
- වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍යයට අදාළ වන කාරණාවලදී ප්‍රමිති, සංකේත, පරිචය සහ නියමු උපදේශන සම්බන්ධයෙන් නීතිමය අවශ්‍යතා පිළිබඳ අමාත්‍යවරයාට උපදෙස්දීම.
  - වැඩ කටයුතු නිවැරදිව ක්‍රියාත්මක වන්නේ ද යන්න අධීක්ෂණය හා නිසියාකාරව සිදු වන්නේ ද යන්න ඇගයීමට ලක්කිරීම
- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍යට අදාළ තොරතුරු එක්රැස්කිරීම, සකස්කිරීම,බෙදාහැරීම සහ ප්‍රකාශයට පත්කිරීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීම
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සම්බන්ධව සම්මන්ත්‍රණ, වැඩමුළු හා වෙනත් වැඩසටහන් සම්පාදනය කිරීම සහ අනුග්‍රහය දැක්වීම
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ අන්තර් අමාත්‍යාංශ ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිර
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ පුහුණු ප්‍රවර්ධනය කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා පුස්තකාල සහ විද්‍යාගාර පිහිටුවා පවත්වාගෙන යාම
- පර්යේෂණ සහ විශේෂ රසායනාගාර සංවර්ධනය කිරීම
- වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ ජාතික හා ජාත්‍යන්තර ආයතන විශ්ව විද්‍යාල හා අනෙකුත් සංවිධාන සමඟ සබඳතා පවත්වාගෙන යාම
- වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය යන ක්ෂේත්‍රවල ජාතික ප්‍රමිතීන් ස්ථාපනය කිරීම

### 1.6.5. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

සේවයේ යෙදී සිටින අවස්ථාවේ දී සිදුවන අනතුරු සම්බන්ධයෙන් වන්දි ලබාදීම සඳහා වන 1934 අංක 19 දරණ කම්කරු ආඥා පනත සහ එයට යම් යම් අවස්ථාවල දී සිදු කරන ලද සංශෝදනයන්හි ද ඇතුළත් කරුණු ද ක්‍රියාවට නැංවීම කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන කාර්යභාරය වේ. කම්කරු වන්දි උසාවිය දිසා විනිසුරු හා මහේස්ත්‍රාත් බලතල සහිතව මුළු දිවයිනම ආවරණය වන පරිදි සංචාරක උසාවි 14 කින් ද සමන්විත වන අතර අධිකරණ සේවා කොමිෂන් සභාව මගින් පත්කරනු ලබන අධිකරණ නිලධාරීන් වන කම්කරු වන්දි කොමසාරිස්, අතිරේක කම්කරු වන්දි කොමසාරිස් හා නියෝජ්‍ය කම්කරු වන්දි කොමසාරිස් යන තනතුරු, ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ I වන පන්තියේ තනතුරක්ද ශ්‍රී ලංකා පරිපාලන සේවයේ

තනතුරක් ද ඇතුළු තනතුරු 43ක නිලධාරී පිරිසකගෙන් සමන්විත වේ. රැකියාවේ යෙදී සිටියදී සිදුවන අනතුරු වලින් තුවාල ලබන සේවකයින්ට වන්දි අයකර දීම, රැකියාවේ ස්වභාවය නිසා වැළඳුණු රෝගවලින් පීඩා විඳින සේවකයින්ට වන්දි අයකර දීම හා සේවයේ යෙදී සිටින විට සිදුවන අනතුරු වලින් මියයන සේවකයින්ගේ යැපෙන්නන්ට වන්දි අයකර දීම කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලයේ ප්‍රධාන අරමුණු වේ.

කම්කරු වන්දි අධිකරණ ක්‍රියාවලිය සඳහා අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත අදාළ කර ගන්නා අතර අභියාචන පටිපාටිය දිසා අධිකරණයකට සමාන වේ.

**ප්‍රධාන කාර්යයන්**

- රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සේවයේ යෙදී සිටියදී සිදුවන අනතුරු, වෘත්තීය රෝගාබාධ සහ මරණයකදී නම් යැපෙන්නන්ට වන්දි අයකර දීමේ කටයුතු
- බාල වයස්කරුවන් වයස් පූර්ණත්වයට පත්වන තුරු කම්කරු වන්දි කොමසාරිස් භාරයේ ජාතික ඉතිරිකිරීම් බැංකුවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවායේ පරිපාලන කටයුතු
- සේවකයන්ට සිදුවන අනතුරකදී සේවායෝජකයන් වන්දි ගෙවීම පැහැර හැරි අවස්ථාවල ඔවුන්ගේ නිශ්චල හා චංචල දේපල තහනමට ගෙන ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා වන්දි මුදල් අයකර දීම
- කම්කරු වන්දි රක්ෂණ බලපත්‍ර නිකුත් කිරීම, අළුත් කිරීම, බලපත්‍ර අවලංගු කිරීමේ කටයුතු
- සේවකයකුට අනතුරක් සිදුවූ විට එම ස්ථානයට ගොස් පරීක්ෂා කර බැලීම
- ලංකාවේ ලියාපදිංචි කර ඇති නැව්වල සහ ගුවන් නැව්වල සේවකයන්ට ලංකාවෙන් පිටත දී සිදුවන අනතුරු සඳහා වන්දි අයකර දීම

### 1.6.6. ශ්‍රම වාසනා අරමුදල

1998 අංක 12 දරණ (2019 අංක 15 දරණ සංශෝධිත) පනතින් ස්ථාපිත ශ්‍රම වාසනා අරමුදල කම්කරු අමාත්‍යාංශය යටතේ පවතින කම්කරු සුබසාධනය උදෙසා ආරම්භ කරන ලද ආයතනයකි. ශ්‍රම වාසනා අරමුදල් පනතේ අරමුණු 06ක් ඔස්සේ ආරම්භයේ සිට මේ දක්වා විවිධ සුභසාධන වැඩසටහන් පවත්වා ශ්‍රී ලාංකීය සේවා නියුක්තයන්ගේ උන්නතියට කටයුතු සම්පාදනය කර ඇත.

ජාතික ලොතරැයි මණ්ඩලය මඟින් අලෙවි කරන ලකී සෙවන් ලොතරැයිය මඟින් ලැබෙන ආදායම ශ්‍රම වාසනා අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය වේ.

**ප්‍රධාන කාර්යයන්**

- සේවා නියුක්තිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම
- සේවා නියුක්තයන් සේවයෙහි යෙදී සිටි ආයතන පූර්ව දැනුම් දීමකින් තොරව වසා දැමූ අවස්ථාවක ඒ සේවා නියුක්තිකයන්ට මූල්‍ය හා වෙනත් ආධාර සැපයීම
- හදිසි අවස්ථාවල දී සේවා නියුක්තිකයන්ට හා ඔවුන්ගේ යැපෙන්නන්ට වෛද්‍ය හා වෙනත් පහසුකම් සැපයීම
- සේවා නියුක්තිකයන්ට විරුද්ධව පරීක්ෂණ ආරම්භ කරනු ලැබූ විටකදී ඔවුන්ට තාවකාලික ආධාර සැපයීම

- ව්‍යසන අවස්ථාවලදී සේවා නියුක්තිකයන්ට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට මූල්‍යමය හා වෙනත් පහසුකම් සැපයීම

- සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය සඳහා විශිෂ්ඨ සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම

- කම්කරු කොමසාරිස් ජනරාල්, කම්කරු විනිශ්චය සභාවක්, බේරුම්කරුවකු හෝ කම්කරු උසාවියක් හෝ යම් අධිකරණයක් ඉදිරියේ යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ පවරා ඇති හෝ විභාග වෙමින් පවතින යම් සේවා නියුක්තිකයෙකුගේ සේවා නියුක්තිය අවසන් කිරීම හා සම්බන්ධ හෝ කාර්මික ආරවුලක් සම්බන්ධ නඩු කටයුතු සඳහා සේවා නියුක්තයන්ට නීතිමය සහාය ලබා ගැනීමට මූල්‍යමය සහන සැලසීම.

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

මිලියන 8.40ක් වන මෙරට ශ්‍රම බලකායෙන් මිලියන 8.01ක් සේවා නියුක්තව සිටින අතර, ඒ අතුරින් රාජ්‍ය සේවකයන්, තමන්ගේම ව්‍යාපාරයක නිරතවන්නන් හා පවුලේ ව්‍යාපාරවලට දායකත්වය දක්වන්නන් හැරුණු කොට පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ නියුක්ත පිරිස මිලියන 3.75කි. එම සේවා නියුක්තිකයන්ගේ වෘත්තිය අයිතිවාසිකම්, වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය තහවුරු කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමෙන් රට තුළ කාර්මික සාමය පවත්වා ගැනීම හා එතුලින් මෙරට සමාජ ආර්ථික සංවර්ධනයට දායක වීමේ වගකීම මෙම අමාත්‍යාංශය සතු වේ. මේ වෙනුවෙන් මෙම අමාත්‍යාංශය වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරයි.

අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ ආයතන විසින් ස්වකීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඉටු කරන ලද වැඩසටහන්වලට අදාළ ව 2024 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්පත් කරගත් ප්‍රගතිය පිළිබඳ සාරාංශය මෙම පරිච්ඡේදයේ අන්තර්ගත වේ.

## 2.1. කම්කරු අමාත්‍යාංශය

### 2.1.1 නෛතික කටයුතු

#### 2.1.1.1 සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සඳහා නීතිමය රාමුව ශක්තිමත් කිරීම

ශ්‍රී ලංකාව තුළ ආයෝජන හිතකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා මෙන්ම රටෙහි අනාගත අභිවෘද්ධිය ළඟා කර ගැනීමට හැකිවන පරිදි පිළිගත් ජාතික සහ ජාත්‍යන්තර සමාජ, ආර්ථික තත්වයන්ට සහ කම්කරු ප්‍රඥප්ති හා ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි නෛතික ප්‍රතිපාදන සම්පාදනය කරදීම මෙම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. වර්තමානයේ දී ශ්‍රී ලංකාව තුළ කම්කරු ප්‍රජාවගේ අයිතිවාසිකම් සහ සුභසාධනය සහතික කිරීම සඳහා අණ පනත් සහ රෙගුලාසි 50ක් පමණ ක්‍රියාත්මක වේ. වර්තමාන සහ අනාගත අභියෝගවලට මුහුණ දීම සහ වැඩකරන ජනතාවගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා මෙන්ම පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම සඳහාත් අදාළ පනත් සහ අණ පනත් සංශෝධනය කිරීමට අමාත්‍යාංශය විසින් අවශ්‍ය පියවර ගෙන ඇත.

- **වර්තමානයට ගැලපෙන ප්‍රතිපාදන සහිතව කම්කරු නීති සංශෝධනය කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් දැනට බලාත්මක කරනු ලබන අණ පනත් වර්තමාන සමාජ ආර්ථික වෙනස්කම් හා ඒ හා බැඳුනු වැඩ ලෝකයේ වෙනස්කම් ආමන්ත්‍රණය සඳහා යෝග්‍ය නොවන අතරම, සේවක ප්‍රජාවගේ අයිතිවාසිකම් තහවුරු කරමින් ව්‍යාපාරවල අඛණ්ඩ පැවැත්ම හා විදේශ ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමේ පහසුකම් සලසන කම්කරු නීතියක අවශ්‍යතාවය ඉස්මතු වී තිබේ. එසේම, පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කරමින් සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීම ද අවශ්‍ය වේ. මේ පිළිබඳව සැලකිලිමත් වෙමින් දැනට ක්‍රියාත්මක පනත් 13ක ප්‍රතිපාදන සංශෝධනය කිරීම සඳහා අමප/23/1439/625/025 හා 2023.08.07 දිනැති සහ අංක අමප /23/1439/625/025-I හා 2023.10.30 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව දළ කෙටුම්පත පනත් කෙටුම්පතක් ලෙස සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත 2023.11.17 දිනැතිව යොමු කර ඇත. මෙම දළ කෙටුම්පත වර්තමාන රජයේ ප්‍රතිපත්ති අනුව තවදුරටත් සලකා බලා අවශ්‍ය සංශෝධනයන් සිදු කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

- **1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල පනත සේවක සුහසාධනයට සහ වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම**

කාලීන අවශ්‍යතා අනුව ආයතනවල කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා වන ප්‍රතිපාදන ඇතුළත් ව 2024 අංක 28 දරණ සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ සේවය විධිමත් කිරීමේ (සංශෝධනය පනත) පනත 2024.05.09 දින පාර්ලිමේන්තුවේදී සම්මත විය.

- **1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත සේවක සුහසාධනයට සහ වර්තමානයට ගැලපෙන ආකාරයට සංශෝධනය කිරීම**

අංක අමප /24/1234/625/017 හා 2024.07.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව, පනත් කෙටුම්පතක් ලෙස සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත 2024.08.06 දිනැතිව යොමු කර ඇත. නමුත්, තවදුරටත් හඳුනාගන්නා ලද සංශෝධනයන් ද වර්තමාන රජයේ ප්‍රතිපත්ති අනුව ද සලකා බලා අවශ්‍ය සංශෝධනයන් සිදු කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

- **2009 අංක 38 දරණ ජාතික වෘත්තීය ආරක්ෂණ හා සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනත සංශෝධනය**

අමප /23/0396/625/003 දරන හා 2023.03.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පනත් කෙටුම්පතක් සකස් කිරීමට නීති කෙටුම්පත් සම්පාදක වෙත 2023.04.19 දිනැතිව යොමු කර ඇත. මෙහි ඇතැම් කරුණු සම්බන්ධයෙන් නීති කෙටුම්පත් සම්පාදක විසින් නිරීක්ෂණ ඉල්ලා ඇති අතර නව ගෝලීය සහ වෙළඳපොළ අවශ්‍යතා අනුව තවදුරටත් සංවර්ධනය කළ යුතු සංශෝධනයන් ද සහිතව වර්තමාන රජයේ ප්‍රතිපත්තිවලට ගැලපෙන පරිදි සංශෝධනයන් සිදු කර අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය.

### 2.1.2 විදේශ සබඳතා

#### 2.1.2.1 ජාත්‍යන්තර කම්කරු ප්‍රමිතීන් පවත්වාගෙන යාම

I. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 22 යටතේ 2024 වර්ෂය සඳහා සම්මුතීන් 04 ක් සඳහා වාර්තා 04ක් පිළියෙළ කර ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත.

II. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ව්‍යවස්ථා අංක 19 යටතේ පවතින අපරානුමත නොකළ සම්මුති සඳහා වාර්තා 01ක් පිළියෙල කර ජාත්‍යන්තර කම්කරු සංවිධානය වෙත ඉදිරිපත් කර ඇත.

III. ළමා ශ්‍රමය පිටුදැකීම පිළිබඳ ජාතික මෙහෙයුම් කමිටුවට (NSCECL) අදාළ රැස්වීම් වාර 02ක් පැවැත්වීම හා ඊට අදාළ සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම.

IV. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ඇතිව සමාජ ආරක්ෂණ ක්‍රමවේදයක් ඇති කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ත්‍රෛපාර්ශවීය කමිටු රැස්වීම් වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. (Establishment of Social Security Fund) එයට අදාළව මීට පෙර කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකාවේ ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය සමාලෝචනය කර නැවත සංශෝධනය කිරීම සඳහා ඒකාබද්ධව පියවර ගන්නා ලෙස මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් සහ කම්කරු අමාත්‍යාංශයේ ලේකම් වෙත අමාත්‍ය මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත. එසේම සංශෝධිත ජාතික සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තිය මුදල්, සැලසුම් සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හරහා ඉදිරිපත් කරන

ලෙස ද කැබිනට් මණ්ඩලය විසින් උපදෙස් ලබා දී ඇත.

V. වාර්ෂිකව ජිනීවාහී පැවැත්වෙන ජාත්‍යන්තර කම්කරු සමුළුව සඳහා ත්‍රෛපාර්ශවීය නියෝජිතයන් සහභාගී කරවීමට අදාල සියලුම කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පසුවිපරම් කටයුතු සිදු කිරීම. ඒ අනුව, 2024.06.03 සිට 2024.06.14 දින දක්වා ජාත්‍යන්තර කම්කරු සමුළුව පැවැත්වූ අතර ඒ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් නියෝජිතයන් 09 දෙනෙකු සහභාගී විය.

VI. සුනිසි මෙහෙවර යටතේ ආර්ථික අර්බුදය හේතුවෙන් කාලීන අවශ්‍යතාවයක්ව පැවති ශ්‍රම වෙළඳපොළ ගැටලු සඳහා පිළියම් සෙවීම අරමුණු කර ගෙන රැකියා ප්‍රතිසාධන උපාය මාර්ග සංවර්ධනය (Development of Employment Recovery Strategy) ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහාය ඇතිව ත්‍රෛපාර්ශවීය කමිටුවක් හරහා සම්පාදනය කිරීම, දියත් කිරීම හා එය ක්‍රියාවට නැංවීමට අදාළ කටයුතු සිදු කරමින් පවතී.

VII. විදේශීය ශිෂ්‍යත්ව වැඩමුළු සහ පුහුණු වැඩසටහන් සඳහා මෙම අමාත්‍යාංශයට අදාළ අනෙකුත් ආයතන සහ කම්කරු දෙපාර්තුමේන්තුවේ නිලධාරීන් සහභාගී කරවීමට පියවර ගැනීම. 2024 ජනවාරි 01 සිට 2024 දෙසැම්බර් 31 දක්වා කාල සීමාව තුළ විදේශ පුහුණු පාඨමාලා සහ වැඩමුළු සඳහා නිලධාරීන් 67ක් යොමුකර ඇත.

VIII. ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර කම්කරු ක්ෂේත්‍රයට අදාලව සමාජ ආරක්ෂණ අධ්‍යාපනය සම්බන්ධයෙන් ඉදිරියේදී ඇතිකර ගැනීමට නියමිත අවබෝධතා ගිවිසුම් හා ඒ සම්බන්ධ සියලු වැඩසටහන්වලට අදාළව කටයුතු කිරීම.

- ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර සමාජ ආරක්ෂණ ගිවිසුමට අදාළ අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට අදාළ කටයුතු සම්පාදනය. ගිවිසුම සකස් කිරීම අවසන් කර ඇති අතර ඉන්දියානු පාර්ශවයෙන් තහවුරු කිරීම බලාපොරොත්තුවෙන් සිටී.
- ශ්‍රී ලංකාවේ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය හා ඉන්දියාවේ වී වී ගිරි ජාතික අධ්‍යාපන ආයතනය අතර අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමට අදාළ කටයුතු සම්පාදනය. ගිවිසුම සකස් කිරීම අවසන් කර ඇති අතර නීතිපති දෙපාර්තමේන්තුවේ නිශ්කාෂණ සඳහා බලා සිටී.

IX. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහයෝගීතාවය ඇතිව ක්‍රියාත්මක කරන ව්‍යාපෘති හා වැඩමුළුවලට අදාළව සියළුම සම්බන්ධීකරණ කටයුතු කිරීම. මේ යටතේ සුනිසි මෙහෙවර දේශීය වැඩසටහන (DWCP) රැස්වීමක් සහ විරැකියා රක්ෂණ උපදේශන රැස්වීම් දෙකක් පවත්වා ඇත. ජාත්‍යන්තර කම්කරු සංවිධානය විසින් විරැකියා රක්ෂණය පිළිබඳ ආයුගණක වාර්තාව රජයට ඉදිරිපත් කරන ලදී

X. තාක්ෂණික සහය ලබා දීම වෙනුවෙන් ශ්‍රී ලංකාවට පැමිණෙන ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ නිලධාරීන් සඳහා වීසා ඉල්ලීම් ලිපි විදේශ අමාත්‍යාංශයට ඉදිරිපත් කිරීම. ඒ අනුව 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ඉල්ලීම් ලිපි 42ක් ඉදිරිපත් කර ඇත.

XI. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්ෂික ව ප්‍රකාශයට පත් කරන කාලීන ආර්ථික සංවර්ධනයේ වැදගත් අංශ සහ ආර්ථික සංවර්ධනයේ ඉදිරි දැක්ම සම්බන්ධයෙන් වන වාර්තාවට අදාළ

තොරතුරු සැපයීම සහ මහ බැංකු වාර්ෂික වාර්තාවට අදාළව වාර්තාවක් ඉදිරිපත් කිරීම කර ඇත.

XII. වතු කම්කරු ගැටළු සම්බන්ධයෙන් වන ප්‍රධාන කමිටු රැස්වීම් 05ක් හා අනු කමිටු රැස්වීම් 03ක් ප්‍රාදේශීය වැවිලි සමාගම් සමඟ පැවැත්වීමට කටයුතු කර ඇති අතර රතු කොඩි සංවිධානය සමඟ රැස්වීම් 01ක් පවත්වා ඇත.

### 2.1.3 සැලසුම්,පර්යේෂණ සහ සංවර්ධන කටයුතු

- **ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම**

විගමනික ශ්‍රමිකයන් සහ අනාගත ශ්‍රම වෙළඳපළට එක්වීමට නියමිත විගමනික ශ්‍රමිකයන්ගේ පවුල්වල තරුණ දූ දරුවන් හට අධ්‍යාපන හා වෘත්තීය කුසලතා වැඩි දියුණු කර ගැනීමට පහසුකම් හා අවස්ථාවන් හඳුන්වා දීම, විගමනික ශ්‍රමිකයන්ගේ ජීවන තත්වය තවදුරටත් ඉහළ නැංවීම සඳහා ලබා දීමට අපේක්ෂිත සේවා සහ ඔවුන් හට විසඳා ගැනීමට අවශ්‍ය ගැටලු නිරාකරණය කර ගැනීමට විගමනික ශ්‍රමික සංගම් සාමාජිකයින්හට අවස්ථාව ලබා දීම, ශ්‍රම වෙළඳපොලේ නිසි පිළිගැනීමක් නොමැති රැකියාවල නිරත වන ශ්‍රමිකයන්ගේ වෘත්තීය ගෞරවය වැඩි දියුණු කිරීම සඳහා වූ 'ගරුසරු' වැඩසටහන පැවැත්වීම, අනාගත රැකියා වෙළඳපළ සඳහා සූදානම් කිරීම සහ දැනුම කුසලතා ලබා දීම වෙනුවෙන් පාසල් දරුවන් හා පාසල් හැරගිය තරුණ තරුණියන් හට 'Smart Club' සංකල්පය ප්‍රචලිත කිරීම ,අඩු පහසුකම් සහිත පාසල් දරුවන්ට ශ්‍රම වාසනා අරමුදල මඟින් පාසල් උපකරණ ලබා දීම අරමුණු කරගනිමින් "GLOCAL FAIR -2024" නමින් දිස්ත්‍රික් මට්ටමින් ජංගම සේවා වැඩසටහන් 24ක් සාර්ථකව පවත්වන ලදී.

- **ක්‍රියාකාරී සැලසුම් සම්බන්ධ කටයුතු**

වර්තමාන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වන පරිදි අමාත්‍යාංශය හා අනුබද්ධ ආයතනවල වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සංශෝධනය කිරීමට අදාළ මූලික කටයුතු සිදු කරන ලදී.

- **සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාවට නැංවීම**

සුනිසි මෙහෙවර වැඩසටහන රැකියා උත්පාදනය, ප්‍රවර්ධනය හා ජාතික ඵලදායිතාව, වැඩබිමෙහි හිමිකම, සමාජ ආරක්ෂණය සහ සමාජ කතිකාවත යන ස්ථම්භයන් හතරක් තුළ ක්‍රියාත්මක වේ. මෙම ප්‍රධාන ස්ථම්භ 4ට අමතරව ඵලදායිතා ප්‍රවර්ධනය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය තහවුරු කිරීම යන විෂය ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සෑම අංශයක්ම සම්බන්ධීකරණය කරනු ලැබේ.

සුනිසි මෙහෙවර වැඩසටහන යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට රුපියල් මිලියන 8.4 ක් පහත සඳහන් ආයතනවලට වෙන් කර විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

**වගුව 2.1 -** සුනිසි මෙහෙවර වැඩසටහන ක්‍රියාත්මක කිරීම

| | **ආයතනය** | **වෙන් කර ඇති ප්‍රතිපාදනය (රු.)** | **උපයෝජනය කරන ලද ප්‍රමාණය (රු.)** | **වියදම් ප්‍රතිශතය** |
|---|---|---|---|---|
| 01 | **කම්කරු දෙපාර්තමේන්තුව** | | | |
| i | සමාජ කතිකා හා වැඩපල සහයෝගීතා අංශය | 3,039,000.00 | 1,682,896.00 | **56%** |
| ii | කාන්තා හා ළමා කටයුතු අංශය | 3,837,000.00 | 2,966,918.97 | **77%** |
| iii | වෘත්තීය ස්වස්ථතා අංශය | 244,000.00 | 244,000.00 | **100%** |
| v | කර්මාන්තමය සුරක්ෂිතතා අංශය | 915,000.00 | 909,295.00 | **99%** |
| vi | සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය | 453,000.00 | 375,092.25 | **83%** |
| | **මුළු එකතුව** | 8,488,000.00 | 6,178,202.22 | **72.78%** |

### 2.1.4. පාලන සහ ආයතන කටයුතු

I. අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම යටතේ 2024 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මෙම අමාත්‍යාංශය විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 26ක් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇති අතර, ඉන් 20ක් සඳහා අමාත්‍ය මණ්ඩල තීරණ ලැබී ඇත. ඉතිරි සංදේශ විවිධ හේතූන් මත, නිරීක්ෂණ, අනුමැතීන් ලබා ගැනීම මෙන්ම වෙනත් අවශ්‍ය කටයුතු සඳහා විවිධ ආයතන වෙත යොමු කර ඇත.

II. සමාලෝචිත කාලසීමාව තුළ මහජන පැමිණිලි 713 ක් ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ආදී රාජ්‍ය ආයතන මෙන්ම මහජනතාව හරහා ඍජුවම ද ලැබී ඇති අතර සියල්ල ඉදිරි පියවර ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සහ අදාළ අනෙකුත් ආයතන වෙත යොමු කර පිළිතුරු වාර්තා ලබා ගෙන ඇත.

මීට අමතරව, 1978 වසරේ වැඩ වර්ජනයක් හේතුවෙන් රැකියා අහිමි වූ තුල්හිරිය- පූගොඩ ජාතික පේෂකර්ම සංස්ථාවට අයත් සේවකයින්ගේ ඉල්ලීම පරිදි වන්දි මුදලක් ලබාදීමට කළ යෝජනාවට අනුව අදාළ සේවකයින්ගේ තොරතුරු ලබා ගැනීම පිණිස සේවකයින් 2259ක් සඳහා අයදුම්පත් යොමු කරන ලදී. ඉන් සුදුසුකම් ලැබූ සේවකයන් 1717 දෙනෙකු සඳහා වන්දි මුදල් ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා, අදාළ මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම පිණිස තොරතුරු මුදල් අමාත්‍යාංශය වෙත යොමු කරන ලදී.

III. තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉල්ලීම 26 ක් ලැබී ඇති අතර, සියලුම ඉල්ලීම් සම්බන්ධයෙන් තොරතුරු ලබා දී ඇත. එසේම 2024 වසර අගභාගයේදී මෙම අමාත්‍යාංශය විසින් මහජන පැමිණිලි, යෝජනා, අදහස් ඉදිරිපත් කිරීම පිණිස WhatsApp අංකයක් (070 722 7877) හඳුන්වා දෙන ලදී.

IV. විවිධ ආයතන මගින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 43 ක් සමාලෝචිත කාලය තුළ සහභාගී කරවා ඇත. සේවා ව්‍යවස්ථාවන් හා බඳවාගැනීමේ පටිපාටිවල අවශ්‍යතාවයන්ට අනුව රාජකාරී කටයුතු කිරීමට අත්‍යවශ්‍ය පුහුණු පාඨමාලා සඳහා මෙම නිලධාරීන් යොමු කරවා ඇති අතර, එහිදී වියදම් කළමනාකරණ චක්‍රලේඛ ප්‍රකාරව එම වියදම් සීමාකිරීමකට ලක් කර ඇත.

**වගුව 2.2** - ආයතන කටයුතුවල ප්‍රගතිය

| | ක්‍රියාකාරකම | ප්‍රගතිය |
|---|---|---|
| 01 | පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම | 12 |
| 02 | මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ වාර්තා | 1 |
| 03 | අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සඳහා වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 2 |
| 04 | පාර්ලිමේන්තුවට වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | 5 |
| 05 | අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ | 6 |

## 2.2. කම්කරු දෙපාර්තමේන්තුව


### 2.2.1. සේවකයන්ගේ සමාජ ආරක්ෂණය

ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන්ගේ සමාජ ආරක්ෂණය සඳහා 1958 අංක 15 දරණ සේවක අර්ථසාධක අරමුදල් පනත මගින් සේවක අර්ථසාධක අරමුදල ස්ථාපිත කර ඇත. මෙම අරමුදලෙහි පරිපාලන කටයුතු කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන අතර, එහි අරමුදල් කළමනාකරණය පිළිබඳ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් දරනු ලැබේ. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

- **සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම**

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීමට අදාලව තීරණ ලිපි 166,060 ක් යොමු කර ඇති අතර, ඒ සම්බන්ධ තොරතුරු පහත ප්‍රස්තාරය මගින් නිරූපණය කර ඇත.

**ප්‍රස්තාරය 2.1** – 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා යැවූ තීරණ ලිපි සංඛ්‍යා



- **දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් දායක මුදල් අය කර ගැනීමට අදාළව නිවේදන යැවීම**

දායක මුදල් ගෙවීම පැහැර හරිනු ලබන සේවායෝජකයන් වෙතින් එම මුදල් අයකර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ප්‍රථම නිවේදන හා අවසන් නිවේදන යොමු කළ අතර, ඒ සඳහා ප්‍රතිචාර නොදක්වන්නේ නම් නීති මඟින් කටයුතු කර එම දායක මුදල් හා අධිභාර අයකර ගිණුම් ගත කිරීමට ක්‍රියා කරනු ලැබේ.

**වගුව 2.3 -** දායක මුදල් අය කර ගැනීමට අදාළ නිවේදන නිකුත් කිරීම හා ගණනය කරනු ලැබූ මුදල්

| **නිවේදනය** | **නිවේදන යැවූ සංඛ්‍යාව** | **නිවේදනවලට අදාළව ගණනය කරනු ලැබූ මුදල රු.මි.** |
|---|---|---|
| පළමු නිවේදනය | 14,412 | 7247 |
| අවසන් නිවේදනය | 7040 | 391 |

- **සේවක අර්ථසාධක අරමුදල ප්‍රවර්ධනය සඳහා සහ සේවාලාභීන් වෙත සේවා ලබා දීමේ කාර්යක්ෂමතාවය වර්ධනය**

සේවාලාභීන් වෙත එකම ස්ථානයක් තුළින් සේවක අර්ථසාධක අරමුදල් ආශ්‍රිත සේවාවන් ඉටු කර ගැනීම සඳහා කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පළමු මහලේ නව කාර්යාල පරිශ්‍රය 2024.08.06 දින විවෘත කරන ලදී. ඒ අනුව, පූර්ණ ප්‍රතිලාභ ගෙවීම් අංශය, මියගිය සාමාජිකයන්ගේ ප්‍රතිලාභ ගෙවීම් අංශය (L අංශය), 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් අංශය, මධ්‍යම ලිපිගොනු අංශය යන අංශ මෙම පළමු මහලේ ස්ථාපිත කර සේවාවන් සැපයීමට කටයුතු කරයි. එසේම, උතුරු කොළඹ, දකුණු කොළඹ, නැගෙනහිර කොළඹ, බටහිර කොළඹ සහ මැද කොළඹ යන දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්ට අදාළව සේවකයන් සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන් වශයෙන් ලියාපදිංචි කර ගැනීමේ නව ක්‍රමවේදය ද මෙම ස්ථානයේ දීම සිදු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා ඇත.

එසේම, සාමාජිකයන් වෙත සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් නිවැරදි දැනුවත් භාවයක් නොමැති වීම හේතුවෙන් උද්ගත වන ගැටළු අවම කිරීම සඳහා සහ සාමාජිකයන් මෙන්ම සේවායෝජකයන් ද දැනුවත් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ද සහයෝගය සහිතව ජංගම සේවා වැඩසටහන් 2024 වර්ෂය තුළදී ද පවත්වන ලදී.

සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීම සඳහා නව මෘදුකාංගයක් සකස් කිරීමේ කටයුතු 2023 වර්ෂයේදී සිදු කරන ලද අතර, එහි ඉදිරි ක්‍රියාකාරකම් 2024 වර්ෂයේදී ඉටු කරන ලදී. ඒ අනුව, මෙම නව මෘදුකාංගය සියලුම දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි ස්ථාපනය කිරීමේ කටයුතු 2024 දෙසැම්බර් මාසය වන විට අවසන් කරන ලදී. මෙමගින් සේවකයන් සේවක අර්ථසාධක අරමුදල යටතේ ලියාපදිංචි කිරීමේ කටයුතු වඩාත් කාර්යක්ෂමව සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

එසේම, සේවායෝජක ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම සහ ආයතන ලේඛනය ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග හඳුනා ගන්නා ලදී. ඒ අනුව, කම්කරු කාර්යාල විසින් මාසයකට අවම වශයෙන් සමූහ පරීක්ෂණ 04ක් සිදු කිරීම ආරම්භ කර ඇත. මාධ්‍ය භාවිතය මගින් මහජනතාවගේ දැනුවත්භාවය වර්ධනය කිරීම, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩලය

ආදී වෙනත් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනවල දත්ත පද්ධතිවල වල පවතින ආයතන පිළිබඳ තොරතුරු ද උපයෝගී කර ගනිමින් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම ප්‍රවර්ධනය කිරීම ආදී හඳුනා ගන්නා ලද අනෙකුත් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ද කටයුතු සිදු කිරීම 2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.


සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රමවේදය සරල කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ඉල්ලුම් පත්‍රයන්හි සිදු කළ යුතු සංශෝධන, දත්ත පද්ධතිවලට දත්ත ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සිදු කළ යුතු සංශෝධන ආදීය හඳුනා ගෙන අදාළ පියවර ගැනීම ආරම්භ කරන ලදී.

### 2.2.2. කාර්මික සම්බන්ධතාවය


- **ව්‍යවස්ථාපිත හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳ පැමිණිලි විසඳීම සහ කාර්මික ආරාවුල් නිරවුල් කිරීම**

කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වෙත සහ ප්‍රධාන කාර්යාලය වෙත සේවකයන් හෝ වෘත්තීය සමිති විසින් සිදු එසේම, සිදු කරනු ලැබූ පැමිණිලි විමර්ශනයක් හෝ ආයතන පරීක්ෂණයක් සම්බන්ධයෙන් සෑහීමට පත් නොවන අයකු විසින් විධිමත් පරීක්ෂණයක් සිදු කරවා ගනු පිණිස කම්කරු කොමසාරිස් ජනරාල් වෙත සිදු කරනු ලබන ඉල්ලීම් අවශ්‍යතාවය පරිදි නැවත විමර්ශනය සඳහා යොමු කිරීම්ද සිදු කරන ලදී.

**ප්‍රස්තාරය 2.2** - 2020 වර්ෂයේ සිට 2024.10.31 දක්වා ව්‍යවස්ථාපිත හිමිකම් කඩවීම් පිළිබඳ පැමිණිලි ලැබීම් හා විසඳීම්



**ප්‍රස්තාරය 2.3** - 2020 වර්ෂයේ සිට 2024.10.31 දක්වා කාර්මික ආරවුල් පිළිබඳ පැමිණිලි ලැබීම් හා නිරවුල් කිරීම




කම්කරු දෙපාර්තමේන්තුව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන පෞද්ගලික හෝ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයෙකුට සිය රැකියාව සම්බන්ධ ඕනෑම ආකාරයේ ගැටළුවක් පිළිබඳව වන පැමිණිලි https://cms.labourdept.gov.lk යන ඊ සේවාව මගින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත මාර්ගගත ක්‍රමය ඔස්සේ ඉදිරිපත් කිරීමට පහසුකම් 2022 වර්ෂයේ මාර්තු මාසයේ සිට සලසා දෙන ලදී. ඒ අනුව මෙම පැමිණිලි කළමනාකරණ පද්ධතිය (Complaint Management System – CMS) වෙත වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍යය මොඩියුලය (OSH Module) සහ නීති මොඩියුලය ද (Legal Module) ඇතුළත් කර අදාළ මෘදුකාංග සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී.

එසේම, කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි සහ පෙත්සම් විසඳීමේ කටයුතු සම්මත පරිපාටියකට අනුව සිදු කිරීම තුළින් එම කටයුතු වඩාත් කාර්යක්ෂමව සහ ගුණාත්මකව සිදු කළ හැකි බැවින් ඒ සඳහා මාර්ගෝපදේශයක් වශයෙන් පැමිණිලි සහ පෙත්සම් විසඳීමේ සම්මත කාර්යය පරිපාටියක් සහ ඊට අදාළ උපදෙස් මාලාවක් සකස් කරන ලද අතර, එම පරිපාටි 2021 වර්ෂයේ නොවැම්බර් මාසයේ සිට අදාළ කාර්යාල සහ අංශ විසින් භාවිතා කරනු ලැබේ. මෙම කටයුතු තවදුරටත් කාර්යක්ෂම කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගනිමින් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පැමිණිලි සහ පෙත්සම් නිරවුල් කිරීම සම්බන්ධයෙන් විධිමත් මාර්ගෝපදේශයක් (A comprehensive Guide for Handling of Inquiries on Labour related Complaints) සකස් කිරීමට අවශ්‍ය මූලික කටයුතු 2024 වර්ෂයේදී ආරම්භ කරන ලදී.

- **සාමූහික ගිවිසුම් සඳහා සේවා - සේවක දෙපාර්ශවය පෙළඹවීම**

සාමූහික ගිවිසුම් වලට එළඹීම මගින් සේවකයන් වෙත කම්කරු නීති මගින් හිමිකර දී ඇති අයිතිවාසිකම් වලට වඩා වැඩි වරප්‍රසාද හිමි වනවා මෙන්ම සේවායෝජක පාර්ශවයන්ට සේවකයන් වෙතින් වඩා ඵලදායී සේවාවක් ලබා ගැනීම සඳහා අදාල කොන්දේසි වෙත එළඹීමටද හැකියාව ලැබේ.

සමාජ කතිකාව මගින් සේවා හා සේවක පාර්ශවයන් එවැනි ආකාරයේ සාමූහික ගිවිසුම්

වෙත එළඹීම ප්‍රවර්ධනය කරනු ලබයි. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාල සීමාව තුළදී කාලය දීර්ඝ කරනු ලැබූ සාමූහික ගිවිසුම් 14 ද ඇතුළුව 2024.12.31 දිනට සාමූහික ගිවිසුම් සංඛ්‍යාව 225 ක් ක්‍රියාත්මකව පවතී.

- **බේරුම්කරණ කටයුතු සිදු කිරීම**

ප්‍රාදේශීය කාර්යාල මගින් හෝ ප්‍රධාන කාර්යාලයේ කාර්මික සම්බන්ධතා අංශය මගින් කටයුතු කළ ද නිරවුල් කළ නොහැකි වූ කාර්මික ආරාවුල්, බේරුම්කරණය හෝ කාර්මික අධිකරණයක් වෙත යොමු කිරීම සිදු කරනු ලැබේ. 2024.01.01 සිට 2024.12.31 දක්වා කාල සීමාව තුළදී බේරුම්කරණය සඳහා යොමු කරනු ලැබූ ආරාවුල් 81 ද ඇතුලත්ව ආරාවුල් 219 ක් සම්බන්ධයෙන් 2024 වර්ෂය තුළදී කටයුතු කිරීමට නියමිතව තිබුණි. ඒ අතුරින් ආරාවුල් 111 ක පරීක්ෂණ කටයුතු 2024 වර්ෂය තුළදී අවසන් කර ප්‍රදාන 70 ක් ලබා දී ඇති අතර, ප්‍රදාන 41 ක් ඉදිරියේදී ලබා දීමට නියමිතව ඇත. එසේම 2024.12.31 දින වන විට ආරාවුල් 108 ක් සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පැවතුණි.

- **වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම**

සෑම වෘත්තීය සමිතියක්ම කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කිරීම වෘත්තීය සමිති ආඥා පනත යටතේ අනිවාර්ය අවශ්‍යතාවයක් වේ. ඒ අනුව, 2024.01.01 සිට 2024.12.31 දක්වා දෙපාර්තමේන්තුවෙහි ලියාපදිංචි කරනු ලැබූ වෘත්තීය සමිති / සම්මේලන සංඛ්‍යාව 123 කි. 2024.12.31 දිනට වලංගු මුළු වෘත්තීය සමිති සංඛ්‍යාව 2141 කි. 2024 වර්ෂය තුළදී වෘත්තීය සමිති 100 ක් අවලංගු කර ඇත.

- **වැඩ වර්ජන විසඳීම සඳහා අදාළ මැදිහත් වීම් සිදු කිරීම**

කාර්මික ආරවුලක් වැඩ වර්ජනයක් දක්වා වර්ධනය විය හැකි තත්ත්වයන් නිරීක්ෂණය වූ වහාම දෙපාර්තමේන්තු විසින් එම තත්ත්වය වැළැක්වීම සඳහා මැදිහත් වීම සිදු කරනු ලබන අතර, වැඩ වර්ජනයක් ඇති වුවහොත් එම වැඩවර්ජනයට අදාළ ආරාවුල නිරවුල් කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. 2024.01.01 සිට 2024.12.31 දක්වා වාර්තා වූ වැඩ වර්ජන පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**වගුව 2.4** - වැඩ වර්ජන පිළිබඳ වාර්තා වූ දත්ත - 2024.01.01 සිට 2024.12.31 දක්වා

| ක්ෂේත්‍රය | වාර්තා වූ වැඩ වර්ජන සංඛ්‍යාව | සහභාගී වූ සේවක සංඛ්‍යාව | අහිමි වූ මිනිස්දින සංඛ්‍යාව |
|---|---:|---:|---:|
| වතු | 04 | 1199 | 5879 |
| නිෂ්පාදන | 06 | 4795 | 22,550 |
| **එකතුව** | **10** | **5994** | **28,429** |

- **සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කතිකාවතක් පවත්වා ගැනීම**

පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන වැඩ පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා එම අංශයේ ආයතනවල සේව්‍ය සේවක දෙපාර්ශවයම කම්කරු නීති පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කර පවත්වන ලදී.

**වගුව 2.5** - සමාජ කතිකා හා වැඩපොළ සහයෝගිතා ප්‍රවර්ධන අංශය විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු - 2024.01.01 සිට 2024.12.31 දක්වා

| වැඩසටහනෙහි ස්වභාවය | වැඩසටහනෙහි නම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|---|
| **සමාජ කතිකාව ප්‍රවර්ධනය** | සමාජ කතිකා ප්‍රවර්ධන වැඩසටහන් | 155 | 9544 |
| | සමාජ වේදිකා වැඩසටහන් | 24 | 2140 |

ඉහත දැනුවත් කිරීමේ වැඩසටහන් වලට අතිරේකව ආයතනික මට්ටමින් සමාජ කතිකාව සහ වැඩපොළ සහයෝගිතාව ප්‍රචලිත කිරීමේ සේවායෝජකයන් විසින් කම්කරු නීති කෙරෙහි ස්වයං අනුකූලතාවය තුළින් තිරසාර සේවා සේවක සම්බන්ධතාවයක් ඇති වන අතර, එමගින් සේවායෝජකයන්ට ආර්ථික ප්‍රතිලාභ රාශියක් ද හිමි වේ. එබැවින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සෑම අවස්ථාවකදීම සේවායෝජකයන් කම්කරු නීති කෙරෙහි ස්වයං අනුකූලතාවය දැක්වීම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ. ඒ අනුව, කම්කරු නීති කෙරෙහි සේවායෝජකයන් ස්වයං අනුකූලතාවය දැක්වීමට (Self Compliance to Labour laws) අදාළ වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලද අතර, එහි ඉදිරි ක්‍රියාකාරකම් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

අරමුණ පෙරදැරිව කාර්මික සංහිඳියාව සඳහා වන විශිෂ්ටතා සහතික අදාළ ආයතන වෙත ප්‍රදානය කිරීමේ කටයුතු 2024 වර්ෂයේ දී සිදු කරන ලදී. ඒ අනුව, කාර්මික සංහිඳියාව සඳහා වන විශිෂ්ටතා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2024.11.06 දින කම්කරු මහ ලේකම් කාර්යාලය 10 වන මහල ශ්‍රවණාගාරයේදී පවත්වන ලදී.

සේවායෝජකයන් විසින් කම්කරු නීති කෙරෙහි ස්වයං අනුකූලතාවය තුළින් තිරසාර සේවා සේවක සම්බන්ධතාවයක් ඇති වන අතර, එමගින් සේවායෝජකයන්ට ආර්ථික ප්‍රතිලාභ රාශියක් ද හිමි වේ. එබැවින් කම්කරු දෙපාර්තමේන්තුව විසින් සෑම අවස්ථාවකදීම සේවායෝජකයන් කම්කරු නීති කෙරෙහි ස්වයං අනුකූලතාවය දැක්වීම ප්‍රවර්ධනය කිරීමට කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, කම්කරු නීති කෙරෙහි සේවායෝජකයන් ස්වයං අනුකූලතාවය දැක්වීමට (Self Compliance to Labour laws) අදාළ වැඩපිළිවෙලක් සකස් කිරීම සඳහා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලද අතර, එහි ඉදිරි ක්‍රියාකාරකම් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

### 2.2.3. සේවායෝජකයන් විසින් සේවකයන් සේවයේ නියුක්ත කරවීම පිළිබඳ පරීක්ෂා කිරීම

සේවායෝජකයන් විසින් සේවකයන් සේවයේ නියුක්ත කරවීමේ නීති නිසි පරිදි අනුගමනය කරනු ලැබේද යන්න පරීක්ෂා කිරීම සඳහා 2024.01.01 සිට 2024.12.31 දක්වා සිදු කරන ලැබූ පරීක්ෂණ පිළිබඳ තොරතුරු පහත පරිදි වේ.

**රූප සටහන -** පරීක්ෂණ සිදු කිරීම් - 2024.01.01 සිට 2024.12.31 දක්වා ප්‍රගතිය

දිස්ත්‍රික් සහ උප කම්කරු කාර්යාලයන්හි කම්කරු නිලධාරීන් විසින් සිදු කල ශ්‍රමික පරීක්ෂණ සංඛ්‍යාව (2024.01.01 දින සිට 2024.10.31 දින දක්වා) -71,685

කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ පරීක්ෂණ සංඛ්‍යාව -55

එකතුව = 75,176

ළමුන් සේවයේ යෙදවීමට අදාළව ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් සිදු කරනු ලැබූ පරීක්ෂණ සංඛ්‍යාව -101

ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිතව අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රම මය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ සංඛ්‍යාව - 47

වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධ පරීක්ෂණ සංඛ්‍යාව -3288

එසේම, ශ්‍රමික පරීක්ෂණ තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා කම්කරු නිලධාරීන් විසින් භාවිතා කරනු ලබන ශ්‍රමික පරීක්ෂණ වාර්තාව තොරතුරු ලැබෙන පරිදි සංශෝධනය කර 2024 නොවැම්බර් මාසයේ සිට භාවිතා කිරීම ආරම්භ කරන ලදී.


කම්කරු කාර්යාල බල ප්‍රදේශයන්හි (විශේෂයෙන් නගර සීමාවන්හි) පිහිටි ආයතන පරීක්ෂා කිරීම වඩාත් විධිමත්ව සහ කාර්යක්ෂමව සිදු කිරීම සඳහා දිස්ත්‍රික් කම්කරු කාර්යාලයක් මාසිකව සමූහ පරීක්ෂණ 04ක්ද උප කම්කරු කාර්යාල මාසිකව සමූහ පරීක්ෂණ 02ක්ද සිදු කිරීමේ ක්‍රමවේදයක් ද ආරම්භ කරන ලදී.

ශ්‍රමික පරීක්ෂණ ක්‍රමවේදය වර්තමාන සමාජ ආර්ථික පරිසරයන්ට ගැලපෙන පරිදි විධිමත් කිරීමට අදාළව ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගැනීම සඳහා එම සංවිධානයේ නියෝජිතයන් සමඟ මූලික සාකච්ඡාවක් පවත්වන ලදී. ඒ අනුව, වඩාත් විධිමත් ශ්‍රමික පරීක්ෂණ ක්‍රමවේදයක් (A Comprehensive Framework for Labour Inspections) 2025 වර්ෂයේදී සකස් කිරීමට අපේක්ෂිතය.

### 2.2.4. සේවකයන් සේවයේ යෙදවීමට අදාළ අයිතීන් ආරක්ෂා කර දීම සඳහා නෛතික රැකවරණය

සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් පනත් ගණනාවක් ක්‍රියාත්මක කරනු ලබයි. ඒ අනුව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් එම නීති උල්ලංඝනය කරන සේවායෝජකයන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමත් ඒ තුළින් සේවක අයිතීන් සුරක්ෂිත කිරීමත් සිදු කරනු ලබයි. ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා දෙපාර්තමේන්තුව විසින් ගනු ලැබූ අධිකරණ ක්‍රියාමාර්ග වලට අදාළ ප්‍රගතිය පහත වගුව පරිදි වේ.

**ප්‍රස්තාරය 2.4 -** මහේස්ත්‍රාත් අධිකරණයන්හි පවරනු ලැබූ නඩු සහ අවසන් වූ නඩු - 2024.01.01 සිට 2024.12.31 දක්වා




**වගුව 2.6 -** නීති ක්‍රියා අංශය සෘජු මැදිහත්වීම මත සිදු කරනු ලැබූ අධිකරණ ක්‍රියා මාර්ග පිළිබඳ තොරතුරු

| අධිකරණය | 2023.12.31 දිනට පැවති නඩු සංඛ්‍යාව | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා අභියාචනා කරනු ලැබූ නඩු සංඛ්‍යාව | 2024.12.31 දිනට අවසන් වූ අභියාචනා නඩු සංඛ්‍යාව | 2024.12.31 දිනට ඉතිරි අභියාචනා නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 133 | 19 | 9 | 143 |
| අභියාචනාධිකරණය | 425 | 66 | 51 | 440 |
| මහාධිකරණය | 107 | 23 | 26 | 104 |
| වාණිජ මහාධිකරණය | 224 | 11 | 9 | 226 |

**වගුව 2.7** - කම්කරු ක්ෂේත්‍රයට අදාළ පනත් සංශෝධනය කිරීම සහ නව පනත් හඳුන්වා දීමේ ප්‍රගතිය

| පනතේ නම | සංශෝධන සිදු කිරීමේ අරමුණ |
|---|---|
| 2024 අංක 28 දරන සාප්පු හා කාර්යාල (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත | තොරතුරු තාක්ෂණය මත පදනම්වූ ව්‍යාපාර ක්‍රියාවලි සහ දැනුම් ක්‍රියාවලි බාහිරකරණය කරනු ලැබූ ආයතනව වල සේවයේ නියුතු සේවිකාවන් රාත්‍රී කාලයේ සේවයේ යෙදවීමට විධිවිධාන සැලසෙන පරිදි 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත සංශෝධනය කිරීම |
| 2024 අංක 48 දරන සේවකයන්ගේ ජාතික අවම වේතනය (සංශෝධන) පනත | 2024.09.11 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයකයන්ගේ අවම මාසික වේතනය රු. 12,500.00 සිට රු. 17,500.00 දක්වා ද අවම දෛනික වේතනය රු. 500.00 සිට රු.700.00 දක්වා ද වැඩි කිරීම. |

### 2.2.5. ශ්‍රම ප්‍රමිතීන් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

පෞද්ගලික අංශයේ සේවා නියුක්තයන්ගේ වැටුප් හා සේවා කොන්දේසි යාවත්කාලීන කිරීම සහ එම අයිතීන් ආරක්ෂා කිරීම දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ කාර්යභාරයක් වේ. ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා එම විෂය ක්ෂේත්‍රයට අදාලව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**වගුව 2.8** - පඩිපාලක සභාවල අවම වැටුප් යාවත්කාලීන කිරීම

| පඩිපාලක සභාව | අවම වැටුප් යාවත්කාලීන කිරීම සඳහා ගන්නා ලද පියවර |
|---|---|
| තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය | කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය රු. 1350.00 ක් ලෙස ද සම්මත ප්‍රමාණයට වඩා වැඩියෙන් නෙළනු ලබන සෑම තේ දළු කිලෝග්‍රෑම් 01ක් සඳහාම (Over Kilo Rate) රු. 50.00 ක් ලෙස දෛනික ගෙවීම වශයෙන් සංශෝධනය කරන ලදී. (මෙම තීරණය 2024.09.10 දින සිට ක්‍රියාත්මක වේ.) |
| රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය | කාල මිම්මේ වැඩ සඳහා ගෙවිය යුතු අවම දෛනික වේතන ප්‍රමාණය රු. 1350.00 ක් ලෙස ද සම්මත ප්‍රමාණයට වඩා වැඩියෙන් ගෙනෙන සෑම රබර් කිරි කිලෝග්‍රෑම් 01ක් සඳහාම (Over Kilo Rate) රු. 50.00 ක් ලෙස දෛනික ගෙවීම වශයෙන් සංශෝධනය කරන ලදී. (මෙම තීරණය 2024.09.10 දින සිට ක්‍රියාත්මක වේ.) |

**වගුව 2.9** - දින 05 වැඩ සතිය සඳහා අනුමැතිය ලබා දීම

| 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | | 2024.12.31 දින වන විට අනුමැතිය ලබා දීම සඳහා ඉදිරි කටයුතු කරමින් පැවති සංඛ්‍යාව |
|---|---|---|---|
| ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලබා දීම් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | |
| 339 | 320 | (08) | 11 |

**වගුව 2.10**- සාමූහික ගිවිසුම්වල නීතිමය වලංගුභාවය පරීක්ෂා කිරීම්

| 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | | 2024.12.31 දිනට පරීක්ෂා කරමින් පැවති සංඛ්‍යාව |
|---|---|---|---|
| ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලබා දීම් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | |
| 39 | 21 | - | 18 |

**වගුව 2.11** - පඩි පාලක සභා අණපනත හා සාප්පු හා කාර්යාල සඳහා සේවක පනත යටතේ වැටුපෙන් අඩු කිරීම් සඳහා ලැබෙන ඉල්ලීම් අනුමැතිය ලබා දීම

| 2024.01.01 දිනට ශේෂය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|---|
| | ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | අනුමැතිය ලබා දීම් සංඛ්‍යාව | ප්‍රතික්ෂේප කිරීම් සංඛ්‍යාව | |
| 119 | 262 | 124 | (128) | 129<br>(අසම්පූර්ණ ලේඛන ඉදිරිපත් කරන ලද මෙම ආයතන 129 වෙත අදාළ ලේඛන ඉදිරිපත් කරන ලෙස දැනුම් දී ඇත) |

**වගුව 2.12** - අණ පනත් සම්බන්ධයෙන් සේවා හා සේවක පාර්ශව විසින් සිදු කරනු ලබන විමසීම් සඳහා පැහැදිලි කිරීම් හා අර්ථ නිරූපණ ලබා දීම

| 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | 2024.12.31 දිනට පිළිතුරු සකස් කරමින් පැවති ශේෂය |
|---|---|---|
| ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | පිළිතුරු ලබා දුන් සංඛ්‍යාව | |
| 70 | 69 | 01 |

## 2.2.6. සේවයේ යෙදෙන ස්ත්‍රීන් සහ තරුණ අයගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ළමා ශ්‍රමය පිටු දැකීම

කාන්තාවන් සේවයේ නියුක්ත කරවීමේදී ඔවුන්ගේ අයිතීන් ආරක්ෂා වන පරිදි කම්කරු නීතීන් ක්‍රියාත්මක කිරීම, එම නීති කාලීනව සමාලෝචනය කරමින් අවශ්‍ය සංශෝධනයන් නිර්දේශ කිරීම මගින් ඵලදායී කාන්තා ශ්‍රම දායකත්වයක් රටට ලබාදීම මෙන්ම ශ්‍රී ලංකාව තුළින් ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා කටයුතු කිරීම කම්කරු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

ඒ අනුව, 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

**වගුව 2.13 -** ළමා ශ්‍රමය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලිවලට අදාලව පරීක්ෂණ සිදු කිරීම

| 2024.01.01 දිනට ශේෂය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව | |
| 13 | 100 | 101 (මේ අතරින් ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි සංඛ්‍යාව 02ක් වන අතර ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. | 12 |

- **කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා අනුමැතිය ලබා දීම**

කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සඳහා වන අනුමැතීන් 751ක් ලැබී ඇත.

**වගුව 2.14 -** කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ සේවා කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි පිළිබඳ පරීක්ෂණ

| 2024.01.01 දිනට ශේෂය | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා | | 2024.12.31 දිනට ශේෂය |
|---|---|---|---|
| | ලැබුණු පැමිණිලි සංඛ්‍යාව | විසඳනු ලැබූ පැමිණිලි සංඛ්‍යාව | |
| 02 | 07 | 09 | - |

- **ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් තුරන් කිරීම පිණිස ප්‍රජා පොලිස් කමිටු සමඟ ඒකාබද්ධව කටයුතු කිරීම**

ළමා ශ්‍රමය තුරන් කිරීම හා පුරවැසි වගකීම පිළිබඳ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාමේ කටයුතු ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු හරහා සිදු කිරීම වඩාත් ප්‍රායෝගික බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි සහ 2025 වර්ෂයේ දී මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම ජාතික වගකීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට තීරණය කරන ලදී.

මෙහි මූලික අදියර වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රජා පොලිස් කොට්ඨාශ භාර ස්ථානාධිපතිවරුන්, ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා පොලිස් ඒකකයන්හි ස්ථානාධිපතිවරුන්, කම්කරු දෙපාර්තමේන්තුවේ අදාල නියෝජ්‍ය හා සහකාර කම්කරු කොමසාරිස්වරුන් වෙනුවෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ සැසියක් පවත්වා ඔවුන් දැනුවත් කර, එමගින් ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු සමඟ සම්බන්ධ වී සියළුම ආකාරයේ ළමා ශ්‍රමය ශ්‍රී ලංකාවෙන් සම්පූර්ණයෙන්ම තුරන් කිරීමේ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාමේ කටයුතු 2024 වර්ෂයේ තෙවන කාර්තුව තුළදී ආරම්භ කරන ලදී.

එහි දෙවන අදියර වශයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ එක් එක් පොලිස් ස්ථානයට අදාල ප්‍රජා පොලිස් උපදේශන කමිටු 52 ක් සමඟ කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් සම්බන්ධවී පොලිස් ස්ථාන මට්ටමින් සියලුම

උපදේශන කමිටු සාමාජිකයින් දැනුවත් කිරීම සඳහා වැඩසටහන් පවත්වා ඇත.

එහි තෙවන අදියර වශයෙන් 2025 වර්ෂයේදී මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම වගකීම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලිය පැහැදිලි කිරීම සඳහා විශේෂ වැඩසටහනක් 2024.12.18 දින පවත්වන ලදී. මෙම අවස්ථාව සඳහා ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් දිසාව භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, ප්‍රජා පොලිස් හා පාරිසරික දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති, දිවයිනේ සියලුම පොලිස් කොට්ඨාශවල ප්‍රජා පොලිස් කමිටු භාර සියලුම පොලිස් ස්ථානාධිපතිවරුන් සහ කම්කරු දෙපාර්තමේන්තුවේ සියළුම කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් සහකාර කම්කරු කොමසාරිස්වරුන් සහ ජ්‍යෙෂ්ඨ කම්කරු නිලධාරීන් සහභාගී විය.

- **විධිමත් ක්ෂේත්‍රයන්හි ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීම**

ජුනි මස12 දිනට යෙදෙන ‘ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට’ සමගාමීව සැමරුම් වැඩසටහනක්

කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2024.06.18 දින පවත්වන ලදී. එහිදී, විධිමත් ක්ෂේත්‍රයන්හි ආයතන වල, විශේෂයෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කාර්මික උද්‍යාන වල ස්ථාපිත ආයතන වල සේවායෝජකයන් වෙතින් සිය ආයතන විසින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ වැඩසටහන ආරම්භ කරන ලදී.එයට සමගාමීව දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය මගින් QR කේතයක් හඳුන්වා දී ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට දිවයිනේ සියලුම ආයතන වෙතින් ප්‍රතිඥාව ලබා ගැනීමේ කටයුතුද ආරම්භ කරන ලදී. එසේම, ක්ෂේත්‍ර පරීක්ෂණ වල යෙදෙන කම්කරු නිලධාරීන් විසින් අවිධිමත් ක්ෂේත්‍රය ප්‍රමුඛ කර ගනිමින් අනෙකුත් සියලුම ක්ෂේත්‍රයන්හි සේවායෝජකයන් වෙතින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ කටයුතුද ආරම්භ කරන ලදී.

- **දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම**

කම්කරු දෙපාර්තමේන්තුව විසින් ස්ත්‍රීන් සහ තරුණ අයගේ සේවයේ නියුක්ත කරවීමේ අයිවාසිකම් ආරක්ෂා කිරීම සහ ළමා ශ්‍රමය පිටු දැකීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන අතර, 2024/01/01 දින සිට 12/31 දින දක්වා පවත්වා ඇති දැනුවත් කිරීමේ වැඩසටහන්වල ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 2.15** - කාන්තා හා ළමා කටයුතු අංශය විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා

| වැඩසටහනෙහි නම | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව |
|---|---|---|
| පෞද්ගලික අංශයේ සේවිකාවන් සඳහා කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් | 12 | 418 |
| අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ විශේෂ කණ්ඩායම් පරීක්ෂණ වලට සමගාමීව ධීවර ක්ෂේත්‍රය ආශ්‍රිත ප්‍රජාව තුළ අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ නීතිය සම්බන්ධ දැනුවත් කිරීම් | 47 | 2176 |
| තේ සහ වැවිලි බෝග ක්ෂේත්‍රය සහ කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත කුඩා හා මධ්‍ය පරිමාණ සේවායෝජකයින් සඳහා අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ නීතිය සම්බන්ධ දැනුවත් කිරීම් | 62 | 1532 |
| කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රජා පොලිස් කොට්ඨාස භාර ස්ථානාධිපතිවරුන්, ඒ යටතේ ක්‍රියාත්මක වන ප්‍රජා පොලිස් ඒකකයන්හි ස්ථානාධිපතිවරුන්, කම්කරු දෙපාර්තමේන්තුවේ අදාළ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් සහ සහකාර කම්කරු කොමසාරිස්වරුන් සඳහා ළමා ශ්‍රමය තුරන් කිරීම හා පුරවැසි වගකීම පිළිබඳ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාම සම්බන්ධ විශේෂ පුහුණු වැඩසටහන | 01 | 142 |
| ප්‍රජා පොලිස් උපදේශන කමිටු සමඟ ඒකාබද්ධවී කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්බන්ධ වී උපදේශන කමිටු සාමාජිකයින් වෙත අනතුරුදායක ළමා ශ්‍රමය හා ළමා ශ්‍රමය පිළිබඳ නීතිය සම්බන්ධ දැනුවත් කිරීම් | 14 | 587 |
| **එකතුව** | **136** | **4855** |

### 2.2.7. සේවකයාගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා වූ සුනිසි වැඩ පරිසරය තහවුරු කිරීම

කර්මාන්තශාලා තුළ සේවයෙහි යෙදෙන ශ්‍රමිකයන් හට භෞතිකමය වශයෙන් යම් ශාරීරික හානි සිදුවීම සහ අනතුරු ඇති වීම අවම කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ වගකීමක් වේ. ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලාවල සේවය කරන සේවකයන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය, සෞඛ්‍යය හා සුභසාධනය සම්බන්ධයෙන් 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත යටතේ කටයුතු කරනු ලැබේ.

අනතුරු රහිත වැඩ පරිසරය තහවුරුකිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ප්‍රධාන වශයෙන් පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.




කර්මාන්තශාලා ආඥාපනතේ නව රෙගුලාසි යටතේ 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කර්මාන්තශාලා 2221 ක් ලියාපදිංචි කරන ලදී. ඒ අනුව, කර්මාන්තශාලා ආඥාපනතේ නව රෙගුලාසි යටතේ 2024.12.31 දිනට ලියාපදිංචි කරනු ලැබූ කර්මාන්තශාලා සංඛ්‍යාව 6614 කි.



දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරු විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කර්මාන්තශාලා 2578 ක් පරීක්ෂා කර ඇත.

2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා වාර්තා වී විමර්ශනය කරන ලද මරණීය අනතුරු සංඛ්‍යාව 47 ක් වන අතර මරණීය නොවන අනතුරු සංඛ්‍යාව 1606 කි.



2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පරීක්ෂා කර අනුමත කරන ලද ගොඩනැගිලි පිඹුරුපත් සංඛ්‍යාව 244 කි.






බලයලත් නිලධාරීන් විසින් 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පරීක්ෂා කර ඉදිරිපත් කරනු ලැබූ අධි අන්තරායදායී යන්ත්‍ර පරීක්ෂණ වාර්තා සංඛ්‍යාව 11,965 කි.

**වගුව 2.16 -** කර්මාන්තමය සුරක්ෂිතතා අංශය විසින් සිදු කරන ලද සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා

| **වැඩසටහනේ ස්වභාවය** | **වැඩසටහනෙහි නම** | **පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව** | **සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව** |
|---|---|---|---|
| වෘත්තීය සුරක්ෂිතතාවය ප්‍රවර්ධනය | වෘත්තීය සුරක්ෂිතතාවය පිළිබඳව පැවැත්වූ දැනුවත් කිරීමේ වැඩසටහන් (ඇඟළුම්, නිෂ්පාදන, වැවිලි, ඉදිකිරීම් ආදී ක්ෂේත්‍ර ආවරණය වන පරිදි) | 115 | 5288 |

- **සේවක සුරක්ෂිතතාවය ඉහල නැංවීම සඳහා ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීම**

කර්මාන්තශාලා තුල වෘත්තීය සුරක්ෂිතතාවය තහවුරු කිරීම මගින් සුරක්ෂිතතා සංස්කෘතියකට මග පෑදීම ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වේ.

සියලුම කර්මාන්ත ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා කාල සීමාව තුළ දී ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු 202 ක් පිහිටුවා ඇත. ඒ අනුව, 2024.12.31 දිනට පිහිටුවා ඇති මුළු ද්විපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාව 877 කි.

- **වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් සේවායෝජකයන් සහ සේවකයන් පුහුණු කිරීමේදී භාවිතා කිරීම සඳහා පුහුණු මොඩියුල සකස් කිරීම**

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වෘත්තීය සුරක්ෂිතතාවය, විදුලි සුරක්ෂිතතාවය, යාන්ත්‍රික සුරක්ෂිතතාවය සහ රසායනික ද්‍රව්‍ය සුරක්ෂිතතාවය යන ක්ෂේත්‍රයන් 04 සම්බන්ධයෙන් සේවායෝජකයන් සහ සේවකයන් දැනුවත් කිරීමේදී භාවිතා කිරීම සඳහා වෙන් වශයෙන් පුහුණු මොඩියුල කෙටුම්පත් සකස් කරන ලදී. එහි ඉදිරි කටයුතු 2025 වර්ෂයේදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

### 2.2.8. සේවකයාගේ වෘත්තීය සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා ක්‍රියාත්මක වූ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

සේවා ස්ථානයන්හි සෞඛ්‍යාරක්ෂිත බව තහවුරු කිරීම සඳහා සේවා ස්ථානවල සෞඛ්‍ය ගැටලු හෝ අනතුරු සිදුවීමට හැකි අවස්ථා පවතීද යන්න සම්බන්ධයෙන් විද්‍යාත්මක ක්‍රමවේදයන් යටතේ සොයාබැලීම සහ එම අනතුරු වැළැක්වීම සඳහා පියවර ගැනීම හා වළක්වා ගැනීමට ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත් කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලැබේ. ඒ අනුව 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

- පාරිසරික මිනුම් සංඛ්‍යාව - 233
- ජෛව විද්‍යාත්මක පරීක්ෂණ සංඛ්‍යාව - 236
- වෘත්තීය සෞඛ්‍ය හා සුරක්ෂිතතා විගණනයන් සංඛ්‍යාව - 241

**වගුව 2.17 -** මැදිහත් වීම් සිදු කර ගැටළුකාරී තත්ත්වයන් විසදීම් පිළිබඳ තොරතුරු

| **මැදිහත් වීම් සිදු කර ගැටළුකාරී තත්ත්වයන් විසඳනු ලැබූ ආයතන සංඛ්‍යාව** | **ක්‍රියාකාරකමේ නිමැවුම** |
|---|---|
| 08 | ප්‍රධාන වශයෙන් ආයතන 08ක ඇති වූ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය සම්බන්ධයෙන් වන ගැටළුකාරී තත්ත්වයන් සඳහා අවශ්‍ය මැදිහත් වීම් සිදු කර එම තත්ත්වයන් විසදීම සඳහා ක්‍රියාමාර්ග ගන්නා ලදී. එමගින් සේවකයන් 1752 දෙනෙකුගේ වෘත්තීය සුරක්ෂිතතාවය සහ සෞඛ්‍ය අයිතීන් සම්බන්ධයෙන් වන ප්‍රමිතීන් ආරක්ෂා කිරීමට පියවර ගන්නා ලදී. |

**වගුව 2.18 -** වෘත්තීය ස්වස්ථතා අංශය විසින් සිදු කරන ලද සේවා සේවක දැනුවත් කිරීමේ වැඩසටහන්වල තොරතුරු - 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා

| **වැඩසටහනේ ස්වභාවය** | **වැඩසටහනෙහි නම** | **පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව** | **සහභාගි වූ සංඛ්‍යාව / ප්‍රතිලාභීන් සංඛ්‍යාව** |
|---|---|---|---|
| වෘත්තීය සෞඛ්‍යය ප්‍රවර්ධනය | සේවායෝජකයන් සහ සේවකයන් සඳහා සංවිධානය කර පවත්වන ලද පුහුණු වැඩසටහන් | 92 | 1101 |
| | ස්ථානීය පරීක්ෂණ වලින් අනතුරුව සේවායෝජකයන් සහ සේවකයන් සඳහා පවත්වන ලද ක්ෂේත්‍රගත පුහුණු (On the spot field trainings) වැඩසටහන් | 173 | 2832 |

එසේම, බස්නාහිර පළාත තුළ සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත වල වැඩ පරිසර තත්ත්වය (ශබ්දය, ආලෝකය, තාපය, වාතාශ්‍රය ආදිය) ප්‍රමිතිගත තත්ත්වයට ගෙන ඒමේ ව්‍යාපෘතියක් 2024 වර්ෂයේදී ආරම්භ කරන ලදී. ඒ අනුව, බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කයන්හි තෝරා ගන්නා ලද පහත සඳහන් කර්මාන්තපුරයන් හි මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී.

- **කොළඹ දිස්ත්‍රික්කය** - කාර්මික සංවර්ධන මණ්ඩලයේ පානළුව කාර්මික ජනපදය සහ පනාගොඩ Templeburg කර්මාන්තපුරය
- **ගම්පහ දිස්ත්‍රික්කය** - කාර්මික සංවර්ධන මණ්ඩලයේ ඒකල කාර්මික ජනපදය
- **කළුතර දිස්ත්‍රික්කය** - නාගොඩ Fulerton කර්මාන්තපුරය, හොරණ වවුලගල කර්මාන්තපුරය සහ හොරණ අරමනාගොල්ල කර්මාන්තපුරය

මෙම ව්‍යාපෘතියේ මූලික සමීක්ෂණ කටයුතු වලදී කර්මාන්ත ශාලාවන් හි සිටින මුළු සේවක සංඛ්‍යාව, නිෂ්පාදනය, අමුද්‍රව්‍ය, වැඩ කරන වේලාවන්, සේවක සුභසාධන පහසුකම් සහ පාරිසරික තත්ත්වයන් (ආලෝක මට්ටම, ශබ්ද මට්ටම, තාප විදාව (Wet Bulb Globe Temperature – WBGT) ආදිය) පිළිබඳව තොරතුරු එක් රැස් කරන ලදී. එසේම, පාරිසරික තත්ත්වය පිළිබඳව ලබා ගන්නා ලද මිනුම් අනුව සම්මත මට්ටමින් අපගමනය වූ අවස්ථා හඳුනාගෙන වැඩ පාරිසරික තත්ත්වයන් දියුණු කර ගත යුතු ආකාරය සම්බන්ධයෙන් සේවායෝජකයන් සහ සේවකයින් දැනුවත් කිරීම සහ නිර්දේශ ලබා දීම ද සිදු කරන ලදී.

### 2.2.9. තොරතුරු සන්නිවේදන කටයුතු

- **දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය හා දෙපාර්තමේන්තුවේ නිල සමාජ මාධ්‍ය කටයුතු**




I. කම්කරු දෙපාර්තමේන්තුවේ නව නිල වෙබ් අඩවිය (www.labourdept.gov.lk) එළිදැක්වීම 2024.06.18 දින සිදු කරන ලදී. සේවාලාභීන් සඳහා අවශ්‍ය අයදුම් පත්‍ර, ආකෘති පත්‍ර, උපදෙස් හා කම්කරු අණ පනත් මෙන්ම සේවායෝජකයන් විසින් අනුගමනය කළ යුතු පඩි පාලක සභා තීරණ ඇතුළු අවශ්‍ය ලේඛන බාගත කරගත හැකි වන පරිදි මෙම වෙබ් අඩවියෙහි පළ කර ඇති අතර එම තොරතුරු නිරන්තරයෙන් යාවත්කාලීන කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම, දෙපාර්තමේන්තුවේ ඊ-සේවාවන් ලබා ගැනීමේ පහසුකම්ද මෙයට ඇතුළත් කර සංවර්ධනය කරමින් පවතී.

II. දෙපාර්තමේන්තුව විසින් නිල යූ ටියුබ් චැනලයක්, ෆේස්බුක් පිටුවක් සහ ට්විටර් ගිණුමක් පවත්වාගෙන යමින් යාවත්කාලීන කරනු ලැබූ තොරතුරු මහජනතාව වෙත ලබා දීමට කටයුතු කරනු ලැබේ.

| | |
|---|---|
| YouTube Channel | Subscribers: 1.87K<br>Number of Videos included : 130 |
| Facebook Page | Followers: 1.5K |
| Twitter | Followers: 105 |

- **කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලය**

කම්කරු ක්ෂේත්‍රයට අදාළ අණ පනත්, පොත්පත් හා ප්‍රකාශන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානතම පුස්තකාලය කම්කරු දෙපාර්තමේන්තුවේ විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙමගින් කම්කරු දෙපාර්තමේන්තුවේ, කම්කරු අමාත්‍යාංශයේ සහ ඒ යටතේ පවතින අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩල සඳහා මෙන්ම බාහිර පාඨකයන් සඳහාද කම්කරු නීති ක්ෂේත්‍රයට අදාළ සියලුම අණ පනත්, පොත් පත්, ප්‍රකාශන ආදිය පරිශීලනය සඳහා පහසුකම් සලසනු ලබයි.

පුස්තකාලයේ පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා පුස්තකාල දත්ත කළමනාකරණ පද්ධතිය (KOHA මෘදුකාංගය) ස්ථාපිත කිරීමේ කටයුතු 2025 වර්ෂය තුළදී සිදු කිරීමට සැලසුම් කර ඇත.

- **ප්‍රකාශන කටයුතු**

**කතිකාව සඟරාව**

ආයතන තුල සේවා හා සේවක දෙපාර්ශවය අතර සුහදතාවය වර්ධනය කිරිම සඳහා අවශ්‍ය දැනුම ලබා දීම මගින් ආරවුල් අවම කිරීම සඳහා දායකත්වය ලබා දීම කතිකාව සඟරාව එළි දැක්වීමේ අරමුණ වේ. ඒ අනුව, කතිකාව සඟරාවේ 23 වන වෙළුම 2024 දෙසැම්බර් මාසයේදී එළිදක්වන ලදී.

කම්කරු දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන කාර්යයභාරය සහ කම්කරු නීති සම්බන්ධයෙන් මහජනතාව තුළ දැනුම වර්ධනය කිරීම සඳහා AI Chatbot සකස් කිරීම සහ කම්කරු නීති ක්ෂේත්‍රය සම්බන්ධයෙන් නිලධාරින්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා Self Learning Module සකස් කිරීම ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ඇතිව 2025 වර්ෂයේදී සිදු කිරීමට අවශ්‍ය ව්‍යාපෘති යෝජනා සකස් කර ඉදිරිපත් කර ඇත.




## 2.2.10. කම්කරු ක්ෂේත්‍රයට අදාළ සමීක්ෂණ සහ අධ්‍යයනයන්


- **වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණය**

මෙම සමීක්ෂණය මගින් රටේ සංවර්ධන ක්‍රමෝපායන් සැකසීම සඳහා අවශ්‍ය ශ්‍රම පිරිවැය, වැඩකළ පැය ගණන හා සාමාන්‍ය ඉපයීම් පිළිබඳ දත්ත ලබා ගැනීම සිදු කෙරේ. එමගින් රජයේ සහ පෞද්ගලික අංශයේ සැලසුම් සම්පාදනය හා තීරණ ගැනීම සඳහා මෙන්ම සේවා සේවක දෙපාර්ශවයේ උන්නතිය වෙනුවෙන් සකස් කරනු ලබන ඉදිරි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය තොරතුරු ලබා දීම සිදු කෙරේ.

වැඩ කළ පැය ගණන හා ශ්‍රම පිරිවැය පිළිබඳ සමීක්ෂණයේ 2023 වර්ෂයට අදාළ දත්ත පරිගණක ගත කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එසේම, 2024 වර්ෂයට අදාල තොරතුරු ලබා ගැනීම සඳහා ප්‍රශ්නාවලි අදාළ ආයතන වෙත තැපැල් කිරීමේ කටයුතු ද සිදු කරන ලදී

- **Annual Survey of Private and Semi-Government Sector Employment - 2022**


මෙම වාර්තාව මගින් පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවකයන් සතියක් තුලදී සාමාන්‍යයෙන් වැඩකරන පැය ගණන, සාමාන්‍ය මාසික නාමික ආදායම, සාමාන්‍ය මාසික මූර්ත ආදායම, ශ්‍රම පිරිවැය ආදී තොරතුරු ස්ත්‍රී පුරුෂ භාවය අනුව හා රැකියාව අනුව ප්‍රකාශයට පත් කරනු ලැබේ.



- **ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 - කොළඹ දිස්ත්‍රික්කය**

කොළඹ දිස්ත්‍රික්කයෙහි ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය ඇගයීම, ළමා ශ්‍රමිකයන් සිටින පවුල් වල සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම අරමුණු කර ගනිමින් ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයක් 2024 වර්ෂයේදී සිදු කරන ලදි.

මෙම අධ්‍යයනය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි ග්‍රාම නිලධාරි වසම් 100 කින් නිවාස ඒකක 1000 ක නියැදියක් තෝරා ගන්නා ලදි. ඒ සඳහා සරල සසම්භාවී ක්‍රමය මෙන්ම ක්‍රමික නියැදීමේ ක්‍රමය ද භාවිතා කල අතර, දත්ත රැස් කිරීම සඳහා ගෘහ ඒකක සමීක්ෂණ ක්‍රමය මෙන් ම කඩිනම් තක්සේරු ක්‍රමය ද භාවිතා කරන ලදි. දත්ත රැස් කිරීමෙන් අනතුරුව අධ්‍යයන ප්‍රතිඵල ළමා ශ්‍රමය තුරන් කිරීමේ ජාතික මෙහෙයුම් කමිටුවට ඉදිරිපත් කරන ලද අතර "ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනය 2024 - කොළඹ දිස්ත්‍රික්කය" වාර්තාව සකස් කර මුද්‍රණය කිරීමට කටයුතු කරන ලදී.




- **තේ කර්මාන්තශාලා, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ඇති කර්මාන්තශාලා සහ රබර් කර්මාන්තශාලා ආරක්ෂණ උපදෙස් වලට අනුකූල වීම කෙරෙහි වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පරීක්ෂණයේ බලපෑම පිළිබඳ අධ්‍යයනය.**

මෙම අධ්‍යයනය මගින් කර්මාන්තශාලා ලියාපදිංචියේ පැවති දුර්වලතා, අනතුරු පිළිබඳ තොරතුරු ඇතුළත් කිරීම සඳහා භාවිතා කරනු ලබන ලියාපදිංචි කිරීමේ ලේඛන (General Registry) පවත්වාගෙන යාමේ දුර්වලතා, ප්‍රථමාධාර පහසුකම්වල පැවති දුර්වලතා ආදී කර්මාන්තශාලාවන්හි පැවති අඩුපාඩු සහිත අංශ හඳුනා ගන්නා ලදී. ඒ අනුව කර්මාන්තශාලාවන්හි පැවති එම දුර්වලතා ඉදිරියේදී අවම කර ගැනීම සඳහා මෙම අධ්‍යයන වාර්තාව මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ පදනම් කරගනිමින් ඉටු කල හැකි ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලසුමක් සකස් කර 2025 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

- **කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික සම්බන්ධතා අංශය වෙත 2020 සිට 2024 වර්ෂ දක්වා ලැබුණු කාර්මික ආරාවුල් පිළිබඳ අධ්‍යයනය**

මෙම අධ්‍යයනය මගින් 2020 – 2024 කාලපරිච්ඡේදයට අදාළව ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ලංකා සතොස ලිමිටඩ්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ආදී අර්ධ රාජ්‍ය අංශයේ ආයතනයන්ට අදාළව දෙපාර්තමේන්තුවට ලැබී ඇති කාර්මික ආරාවුල් සම්බන්ධ ගොනු 124ක් අධ්‍යයනය කරන ලදී. එහිදී කාර්මික ආරවුල් ඇතිවීමට ප්‍රධාන හේතු හඳුනා ගන්නා ලද එම හේතු වලට අදාළව පරිපාලනමය වශයෙන් ගත යුතු පියවර සම්බන්ධයෙන් නිර්දේශ ඇතුලත් වාර්තාවක් ද සකස් කිරීමේ කටයුතු කරමින් පවතී.

- **ශ්‍රී ලංකාවේ අවම වැටුප සහ නාමික වැටුප අතර පරතරය අඩු කිරීම පිළිබඳ විශ්ලේෂණය**

ශ්‍රම ප්‍රමිති අංශය සහ සංඛ්‍යාලේඛන අංශය විසින් ඒකාබද්ධව සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින් ජාතික අවම වේතනය (මාසික) අවම වශයෙන් රු. 24,120.00 ක් විය යුතු බව නිර්දේශය කර ඇත. ඒ අනුව, එම නිර්දේශ ඉදිරියේදී පෞද්ගලික අංශයේ සිදු කරනු ලබන වැටුප් සංශෝධනයන්හිදී ගැලපීම් සිදු කිරීම සඳහා භාවිතා කිරීමට යෝජනා වී ඇත.

## 2.2.11. ප්‍රධාන සැමරුම් වැඩ සටහන්

- **ජාත්‍යන්තර කාන්තා දින සැමරුම් වැඩසටහන** 2024

මාර්තු 08 දිනට යෙදෙන ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ කාන්තා දින සැමරුම් වැඩසටහන 2024.03.07 දින කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී.

"කාන්තාවන්ට බලපාන කම්කරු නීතිය" සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය මගින් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා කෙටි වීඩියෝ පට නිර්මාණ තරඟයක් පවත්වා එම තරඟයේ ජයග්‍රාහකයන් වෙත සහතිකපත්‍ර ලබා දීම එදින සිදු කරන ලදී. එමෙන්ම විශ්ව විද්‍යාල සිසුන් වෙනුවෙන් කාන්තාවන්ට බලපාන කම්කරු නීතීය පිළිබඳව විවෘත සාකච්ඡා මණ්ඩපයක් ද පවත්වන ලදී. ඒ සඳහා ශ්‍රම වාසනා අරමුදලේ දායකත්වය ද හිමි විය.

- **ලෝක ළමා ශ්‍රම විරෝධී දින වැඩසටහන - 202**4

2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාවෙන් ළමා ශ්‍රමය තුරන් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ජුනි මස 12 වන දිනට යෙදෙන "ලෝක ළමා ශ්‍රම විරෝධී දිනය" ට සමගාමීව, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ වැඩසටහන, 2024.06.18 වන දින කම්කරු මහලේකම් කාර්යාලයේ 10 වන මහල ශ්‍රවනාගාරයේදී පවත්වන ලදී. එහිදී, ළමා ශ්‍රමය තුරන් කිරීමේ කාර්යය ප්‍රවර්ධනය උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව සහ කාර්මික සංවර්ධන මණ්ඩලය අතර අවබෝධතා ගිවිසුමක් ද අත්සන් තබන ලද අතර, කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක කාර්මික උද්‍යාන වල පිහිටි ආයතන 61ක සේවායෝජකයන් විසින් තම ආයතන ළමා ශ්‍රමයෙන් තොරව පවත්වාගෙන යන බවට ප්‍රතිඥාවක්ද ලබා දෙන ලදී. එසේම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳව විධිමත් අංශයේ ආයතන වෙතින් ප්‍රතිඥා ලබා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුවේ නව වෙබ් අඩවිය මගින් QR කේතයක් හඳුන්වාදීම ද මෙම වැඩසටහනේදී සිදු කරන ලදී.

- **ජාතික වෘත්තීය සුරක්ෂතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය**

ජාතික වෘත්තීය සුරක්ෂතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය වෙනුවෙන් වෘත්තීය ස්වස්ථතාවය සහ සෞඛ්‍ය සම්බන්ධ පුහුණු වැඩමුළු තුනක් පවත්වන ලදී.

**වගුව 2.19 - ජාතික වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය පිළිබඳ සතිය වෙනුවෙන් පැවැත්වූ පුහුණු වැඩමුළු සම්බන්ධ තොරතුරු**

| **පුහුණු වැඩමුළු පැවැත්වූ දිනය** | **පුහුණු වැඩමුළු පැවැත්වූ ස්ථානය** | **සහභාගී වූ සේවක/සේවා සංඛ්‍යාව** |
|---|---|---|
| 2024.10.23 | කාර්මික සංවර්ධන මණ්ඩලයේ පානළුවේ පිහිටි කාර්මික ජනපදය | 35 |
| 2024.10.29 | හොරණ අරමණාගොල්ල පිහිටි කාර්මික ජනපදය | 45 |
| 2024.10.25 | වවුනියාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය (දෙමළ මාධ්‍යයෙන්) | 33 |

## 2.2.12. මානව සම්පත් කළමනාකරණය

- දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල අවශ්‍යතා හඳුනා ගැනීම, අවශ්‍යතාවය පරිදි බඳවා ගැනීම් සිදු කිරීම, නිලධාරීන්ගේ උසස් කිරීම්, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම්, කාර්ය සාධනය ඇගයීම, වැටුප් වර්ධක ලබා දීම, ස්ථාන මාරු කිරීම්, නිලධාරීන් විශ්‍රාම ගැන්වීම, නිලධාරීන්ගේ නිවාඩු කටයුතු සහ කාර්ය මණ්ඩලයේ විනය කටයුතු යන දෛනික කාර්ය මණ්ඩල පරිපාලන කටයුතු 2024 වර්ෂයේදී ද සිදු කරන ලදී.
- කම්කරු නිලධාරී II ශ්‍රේණිය සඳහා නවක නිලධාරීන් 57 දෙනෙකු බඳවා ගැනීම සිදු කර ඇත. බඳවා ගන්නා ලද නවක කම්කරු නිලධාරීන් 57 දෙනා සඳහා 2024.05.08 දින සිට 2024.09.06 දින දක්වා සේවාරම්භක පුහුණුවක් ලබා දීමෙන් අනතුරුව 2024.09.09 දින දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල සහ අංශ වෙත අනුයුක්ත කරන ලදී.
- සහකාර කම්කරු කොමසාරිස්, කම්කරු නිලධාරී - II ශ්‍රේණිය, මානව සම්පත් සංවර්ධ නිලධාරී -II ශ්‍රේණිය, කාර්යාල සේවක සේවය - III, II සහ I ශ්‍රේණි, ඒකාබද්ධ රියදුරු සේවය-II ශ්‍රේණිය, වඩු කාර්මික -II ශ්‍රේණිය යන තනතුරුවලට අදාළව කාර්යක්ෂමතා කඩයිම් පරීක්ෂණ 2024 වර්ෂයේදී පවත්වා ඇත. ඒ යටතේ විභාග සඳහා නිලධාරීන් 58 දෙනෙකු සහභාගී විය.
- කාර්යාල සේවක සේවය - III ශ්‍රේණිය සඳහා නිලධාරීන් 09 දෙනෙකු සම්මුඛ පරීක්ෂණ මගින් බඳවා ගන්නා ලදී.
- එසේම, දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලයේ පුහුණු අවශ්‍යතා හඳුනා ගෙන අභ්‍යන්තර පුහුණු වැඩසටහන් සංවිධානය කර පැවැත්වීම, බාහිර ආයතන විසින් පවත්වනු ලබන පුහුණු පාඨමාලා වෙත නිලධාරීන් යොමු කිරීම, සේවා අවශ්‍යතාවය පරිදි උපාධි හා පශ්චාත් උපාධි හැදෑරීම සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන නිලධාරීන් වෙත සැපයීම සහ විදේශ පුහුණු සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත.
- දේශීය පුහුණු වැඩසටහන් සඳහා 2024 වර්ෂය සඳහා රු. 10,400,000.00 ක ප්‍රතිපාදන ලැබී තිබුණි. ඒ අතුරින් 2024.12.31 දිනට වියදම රු. 8,546,920.00 ක් වන අතර වියදම ප්‍රතිපාදනයන්හි ප්‍රතිශතයක් ලෙස 82% කි.
  එසේම, සේවා අවශ්‍යතාවය අනුව පශ්චාත් උපාධි, උපාධි, ඩිප්ලෝමා සහ වැඩමුළු සඳහා දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් විසි දෙනෙකු වෙත ප්‍රතිපාදන ලබා දී ඇත.
- ප්‍රාදේශීය කම්කරු කාර්යාලයන්හි කාර්ය මණ්ඩලය සඳහා කාර්යසාධනය ඇගයීමේ ක්‍රමවේදයක් (Performance Evaluation System) සහ මූල්‍යමය නොවන සේවය ඇගයීමේ ක්‍රමවේදයක් (Non Financial Rewarding System) සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ

(SLIDA) තාක්ෂණික සහය ලබා ගැනීමට ඉල්ලීමක් සිදු කරන ලද අතර, එමගින් ඉදිරිපත් කරනු ලබන සැලැස්ම අනුව 2025 වර්ෂයේදී ඉදිරි කටයුතු සිදු කිරීමට සැලසුම් කර ඇත.

- එසේම, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ තාක්ෂණික සහය ලබා ගනිමින් Code of Ethics for officers for service delivery of the Department of Labour සකස් කිරීමට ඉල්ලීමක් සිදු කරන ලද අතර, එහි ඉදිරි කටයුතු 2025 වර්ෂයේදී සකස් කිරීමට සැලසුම් කර ඇත.
- කම්කරු දෙපාර්තමේන්තුවේ අංශ සඳහා පුහුණු මොඩියුල (Training Modules) කෙටුම්පත් කිරීමේ කටයුතු 2024 වර්ෂයේදී ආරම්භ කරන ලදී. 2025 වර්ෂයේදී කමිටුවක් මගින් මෙම කෙටුම්පත් කරන ලද පුහුණු මොඩියුල වඩාත් යෝග්‍ය පරිදි සකස් කිරීමට සැලසුම් කර ඇත.

## 2.2.13. යටිතල පහසුකම් සංවර්ධනය

දිවයින පුරා විසිරී සිටින සේවාලාභීන්ට වඩාත් ඵලදායී සේවයක් සලසා දීමේ අරමුණ පෙරදැරිව දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි සහ දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය කාර්යාලයන් හි යටිතල පහසුකම් සංවර්ධනයට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාලයන් හි අවශ්‍යතාවය පරිදි සුළු අළුත්වැඩියා කටයුතු සිදු කරන ලද අතර මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ සහ කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සිදු කර ඇත.

ඒ අනුව, 2024.12.31 දින වන විට මෙහෙවර පියෙස ගොඩනැගිල්ලේ 16 මහලේ අභ්‍යන්තර නිර්මිත සකස් කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කෙරෙමින් පැවති අතර කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ 3, 4 සහ 5 මහල්වල අභ්‍යන්තර නිර්මිත සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පැවතිණි.

එසේම, සේවා ලාභීන් වෙත එකම ස්ථානයක් තුළින් සේවක අර්ථසාධක අරමුදල් ආශ්‍රිත සේවාවන් ඉටුකර ගැනීම සඳහා කම්කරු මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි පළමු මහලේ නව කාර්යාල පරිශ්‍රය 2024.08.06 දින විවෘත කිරීමට කටයුතු කරන ලදී.

## 2.2.14. කාර්යයන් අධීක්ෂණය

2024 වර්ෂයේ දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම යටතේ වන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා දෙපාර්තමේන්තුවේ අංශයන් කටයුතු කරනු ලබන ආකාරය සහ ප්‍රගතිය පරීක්ෂා කරන ලදී. ඒ අනුව, කම්කරු කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පැවැත්වෙන ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම තුළින් එක් එක් අංශයන්හි ප්‍රගතිය සහ අංශයන්හි කටයුතු සිදු කරගෙන යාමේදී මතු වී ඇති පරිපාලන ගැටළු සම්බන්ධයෙන් උපදෙස් සහ විසඳුම් ලබා දීමට කටයුතු කරන ලදී.

කලාප භාර නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු විසින් සිය කලාපයට අදාල දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාලයන්හි 2024 වර්ෂයේ පළමු, දෙවන සහ තෙවන කාර්තුවලට අදාල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.

කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන් මගින් දිස්ත්‍රික් කම්කරු කාර්යාල සහ උප කම්කරු කාර්යාල වල ප්‍රගතිය අධීක්ෂණය සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවා නිර්දේශ ලබා ගන්නා ලදී. ඒ අනුව, ලබා දී ඇති නිර්දේශ අනුව ප්‍රගතිය අධීක්ෂණය 2025 වර්ෂයේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

එසේම, ප්‍රධාන කාර්යාලය මගින් ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා ද දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් පිහිටුවන ලද අතර 2024

වර්ෂය අවසන් වන විට කමිටුව මගින් සාකච්ඡා සිදු කරමින් පැවති අතර කමිටු නිර්දේශ අනුව 2025 වර්ෂයේදී ඉදිරි පියවර ගැනීමට සැලසුම් කර ඇත.

## 2.2.15. මූල්‍ය ප්‍රගතිය

2024 වර්ෂය සඳහා වාර්ෂික අයවැය මගින් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලැබූ ප්‍රතිපාදන රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව, කාර්යක්ෂමව හා ඵලදායී ලෙස අදාළ අරමුණු ඉටු කර ගැනීම සඳහා භාවිතා කිරීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

ඒ අනුව, 2024.12.31 දින වන විට වෙන් කරන ලද පුනරාවර්තන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 99.51% ක ප්‍රතිශතයක් ද ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රතිපාදනයන්ගෙන් 22.52% ක ප්‍රතිශතයක් ද මේ සඳහා යොදා ගනිමින් මූල්‍ය කළමනාකරණ ඉලක්ක සපුරා ගෙන ඇත.

**වගුව 2.20 -** 2024.12.31 දිනට පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්

| | 2024 **වර්ෂය සඳහා ප්‍රතිපාදනය (රු)** | **අතිරේක ප්‍රතිපාදන ලැබීම් රු.** | 2024.12.31 **දිනට වියදම (රු)** | **ප්‍රතිපාදනයන් හි ප්‍රතිශතයක් ලෙස සත්‍ය වියදම** |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 2,895,981,140.00 | 127,000,000.00 | 3,008,102,293.00 | 99.51 % |
| ප්‍රාග්ධන වියදම් | 1,396,000,000.00 | 7,925,000.00 | 316,149,882.00 | 22.52 % |

ප්‍රාග්ධන වියදම් යටතේ ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු සිදු කිරීමේ ක්‍රියාකාරකම් පනහක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද කම්කරු දෙපාර්තමේන්තුව වෙත පවතින තාක්ෂණ කාර්යයන්ට අදාළ ඉංජිනේරු සහ තාක්ෂණ නිලධාරී හිඟය, එම කාර්යයන් බාහිර ආයතන මගින් සිදු කරවා ගැනීමට සිදු වීම, සහ එම ආයතන මගින් ප්‍රමාණ පත්‍ර සහ මිල ගණන් කැඳවීමේ ලේඛන ආදිය සකස් කර දීම ප්‍රමාද වීම සහ ගොඩනැගිලි අළුත්වැඩියාවන්ට අදාළ කටයුතු වල සැළකිය යුතු ප්‍රමාදයක් සිදු වීම යන කරුණු හේතුවෙන් 2024 වර්ෂය තුළ ප්‍රාග්ධන වියදම් සඳහා වන ප්‍රතිපාදන වැය කිරීමේ ප්‍රගතියේ අඩුවක් සිදු විය.

මෙම ගැටළුවට විසඳුමක් වශයෙන් 2025 වර්ෂයේදී නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් සුදුසු උපදේශන ආයතනයක් තෝරා ගෙන මෙම කටයුතු වඩාත් කාර්යක්ෂම ආකාරයෙන් සිදු කිරීමට සැලසුම් කර ඇත.

# 2.3. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

## 2.3.1. වර්ෂය තුළ ක්‍රියාත්මක වෘත්තීය මාර්ගෝපදේශ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- **9 ශ්‍රේණියේ පාසල් සිසුන් දැනුවත් කිරීම**

බහුවිධ බුද්ධි පරීක්ෂණය පදනම් කරගනිමින් දරුවාගේ බුද්ධි දක්ෂතා හා අනාගත අරමුණු හඳුනාගෙන වඩාත් ගැලපෙන කාණ්ඩ විෂයයන් තෝරා ගැනීමටත් එමගින් අ.පො.ස.(සා.පෙළ) සඳහා නිවැරදි මඟ පෙන්වීමක් ලබාදීමේ අරමුණින් මෙම වැඩසටහන පවත්වනු ලැබේ.

2024.01.01 දින සිට 2024.12.31 දක්වා පාසල් සිසුන් 57,778 ඉලක්ක කරගනිමින් දිවයින පුරා වැඩසටහන් 1,572 පවත්වා ඇත.

- **අ.පො.ස. සාමාන්‍ය පෙළ පාසල් සිසුන් දැනුවත් කිරීම**

තම හැකියාව හා ලැදියාව අනුව උසස් පෙළ විෂය පථය තෝරා ගැනීම හා ඉදිරි වෘත්තිය ඉලක්කයන් හඳුනා ගැනීම, විකල්ප අධ්‍යාපන හෝ විකල්ප වෘත්තීය අවශ්‍යතා පිළිබඳ මඟ පෙන්වීමේ අරමුණින් මෙම වැඩසටහන පවත්වනු ලැබේ. මේ යටතේ 2024.01.01 දින සිට 2024.12.31දක්වා පාසල් සිසුන් 71,477 සඳහා දීප ව්‍යාප්තව වැඩසටහන් 2,174 පවත්වා ඇත.

- **උසස් පෙළ සිසුන් දැනුවත් කිරීම**

වඩාත් තරඟකාරී අධ්‍යාපන රටාව තුළට සන්ධාන ගත වී සිටින පාසල් ශිෂ්‍යයන් හට ඔවුන් පිළිබඳ ස්වයං තක්සේරුව ඇති කරවමින් ඔවුන්ගේ ජීවිත අරමුණු සැලසුම් කිරීමට මැදිහත්වීම හෝ පෞරුෂ සංවර්ධනය තුලින් අනාගත වැඩ ලෝකයට ප්‍රවිශ්ය වීම සඳහා අවශ්‍ය මානසික සවිබලතාවය ඇති කර ගැනීමට අවශ්‍ය මඟපෙන්වීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි.

ස්වයං තක්සේරුව හා පුද්ගල පෞරුෂය, ජීවිත අරමුණු සැකසීම, පාසල් අවසන් වීමෙන් පසු උසස් අධ්‍යාපන,වෘත්තීය පුහුණු පාඨමාලා හා රැකියා සඳහා ප්‍රවේශ වීම පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙහිදී සිදුවේ.

2024.01.01 දින සිට 2024.12.31 දක්වා පාසල් සිසුන් 51,335 සඳහා දීප ව්‍යාප්තව වැඩසටහන් 1,381 පවත්වා ඇත.

මීට අමතරව පුහුණුව සඳහා යොමු කිරීම් 19,927 ක් හා ඒක පුද්ගල වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම් 55,264 සිදු කර ඇත.

## 2.3.2. රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා මහජන රැකියා සේවා වැඩසටහන්

**වගුව 2.21** - රැකියා නිර්මාණ, ප්‍රවර්ධන හා මහජන රැකියා සේවා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය - මි. හා රැ.දෙපා.

| ක්‍රියාකාරකම | ප්‍රතිලාභීන් ගණන |
|---|---:|
| රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කිරීම | 74,451 |
| රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම | 54,194 |
| රැකියා අපේක්ෂිතයන් රැකියා සඳහා යොමු කිරීම | 67,515 |
| රැකියා අපේක්ෂිතයන් රැකියා ගත කිරීම | 11,520 |
| ව්‍යවසායකයින් හා ස්වයං රැකියාලාභීන් බිහි කිරීම | 523 |

**වගුව 2.22** - දිස්ත්‍රික් රැකියා පොළ හා ප්‍රාදේශීය රැකියා පොළ පැවැත්වීමේ ප්‍රගතිය - මි. හා රැ.දෙපා.

| වැඩසටහන | යෝජිත වැඩසටහන් ගණන | ක්‍රියාත්මක වැඩසටහන් ගණන | ප්‍රතිලාභීන් ගණන |
|---|---:|---:|---:|
| දිස්ත්‍රික් රැකියා පොළ සහ වෘත්තීය පොළ | 25 | 25 | 7,412 |
| ප්‍රාදේශීය රැකියා පොළ සහ වෘත්තීය පොළ | 100 | 133 | 15,442 |

### 2.3.3. ශ්‍රම වෙළඳපොල තොරතුරු හා පර්යේෂණ වැඩසටහන්

- **ශ්‍රී ලංකාවේ හරිත රැකියා අවස්ථා සහ රැකියා පැතිකඩ**

ශ්‍රී ලංකාවේ සුලභ බලශක්ති ප්‍රභවයන් වන සූර්ය ශක්තිය, සුළඟ,උදම්රළ සහ ජෛව ඉන්ධන තිරසාර සංවර්ධනය කිරීම තුළින් හරිත රැකියා බිහිවීමේ ප්‍රවණතාවය වැඩිවනු ඇත.යෝජිත හරිත ආර්ථිකයට සහයෝගය දෙන හරිත රැකියා අවස්ථා සහ රැකියා පැතිකඩ පිළිබඳව අප දෙපාර්තමේන්තුව විසින් තේමාගත අධ්‍යයනය සිදු කිරිමට තීරණය කොට ඇත.මේ සඳහා ගෝලීය ආර්ථික ප්‍රවණතාවයන්හි අපේක්ෂිත ප්‍රවණතාවයන් කෙරෙහිද ප්‍රධාන අවධානය යොමු කර ඇත.

මෙම අධ්‍යයනය තුළදී විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතනයන්හි විෂය නිර්දේශ තුළට ඇතුළත් සංරචක හඳුනා ගැනීම ,ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළඳපොළ තුළ ඇති හරිත රැකියා හඳුනා ගැනීම සහ අනාගතයේදී හරිත රැකියා බිහිවිය හැකි අංශ හඳුනා ගැනීම, හරිත රැකියා සඳහා අවශ්‍ය සුදුසුකම් සහ කුසලතා හඳුනා ගැනීම, ආයතනික වශයෙන් ලැබෙන ප්‍රතිලාභ හඳුනා ගැනීමට (වැටුප් ,වෘත්තීමය උසස්වීම ආදිය) ආදී මූලික දත්ත රැස් කිරිමට නියමිතය.

මෙම අධ්‍යයනය මඟින් අනාවරණය කර ගන්නා තොරතුරු ගුරුවරුන්, පාසල් සිසුන් ,රැකියා අපේක්ෂිතයන්, වෘත්තීය මාර්ගෝපදේශකයින් ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ ව්‍යාවසායකයන් දෙමාපියන් ඇතුලු සාමාන්‍ය ප්‍රජාව අප දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරින් මඟින් දැනුවත් කිරිමට යොදා ගැනිම නියමිතය.

හරිත රැකියා අවස්ථා පවත්නා ආයතන 30 ක් සමීක්ෂණයට භාජනය කර, දත්ත රැස් කිරීම සහ දත්ත විශ්ලේශණය අවසන් කර ඇති අතර වාර්තාව සකස් කරමින් පවතී. මෙම පර්යේෂණය මහාචාර්ය සුනිල් චන්ද්‍රසිරි මහතාගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක විය.

- **කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සේවා නියුක්තිය සුනිසි මෙහෙවර නිර්ණායක වලට අනුගත වීම පිළිබඳ අධ්‍යයනය**

මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව පෞද්ගලික අංශය තුළ සුනිසි මෙහෙවර නිර්නායකයන් ක්‍රියාත්මක වීම පිළිබඳව අධ්‍යයනය කිරීම සිදු කරයි. මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු නොවී පවතින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාවසාය පාදක කොටගෙන අධ්‍යයනය සිදු කිරීමට තීරණය කර ඇත. මක්නිසාද යත් ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය 58% පමණ අවිධිමත් අංශයට අයත්වේ. එම අංශය තුළ නිදහස (Freedom), සමාන ලෙස සැළකීම (Equity), සුරක්ෂිතතාව (Security), මානව ගරුත්වය (Human dignity) යන ගුණාංග අධ්‍යයනය මෙහිදී පුළුල් ලෙස අදහස් කෙරේ. මේ යටතේ සුනිසි මෙහෙවර හා එහි සංරචකයන් පිළිබඳ සාමාන්‍ය දැනුවත් බව, ප්‍රායෝගිකව යෙදෙන සුනිසි මෙහෙවර සංකල්ප ගණන හා එම සංකල්ප කොතෙක් දුරට අවිධිමත් අංශය තුළ ක්‍රියාත්මක වේද යන්න මෙහිදී පුළුල් ලෙස අධ්‍යයනය කෙරේ.

මෙම අධ්‍යයනය විශ්වවිද්‍යාලයක වෘත්තීය පර්යේෂණ කණ්ඩායමක් මගින් සිදු කරවා ගැනීමට අපේක්ෂා කළ ද, ඒ සඳහා ලංසුකරුවන් ඉදිරිපත් නොවීම හේතුවෙන් දෙපාර්තමේන්තු නිලධාරීන් විසින් දත්ත රැස් කරන ලදි. පර්යේෂණය මහාචාර්ය සුනිල් චන්ද්‍රසිරි මහතාගේ අධීක්ෂණය යටතේ සිදුකළ අතර, අවසන් වාර්තාව සකස් කරමින් පවතී.

- **ශ්‍රී ලංකාවේ ආබාධිත ප්‍රජාවගේ රැකියා යෝග්‍යතාවය පිළිබඳ අධ්‍යයනය**

මිලියන 20.3 ක් පමණ වන ශ්‍රී ලාංකික ජනගහනයෙන් 10% ක් පමණ කුමන හෝ ආබාධිතතාවයකින් පෙළෙන බව ඇස්තමේන්තු ගත වේ. ආබාධිත ස්වභාවය අනුව පුද්ගලයින් විවිධ වන අතර ඔවුන් අතුරින් සේවා නියුක්ත කළ හැකි ප්‍රතිශතයක් හඳුනාගත හැකි වේ. ඔවුන් සේවා නියුක්ත කර ගත හැකි වේ නම් එම පිරිස රැකබලා ගැනිම පිණිස වැය වන පිරිවැය අවම කරගත හැකි වන අතර, ජාතික නිෂ්පාදනයට ඔවුන් දායක කර ගත හැකිය. ජාතික ආර්ථිකයට ආබාධිත පිරිස රැකබලා ගැනීම පිණිස යොදවන වියදම් ද අවම කළ හැකිය.

එබැවින් මෙම නියමු අධ්‍යයනය මඟින් ගම්පහ දිස්ත්‍රික්කයේ අහඹු නියැදියක් තෝරාගෙන සමීක්ෂණයක් සිදු කොට රැකියා සඳහා ආකල්ප සහ යෝග්‍යතාවය හා පුහුණු අවශ්‍යතා පිළිබඳවද ආබාධිත ප්‍රජාව පාදක කරගෙන තොරතුරු ලබා ගෙන වාර්තා කිරීමට නියමිතය. මෙම අධ්‍යයනය දෙපාර්තමේන්තු නිලධාරීන් මඟින් සිදු කළ අතර සමීක්ෂණය අවසන් කර අවසන් වාර්තාව සකස් කර ඇත.

- **පුවත්පත් වල පුරප්පාඩු විශ්ලේෂණය**

දෙපාර්තමේන්තුවේ මහජන රැකියා සේවය මඟින් අගෝස්තු මස සිට රැස්කර සියලුම දිස්ත්‍රික්ක රැකියා සේවා මධ්‍යස්ථාන වෙත රැකියා ගැලපිම සඳහා බෙදා හැරෙන පුරප්පාඩු පිළිගත් සම්මත ක්‍රමවේදයකට අනුව වර්ගීකරණය කරනු ලැබේ. මෙම තොරතුරු විශ්ලේෂණය කර ශ්‍රම වෙළඳපොළ නැම්යාවන් එනම් ඉල්ලුම් නැම්යාවන් පිළිබඳව තොරතුරු සම්පාදනය කිරීමට හා වාර්තාකරණයට සැලසුම් කෙරේ. මෙහි වාර්තාව සකස් කර ඇත.

- **මහජන රැකියා සේවා ප්‍රවර්ධනය හා කාර්යක්ෂම කිරීම සඳහා රැකියා ගැලපීම පිළිබඳ තොරතුරු රැස් කිරීම**

මිනිස්බල හා රැකිරක්ෂා දෙපාර්තමේන්තුවේ මහජන රැකියා සේවා මධ්‍යස්ථානය විසින් සේවා යෝජකයින්ට හා රැකියා අපේක්ෂිතයන්ට සපයනු ලබන සේවාවන් උපරිම කාර්යක්ෂමතාවයකින් සැපයීමට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ ශ්‍රම වෙළඳපොල තොරතුරු හා පර්යේෂණ ඒකකය මගින් අප ආයතනයට ලැබෙන පුරප්පාඩු, රැකියා අපේක්ෂිතයන් බලාපොරොත්තු වන රැකියා හා ඒ පිළිබඳ ඔවුනගේ ආකල්ප පිළිබඳ අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂිතය.

## 2.3.4. වෙනත් විශේෂ වැඩසටහන්

- **උසස් පෙළ සිසුන් සඳහා වැඩලෝකයට නිපුණත්වයෙන් යුතුව පිවිසීම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම**

ශ්‍රී ලංකාවේ පාසල් අධ්‍යාපන පද්ධතිය තුළ උසස් පෙළ හැදෑරීමෙන් අනතුරුව රජයේ විශ්ව විද්‍යාල වලට තේරී පත් වන්නේ ඉතා කුඩා ප්‍රතිශතයකි. වාර්ෂිකව දරුවන් 120,000 ක ප්‍රමාණයක් කිසිදු කුසලතා සංවර්ධනයකින් තොරව වැඩ ලෝකයට පිවිසේ. විශේෂයෙන්ම වෘත්තීය අධ්‍යාපනය සඳහා යොමු වීම විභාගය අසමත් වීම නිසා තීරණය කරන දෙයක් නොවිය යුතුය. නමුත් පාසල් අධ්‍යාපනය ලබන කාලය තුලදී නිපුණතාවයන් සහිතව වැඩ ලෝකයට සම්බන්ධවීමේ වැදගත්කම අවබෝධ කරවන්නේ නම් පාසල් අධ්‍යාපනයෙන් පසු උසස් අධ්‍යාපනයට සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය පාඨමාලාවක් තෝරා ගැනීමට පෙළඹවීමක් ඇතිවනු ඇත.

2023 වර්ෂයේදී මෙහි නියමු ව්‍යාපෘති කිහිපයක් උතුරු නැගෙනහිර ප්‍රදේශයන්හි ක්‍රියාත්මක කල අතර, සහභාගී වූ සිසුන්ගෙන් ලද අදහස් විශ්ලේෂණයේදී ඔවුන්ගෙන් බහුතරයකට වෘත්තීය පුහුණු අවස්ථා පිළිබඳව ප්‍රමාණාත්මක

දැනුමක් නොතිබුණු බව අනාවරණය විය. ඒ අනුව අ.පො.ස. උසස්පෙළ සිසුන්ට ප්‍රායෝගිකව වැඩ ලෝකයට පිවිසීමට ප්‍රථම වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමේ වැදගත්කම අවබෝධ කරදීම අරමුණු කර ගනිමින් මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව දිස්ත්‍රික් මට්ටමින් මෙම වැඩසටහන් 23 ක් 2024 වර්ෂය තුල සිදු කළ අතර, ප්‍රතිලාභීන් ගණන 1,692කි.

- **ශ්‍රී ලංකාවේ රැකියාවක, අධ්‍යාපන කටයුත්තක හෝ පුහුණුවක නිරත නොවන තරුණ ජනගහනය සක්‍රීය ශ්‍රම බලකායට එකතුකර ගැනීම (NEET) සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.**

ශ්‍රී ලංකාවේ රැකියාවක, අධ්‍යාපන කටයුත්තක හෝ පුහුණුවක නිරත නොවන තරුණ ජනගහනය සක්‍රීය ශ්‍රම බලකායට එකතුකර ගැනීම අරමුණු කරගනිමින් දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිදි සමීක්ෂණය කිරීමෙන් ප්‍රතිලාභීන් 3528 දෙනෙක් හඳුනාගෙන ඇත. එම ප්‍රතිලාභීන් සක්‍රිය ශ්‍රම බලකායට එකතු කිරීම මගින් ඵලදායි ශ්‍රමික පිරිසක් බිහි කිරීමේ අරමුණින් මෙම වැඩසටහන් 6ක් ක්‍රියාත්මක කල අතර, ප්‍රතිලාභීන් ගණන 304 කි.

- **තරුණ ප්‍රජාව සවිබලගැන්වීමේ (Youth Empowerment) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

අනාගත අභියෝගවලට ඵලදායි ලෙස මුහුණ දීම සඳහා නායකත්වයෙන්, නිර්මාණශීලිත්වයෙන් හෙබි ශක්තිමත් තරුණ කණ්ඩායමක් සෑම ග්‍රාමයකම පිහිටුවීම තුළින් ශ්‍රී ලංකාවේ සේවා වියුක්ති පරතරය අවම කිරීම සඳහා මෙම වැඩසටහන සිදු කෙරේ. දෙදිනක් පුරාවට පැවැත්වෙන වැඩසටහනේදී පළමු දින තුලදී මෙම තරුණ තරුණියන් හට අනාගතය පිළිබඳ සුභවාදී ආකල්ප ඇති කිරීම වැඩලෝකයට ප්‍රවේශ වීමට ස්වයං අභිප්‍රේරණයක් ඇති කිරීම සහ වැඩලෝකය පිළිබඳ අවබෝධයක් ලබා දීම සිදු කරන අතර, දෙවන දිනයේදී මෙම තරුණ තරුණියන්ට වැඩලෝකය පිළිබඳ සජීවී අත්දැකීම් ලබා දීම අරමුණු කර ගනිමින් ජාත්‍යන්තර/ ජාතික වශයෙන් පිළිගත් ආයතන නිරීක්ෂණය කිරීම සඳහා අවස්ථාව සලසා ඇත. මෙම වර්ෂය තුල වැඩසටහන් 97 ක් පැවැත්වූ අතර එහි ප්‍රතිලාභීන් ගණන 3,609කි.

- **ආබාධ සහිත පුද්ගලයන් රැකියාගත කිරීම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

සමාජ සේවා දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව ආබාධ සහිත පුද්ගලයන් රැකියාගත කිරීම ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය හරහා ආබාධ සහිත පුද්ගලයන් රැකියා සඳහා යොමු කිරීම මෙහිදී සිදුවේ. මෙම වර්ෂය තුල වැඩසටහන් 8 ක් පැවැත්වූ අතර, එහි ප්‍රතිලාභීන් ගණන 309කි.

- **රැකියා නිර්මාණ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම**

නව රැකියා අවස්ථා උත්පාදනය අරමුණු කර ගනිමින් දිවයිනේ දිස්ත්‍රික්ක සඳහා ආවේණික අවශ්‍යතා හඳුනා ගනිමින් එක් ක්ෂේත්‍රයක් (අපනයන ක්ෂේත්‍රය, දේශීය වෙළඳපොළ නිෂ්පාදන, ධීවර , ඩිජිටල් අලවිකරණය වැනි ක්ෂේත්‍ර) තෝරා ගෙන තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට කැමැත්තක් දක්වන තරුණ තරුණියන් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරිනි. මෙම වර්ෂය තුල වැඩසටහන් 25 ක් පැවැත්වූ අතර එහි ප්‍රතිලාභීන් ගණන 792කි.

- **ඩිජිටල් ව්‍යවසායකත්වය හා නිපුණතා සංවර්ධන (Digital Entrepreneurship and Skills Development) වැඩසටහන**


රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා සුදුසුකම් සහිත තරුණ තරුණියන් සඳහා Digital Marketing, online Marketing, E commerce වැනි Marketing Platform හඳුන්වා දීම හා දැනුම වර්ධනය කිරීම මෙම වැඩසටහන තුලින් සිදු කෙරිණි. මෙම වර්ෂය තුල වැඩසටහන් 6 ක් පැවැත්වූ අතර, එහි ප්‍රතිලාභීන් ගණන 224කි. 2025 වර්ෂයේදී දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණ වන පරිදි මෙම වැඩසටහන සිදු කිරීමට අපේක්ෂිතය.

### 2.3.5. මූල්‍ය ප්‍රගතිය


**වගුව 2.23** – 2024.12.31 දිනට පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්

| අයිතමය | 2024 අයවැය ප්‍රතිපාදනය (රු.මි) | අමතර ප්‍රතිපාදන (රු.මි) | FR | 2024 මුළු ප්‍රතිපාදන (රු.මි) | වියදම (රු.මි) | ඉතිරි ප්‍රතිපාදනය (රු.මි) | ප්‍රතිශතය (%) |
|---|---|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | 573.000 | 25.640 | (5.725) | 592.915 | 580.091 | 12.824 | 97% |
| ප්‍රාග්ධන වියදම්(1+2) | 24.000 | - | 5.725 | 29.725 | 19.829 | 9.896 | 66% |
| 1.සංවර්ධන | 16.000 | - | | 16.000 | 9.612 | 6.388 | 60% |
| 2.වෙනත් | 8.000 | - | 5.725 | 13.725 | 10.217 | 3.508 | 74% |
| එකතුව | 597.000 | 25.640 | | 622.640 | 599.920 | 22.720 | 96% |

**ප්‍රස්තාරය 2.5** - අයවැය ප්‍රතිපාදන හා වියදම් - මි. හා රු.දෙ.




**ප්‍රස්තාරය 2.6** - සංවර්ධන හා වෙනත් වියදම් - මි. හා රු.දෙ.



## 2.4. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

### 2.4.1. කම්කරු නීතිය, කාර්මික සබඳතා සහ මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අධ්‍යාපනය

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය සිය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කම්කරු නීතිය හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය සහ වැඩබිම් ඵලදායීතාව යන ප්‍රධාන විෂය ක්ෂේත්‍රයන් තුන ඔස්සේ පාඨමාලා පවත්වනු ලබයි.

එසේම එම පාඨමාලා භාෂා ත්‍රිත්වයෙන්ම ගුණාත්මක සේවාවක් ලෙස රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශයේ සේවාලාභීන් වෙත ලබා දීමට ආයතනය මේ වනවිට කටයුතු කරනු ලැබේ. ඩිප්ලෝමා හා කෙටිකාලීන පාඨමාලා, සහතික පත්‍ර, පුහුණු වැඩමුළු වශයෙන් මෙම පාඨමාලා පැවැත්වේ

- **ඩිප්ලෝමා පාඨමාලා**

**වගුව 2.24 -** දිගුකාලීන පුහුණු වැඩසටහන් යටතේ පැවැත් වූ ඩිප්ලෝමා පාඨමාලාවන් පිළිබඳ විස්තර

| | **ඩිප්ලෝමා නාමය** | **පාඨමාලා ගණන** |
|---|---|---|
| 1 | කාර්මික සබඳතා හා කම්කරු නිතී - සිංහල මාධ්‍යය | 1 |
| 2 | කාර්මික සබඳතා හා කම්කරු නිතී - ඉංග්‍රීසි මාධ්‍යය | 1 |
| 3 | මානව සම්පත් කළමනාකරණය - සිංහල මාධ්‍යය | 1 |
| 4 | මානව සම්පත් කළමනාකරණය - දෙමළ මාධ්‍යය | 2 |
| 5 | රාජ්‍ය ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් පරිපාලනය | 1 |
| 6 | සේවාස්ථාන ඵලදායිතාවය පිළිබඳ වෘත්තිය ඩිප්ලෝමාව | 2 |
| 7 | කම්කරු නීති පිළිබඳ ප්‍රයෝගික යෙදුම් ඩිප්ලෝමාව | 1 |
| | **එකතුව** | **09** |

- **සහතිකපත්‍ර පාඨමාලා**

රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීමේ අරමුණින් කම්කරු නීති හා කාර්මික සබඳතා, මානව සම්පත් කළමනාකරණය, කාර්යාල කළමනාකරණය, ප්‍රසම්පාදනය, අභ්‍යන්තර විගණනය, ඉංග්‍රීසි, සිංහල හා දමිළ භාෂාවන් ආවරණය වන පරිදි එක් එක් විෂය ක්ෂේත්‍රයට අදාළව දින දහයක සහතිකපත්‍ර පාඨමාලා සහ උසස් සහතිකපත්‍ර පාඨමාලා පවත්වයි. 2024 වර්ෂයේ පාඨමාලා 30ක් ක්‍රියාත්මක කර ඇත.

**වගුව 2.25** – සහතිකපත්‍ර පාඨමාලාවන් පිළිබඳ විස්තර

| **සහතිකපත්‍ර පාඨමාලා නාමය** | **පැවැත් වූ පාඨමාලා ගණන** |
|---|---|
| ශ්‍රම සංක්‍රමණය හා සාමාන්‍ය පරිපාලනය | 21 |
| කාර්මික සබඳතා හා කම්කරු නීතිය | 4 |
| මානව සම්පත් කළමනාකරණය | 1 |
| රාජ්‍ය ප්‍රසම්පාදනය | 1 |
| කාර්යාල කළමනාකරණය | 1 |
| සෞඛ්‍ය කළමනාකරණය | 2 |
| **එකතුව** | **30** |

- **කෙටිකාලීන පුහුණු පාඨමාලා**

ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය එක්දින, දෙදින,තෙදින, සහ පස්දින ආදී වශයෙන් වූ කෙටිකාලීන පාඨමාලා එම ආයතනයේ පුහුණු මධ්‍යස්ථායේදී වැඩසටහන් පවත්වනු ලැබේ. මේ අනුව පාඨමාලා 43ක් ද 2024 වර්ෂය තුළ පවත්වා ඇත

**වගුව 2.26 -** සහතිකපත්‍ර පාඨමාලාවන් පිළිබඳ විස්තර

| **පාඨමාලා නාමය** | **පැවැත් වූ පාඨමාලා ගණන** |
|---|---|
| කාර්යාල කළමනාකරණය | 24 |
| කාර්මික සබඳතා හා කම්කරු නීතිය | 8 |
| රාජ්‍ය ප්‍රසම්පාදනය | 1 |
| පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන් | 1 |
| මෘදු කුසලතා සංවර්ධනය | 2 |
| ධාරිතා සංවර්ධනය | 7 |
| **එකතුව** | **43** |

- **සේවාලාභී ආයතනයන්හි ඉල්ලීම පරිදි සිදුකරන ලද පාඨමාලා**

විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩල විසින් එම ආයතනික අවශ්‍යතාවයන් ට ගැලපෙන පුහුණු පාඨමාලාවක් සකස් කරන මෙන් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන සුවිශේෂී පාඨමාලා අන්තර්ගතයක් සහිතව, එම ආයතන වෙත ගොස් පුහුණු පාඨමාලා පැවැත්වීම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව 2024 වර්ෂයේ දී පුහුණු වැඩසටහන් 25ක් යටතේ 1018 ක පිරිසක් පුහුණු කර ඇත.

**වගුව 2.27 -** සේවාලාභී ආයතනයන්හි ඉල්ලීම පරිදි සිදුකරන ලද පාඨමාලා පිළිබඳ විස්තර

| **වැඩසටහන් නාමය** | **වැඩසටහන් ගණන** |
|---|---|
| කාර්යාල කළමනාකරණය | 9 |
| කාර්මික සබඳතා හා කම්කරු නීතිය/ මානව සම්පත් කළමනාකරණය | 3 |
| කණ්ඩායම් ක්‍රියාකාරකම් හා සේවක අභිප්‍රේරණය | 2 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පුහුණු වැඩසටහන් | 11 |
| **එකතුව** | **25** |

- **සේවා සහ ආයතනික අවශ්‍යතා මත විභාග පැවැත්වීම**

රාජ්‍ය අංශයේ සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතනයන්හි මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනයන්හි ඉල්ලීම් මත විභාග පැවැත්වීමේ කාර්යභාරය වසර ගණනාවක සිට ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය මඟින් සිදුකරනු ලබයි. මේ යටතේ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් විභාග, කාර්යක්ෂමතා කඩඉම් විභාග, ඇගයීම් සහ සේවා උසස් කිරීම් සඳහා වූ විභාග ආයතනික අවශ්‍යතාව මත පවත්වනු ලබයි. තවද ආයතනයේ පවත්වන ඩිප්ලෝමා පාඨමාලාවන් හා සහතිකපත්‍ර පාඨමාලාවන්ට අදාළ විභාගයන් ද පවත්වන අතර මෙම විභාගවල රහස්‍යභාවය ආරක්ෂා කර ගනිමින් වෘත්තීමය භාවයකින් යුක්තව පැවැත්වීමටත්, සේවාලාභීන්ට කඩිනම් සේවයක් ලබා දීමත් සිදු කෙරේ

**වගුව 2.28 -** පැවැත්වූ විභාග පිළිබඳ විස්තර

| **වැඩසටහන් නාමය** | **විභාග ගණන** | **අයදුම්කරුවන් ගණන** |
|---|---|---|
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 26 | 656 |
| බඳවාගැනීමේ විභාගය | 3 | 779 |
| **එකතුව** | **29** | **1435** |

## 2.4.2. මූල්‍ය ප්‍රගතිය

2024 වර්ෂය තුළ ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ මූල්‍ය ප්‍රගතිය පහත පරිදි වේ.

**වගුව 2.29 -** මූල්‍ය ප්‍රගතිය

| | **වාර්ෂික අයවැය (රු.)** | **මාසික අයවැය(රු.)** | **4 වන කාර්තුවේ අයවැය 2024.11.30 (රු.)** | **4 වන කාර්තුවේ සත්‍ය වශයෙන් දරන ලද 2024.11.30 (රු.)** |
|---|---|---|---|---|
| ***ආදායම*** | | | | |
| පුහුණුව | 60,800,000.00 | 5,066,666.67 | 55,733,333.33 | 53,423,300.85 |
| විභාග | 10,000,000.00 | 833,333.33 | 9,166,666.67 | 4,419,536.25 |

| | | | | |
|---|---|---|---|---|
| ස්ථාවර තැන්පතු | 11,000,000.00 | 916,666.67 | 10,083,333.33 | 9,218,729.62 |
| **එකතුව** | **81,800,000.00** | **6,816,666.67** | **74,983,333.33** | **67,061,566.72** |
| | | | | |
| ***වියදම*** | | | | |
| පුද්ගල පඩි නඩි | 18,758,525.00 | 1,563,210.42 | 17,195,314.58 | 17,022,760.00 |
| වැඩසටහන් ක්‍රියාකාරකම් | 21,000,000.00 | 1,750,000.00 | 19,250,000.00 | 23,360,405.04 |
| ගමන් වියදම් | 750,000.00 | 62,500.00 | 687,500.00 | 486,742.34 |
| සැපයුම් සහ පරිභෝජන අයිතම | 5,000,000.00 | 416,666.67 | 4,583,333.33 | 3,092,035.11 |
| නඩත්තු | 4,800,000.00 | 400,000.00 | 4,400,000.00 | 4,488,190.84 |
| කොන්ත්‍රාත් සේවා | 6,800,000.00 | 566,666.67 | 6,233,333.33 | 6,782,522.69 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 2,959,000.00 | 246,583.33 | 2,712,416.67 | 2,330,530.50 |
| | **60,067,525.00** | **5,005,627.08** | **55,061,897.92** | **57,563,186.52** |
| **අතිරික්තය/ (හිඟය)** | **21,732,475.00** | **1,811,039.58** | **19,921,435.42** | **9,498,380.20** |

## 2.5. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

### 2.5.1.වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය වැඩිදියුණු කිරීම

සේවා ස්ථානවල දී සේවකයින්ට සිදුවන වෘත්තීය අනතුරු අවම කිරීම සඳහා සිය කාර්යභාරය ඉටු කරන ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය (NIOSH) වෘත්තීය සුරක්ෂිතතා නිලධාරීන් පුහුණුව සඳහා ඩිප්ලෝමා පාඨමාලා, සහතික පත්‍ර පාඨමාලා සහ වෘත්තීය සුරක්ෂිතතාවය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වන වෙනත් පාඨමාලා පවත්වනු ලබයි. එසේම වැඩ බිමෙහි ආරක්ෂාව හා සෞඛ්‍ය වෙනුවෙන් පාරිසරික මිනුම් ලබා ගන්නා අතර, අවදානම් හඳුනා ගැනීම සඳහා ඇගයීම් සිදුකරනු ලබයි. මෙම ආයතනය විසින් සිදු කරන ලද වැඩසටහන් සහ ඒවායෙහි ප්‍රගතිය පහත පරිදි වේ.

- **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ඩිප්ලෝමා පාඨමාලාව (සිංහල/ ඉංග්‍රීසි මාධ්‍ය)**

ශ්‍රී ලංකාව තුළ සුරක්ෂිත වැඩබිම් බිහිකරවීමේ අරමුණින් ඒ සඳහා අවශ්‍ය මානව සම්පත වන සුරක්ෂිතතා නිළධාරීන් බිහි කිරීමේ ජාතික වගකීම ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සිදුකරනු ලබයි. එහිදී සෞඛ්‍ය හා සුරක්ෂිතතා නිලධාරීන්ට අවශ්‍ය න්‍යායාත්මක දැනුම දේශන තුළින් ඔවුන් වෙත ලබා දෙන අතර, අවශ්‍ය ප්‍රායෝගික දැනුම වැඩබිම් වෙත ගොස් ඔවුන් වෙත ලබා දීමට නිරන්තරයෙන් ආයතනය කටයුතු කරනු ලැබේ. එමෙන්ම ඇගයීම් වාර්තා, ඉදිරිපත්කිරීම් ආදිය තුළින් හා විභාග තුළින් ඔවුන්ගේ දැනුම පරීක්ෂාවට ලක්කර සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත ඩිප්ලෝමා සහතිකපත් පිරිනමනු ලැබේ. සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය දෙකෙන්ම මෙම පාඨමාලාව ක්‍රියාත්මක වන අතර, එය සාර්ථකව නිමකළ සිසුන් දේශීය හා විදේශීය රටවල සේවා නියුක්තව සිටි.

**වගුව 2.30** - වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලා පිළිබඳ තොරතුරු (සිංහල/ ඉංග්‍රීසි මාධ්‍ය)

| **කණ්ඩායම** | **ඇස්තමේන්තු ගත මුදල (රු.මි)** | **කාල සීමාව** | **පාඨමාලාව තුළින් අපේක්ෂිත මුල්‍ය ඉලක්කය (රු. මි.)** |
|---|---|---|---|
| **සිංහල මාධ්‍ය** | | | |
| කණ්ඩායම් 04 | 3.56 | 2024 ජුනි - 2025 ජුනි | 1.46 |
| **ඉංග්‍රීසි මාධ්‍ය** | | | |
| කණ්ඩායම් 26 | 4.31 | 2023 ඔක්තෝම්බර් - 2024 වර්ෂයේ ඔක්තෝම්බර් | 6.29 |
| කණ්ඩායම් 27 | 7.45 | 2024 මැයි - 2025 මැයි | 2.33 |
| කණ්ඩායම් 28 | 6.29 | 2024 සැප්තැම්බර් - 2025 අගොස්තු | 2.33 |

- **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව (ඉංග්‍රීසි මාධ්‍ය)**

ඩිප්ලෝමා පාඨමාලාව සාර්ථකව නිම කළ සිසුන්ගේ වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳව දැනුම වැඩිදියුණු කිරීම සඳහා සහ අදාල ක්ෂේත්‍රය තුල විශේෂඥ දැනුම ලබා දීම සඳහා මෙම උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාව හඳුන්වාදෙන ලදී. මෙහි පළමු කණ්ඩායම සඳහා වන පාඨමාලාව 2023 වසරේ ආරම්භ කරන ලද අතර, එය 2024වර්ෂයේ මාර්තු මාසයේ දී අවසන් කර ඇත.

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව (සිංහල මාධ්‍ය)**

2024 වර්ෂයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සහතිකපත්‍ර පාඨමාලා තුනක් පවත්වන ලදී. 2024 වර්ෂයේදී ආරම්භ කරන ලද 52, 53, 54 හා 55 වන කණ්ඩායම් සහතික පත්‍ර පාඨමාලාව සම්පූර්ණ කර ඇත. සේවා ස්ථානවල සිදුවන වෘත්තීය අනතුරු අවදානම අවම කර ගැනීමට මෙම පාඨමාලාව පිටුවහලක් වී ඇත. මෙම පාඨමාලාව තුළින් දේශීය සමගම් හා බහුජාතික සමාගම් සඳහා අවශ්‍ය වන වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය නිලධාරීන් බිහිකරනු ලබන අතර පුහුණුව ලත් පුහුණු නිළධාරින් බොහොමයක් කර්මාන්ත ආශ්‍රිතව සේවයෙහි නිරතව සිටී. මෙම ආයතන මඟින් පුහුණුව ලත් නිළධාරින්ගේ කැපවීම හා දැනුම ඔවුන් සේවය කරන ආයතන තුල වෘත්තීය සුරක්ෂිතතා පරිසරයක් නිර්මාණය කර ගැනීමට මහගු පිටුවහලක් වී ඇත. වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ උනන්දුවක් දක්වන අ.පො.ස. උසස් පෙළ සමත් ඕනෑම අයෙකුට මෙම පාඨමාලාව හැදෑරීමේ හැකියාව පවතී.

**වගුව 2.31** - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (සිංහල)

| **කණ්ඩායම** | **ඇස්තමේන්තු ගත මුදල (රු.මි.)** | **කාල සීමාව** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** |
|---|---|---|---|
| කණ්ඩායම් 52 | 2.00 | 2024 ජනවාරි - 2024 ජුනි | 1.49 |
| කණ්ඩායම් 53 | 1.80 | 2024 පෙබරවාරි - 2024 අප්‍රේල් | 1.54 |
| කණ්ඩායම් 54 | 1.85 | 2024 ජුනි - 2024 සැප්තැම්බර් | 1.39 |
| කණ්ඩායම් 55 | 2.06 | 2024 ජුලි - 2024 ඔක්තෝම්බර් | 1.44 |

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ පදනම් පාඨමාලාව**

වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍යය පිළිබඳ උනන්දුවක් දක්වන පිරිස උදෙසා මෙම පාඨමාලාව සකස්කර ඇත. මෙය සාර්ථකව අවසන් කරන පිරිස ආයතන වෙත අන්තර්ග්‍රහනය කිරීමද ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනය විසින්ම සිදු කරනු ලබයි. සාමාන්‍ය පෙළ හා උසස් පෙළ අවසන් පාසල් හැර යන සිසුන් රැකියාගත කිරීම සඳහා හා වෘත්තීය සුරක්ෂිතතා ක්ෂේත්‍රය සඳහා යොමු කිරීම මෙහි අරමුණයි.

**වගුව 2.32** - ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පිළිබඳ පදනම් පාඨමාලාව

| **කණ්ඩායම** | **ඇස්තමේන්තු ගත මුදල (රු.මි.)** | **භෞතික ප්‍රගතිය** | **මූල්‍ය ප්‍රගතිය (රු.මි.)** |
|---|---|---|---|
| කණ්ඩායම් 10 | 0.21 | 2024 අගෝස්තු - 2024 නොවැම්බර් | 0.23 |

- **විධායක ශ්‍රේණි නිලධාරීන් සඳහා වන පාරිසරික කළමනාකරණය පිළිබඳ පාඨමාලාව**

මෙම පාඨමාලාව 2020 වර්ෂයේදී මුල්වරට ආරම්භ කරනු ලැබුවේ ආයතනය තුළ සේවයේ නියුතු කලමණාකාරිත්වය අරමුණු කර ගෙනය. මේ වනවිට 3 වන කණ්ඩායම සඳහා පාඨමාලාව ආරම්භ කර ඇත.

**වගුව 2.33** - විධායක ශ්‍රේණි නිළධාරීන් සඳහා වන පාරිසරික කළමනාකරණය පිළිබඳ පාඨමාලාව

| කණ්ඩායම | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය(රු.මි.) |
|---|---|---|---|
| කණ්ඩායම් 03 | 0.65 | විධායක ශ්‍රේණි නිළධාරීන් 18 දෙනෙකු විසින් සාර්ථකව නිම කර ඇත. | 0.83 |

- **වෙනත් පුහුණු වැඩසටහන්**

**වගුව 2.34** - විශේෂ වැඩසටහන් පැවැත්වීමේ ප්‍රගතිය

| වැඩසටහන | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) |
|---|---|---|---|
| Surado කැම්පස් ආයතනය විසින් පවත්වනු ලබන Care Givers පාඨමාලාව අදාළ වෘත්තීය සුරක්ෂිතතා හා ආරක්ෂාව පිළිබඳව විෂය පථය ආවරණය කිරීම. | 2.66 | සිසුන් 330ක් පාඨමාලාව සාර්ථකව නිම කර ඇත | 2.6 |
| රෝහල් හෙද කාර්ය මණ්ඩලය සඳහා වෘත්තීය සුරක්ෂිතතාව සහ සෞඛ්‍යය පිළිබඳ තෙදින වැඩසටහන | 0.48 | හෙදියන් 31 ක් පාඨමාලාව සාර්ථකව නිම කර ඇත | 0.79 |

- **ව්‍යාපෘති**

I. විවිධ වෘත්තීය ක්ෂේත්‍රන් හි නියුතු වෘත්තීය නිළධාරින් සම්බන්ධ කර ගනිමින් ඔවුන්ගේ අදහස් සහ යෝජනා මත ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ප්‍රතිපත්තිය සංවර්ධනය කිරිම 2024 වර්ෂයේ දී සිදු කරන ලදි. මේ සඳහා විවිධ වෘත්තීය ක්ෂේත්‍රයන් හි නියුතු ප්‍රවිණයන් 200 ට නොඅඩු ප්‍රමාණයක් සහභාගී වූ අතර, රේණුකා හෝටල් පරිශ්‍රයේ දි 2024 පෙබරවාරි මස13 සහ 14 යන දෙදින මෙම වැඩසටහන සිදු කරන ලදි.

II. ජාත්‍යන්තර කම්කරු සංවිධානය මගින් සිදුකරනු ලබන ව්‍යාපෘතියක් වන OSH Policy සංවර්ධනය සම්බන්ධයෙන් දැනුවත් කිරිමේ වැඩසටහනක් (National OSH Policy Awareness Program) 2024 වර්ෂයේ ඔක්තෝම්බර් මස ගාල්ල, හැටන්, නුවරඑළිය යන දිස්ත්‍රික්ක වල දී පවත්වන ලදී. මෙම වැඩසටහන දිස්ත්‍රික්ක වල වතු අධිකාරිවරුන්ගේ සහභාගිත්වයෙන්, දිස්ත්‍රික් වතු අධිකාරි කාර්යාලයන්හී දී පවත්වන ලද අතර, ඒ සඳහා වතු අධිකාරිවරුන් 150 ට නොඅඩු පිරිසක් සහභාගි විය.

- **විශේෂ ජයග්‍රහණ**

I. ශ්‍රී ලාංකික සිසුන් සඳහා දකුණු කොරියාවේ චැංසිං විශ්ව විද්‍යාලයේ (Changshin University) සුරක්ෂිතතා ඉංජිනේරු (Safety Engineering) උපාධිය හැදෑරීමට අවශ්‍ය කටයුතු සකස්කර දීමේ ජාතික කර්තව්‍යයට එම විශ්ව විද්‍යාලය හා ගිවිසුම් ගත වීමට 2023 වර්ෂයේ දි හැකියාව ලැබුණු අතර, 2024 වර්ෂයේ දි එහි මූලික පියවර වශයෙන් සිසුන් 25 දෙනෙක් තෝරා ගෙන ඔවුන්ට ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ආයතනයේ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීමට අවස්ථාව ලබා දී ඔවුන් උපාධි පාඨමාලාවට යොමු කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරන ලදි.

II. සුදුසුකම් සපුරාලන ලද ප්‍රථමයෙන් Visa ලබා ගත් සිසුන් හත් දෙනෙකු (07) සඳහා මූලික අවස්ථාව හිමි කරගන්නා ලදි. ඒ තුළින් ශ්‍රී ලාංකික සිසුන්හට E – 7 කාණ්ඩය යටතේ වෘත්තිමය හැකියාව ලබාගැනිමට අවස්ථාව උදාවූ අතර 50% වට්ටමක් සහිතව උපාධි පාඨමාලාව නිම කිරීමට ද එකග වී ඇත. එහිදී ශ්‍රී ලාංකික සිසුන් සඳහා දකුණු කොරියාවේ අවුරුදු 10 ක බලපත්‍ර සහිතව කොරියානු රැකියා අවස්ථාවන් හිමිවීමට නියමිතය.

III. තවද 2024 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ සමත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පාඨමාලාව හදාරන ලද සිසුන් විසිපස්දෙනෙකු (25) සඳහා කොරියාවේ චැංසිං විශ්ව විද්‍යාලයේ (Changshin University) සුරක්ෂිතතා ඉංජිනේරු (Safety Engineering) උපාධිය හැදෑරීමට අවශ්‍ය කටයුතු සකස්කරමින් පවතී.

IV. වැඩබිම තුළ සිදුවන අනතුරු වැළැක්වීමට හා සේවක සේවිකාවන්ගේ සුරක්ෂිත වැඩබිමක් නිර්මාණය කිරීම සඳහා සහතික කරනු ලබන පාරිසරික මිනුම් සමීක්ෂණය සහ අවධානම් තක්සේරු කිරීමේ වැඩසටහන 2025 වර්ෂය පුරාවට සිදුකරනු ලබයි. මීට අමතරව කර්මාන්ත ශාලාවලින් ලැබෙන ඉල්ලුම අනුව ඉදිරියේ දි ආයතනය පුහුණු කිරීම් සිදු කිරීමට නියමිතය. මේ සඳහා සහතික පත්‍රයක් ලබා දෙන අතර, කර්මාන්ත ශාලා සඳහා ජාත්‍යන්තර වෙළඳපලෙහි පිළිගැනීමට ඉන් පිටුවහලක් ලැබේ. එසේ ජාත්‍යන්තර පිළිගැනීම් තුළින් විදේශීය ගැනුම්කරුවන්ගේ ඇණවුම් ලබා ගැනීමට අවස්ථාව උදාවනු ඇත.

## 2.5.2. වෙනත් විශේෂ වැඩසටහන්

- **ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මන්ත්‍රණය 2024**

ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය සැමරීම පදනම් කර ගනිමින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය සම්මන්ත්‍රණය. ගරු කම්කරු අමාත්‍ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා සහ ගරු කම්කරු නියෝජ්‍ය අමාත්‍ය මහින්ද ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2024 වර්ෂයේ නොවැම්බර් 28 වෙනි දින Shangri-La හෝටල් පරිශ්‍රයේ පවත්වන ලදි. මෙම සම්මන්ත්‍රණයේ තේමාව වූයේ " Climate changing" වන අතර මෙම සම්මන්ත්‍රණය සඳහා දෙස් විදෙස් ප්‍රවීණ දේශකයන් රැසකගේ සහභාගීත්වයෙන් දේශන පැවැත්විය.

මෙම සම්මන්ත්‍රණය සඳහා සේවා පාර්ශවයේ නියෝජනය කරමින් ව්‍යාපාර හා කළමනාකරුවන් හා වෘත්තීය සුරක්ෂිතතා නිළධාරින් 500ට නොවැඩි පිරිසක් සහභාගී වූ අතර, වෘත්තීය සුරක්ෂිත හා සෞඛ්‍යමත් මෙන්ම නිරෝගීමත් ශ්‍රම බලකායක් බිහි කිරීම උදෙසා වෘත්තීය සුරක්ෂිතතා සංකල්පය මූලික කරගෙන මෙය පවත්වන ලදි.

- **වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය ඩිප්ලෝමා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2024**

වෘත්තීය සුරක්ෂිතතා නිලධාරින් සඳහා වන ඩිප්ලෝමා හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවය 2024 වර්ෂයේ නොවැම්බර් 28 වෙනි දින Shangri-La හෝටල් පරිශ්‍රයේ දි පවත්වන ලදි.

### 2.5.3. ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ මෙහෙයුම් ආදායම් ප්‍රභවයන් මගින් ලබාගත් මූල්‍ය ප්‍රගතිය

**වගුව 2.35 -** 2024.12.31 දින අවසන් කරන ලද ගිණුම් වාර්තාවන්ට අනුව ප්‍රධාන ආදායම් ප්‍රභවයන් තුළින් අත්කරගත් මූල්‍ය ප්‍රගතිය

| කාර්යය | ආදායම (රු.) |
|---|---:|
| වෛද්‍ය පරීක්ෂණ | 1,861,715,.00 |
| පාරිසරික මිනුම් සමීක්ෂණ | 18,729,602.00 |
| සහතිකපත්‍ර පාඨමාලා හා ඩිප්ලෝමා පාඨමාලා | 34,537,050.00 |
| අනෙකුත් ගිවිසුම් මගින් සේවා සැපයීම | 11,612,500.00 |
| වෙනත් පොලී ආදායම | 31,387,225.00 |
| **එකතුව** | **98,837,356.00** |

## 2.6. කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය

### 2.6.1. වෘත්තීය අනතුරු සඳහා වන්දි ගෙවීම

සේවා නියුක්තියේදී තුවාල ලබන, රැකියාවේ ස්වභාවය හේතුවෙන් රෝගවලට ගොදුරු වන සේවකයන්ට සහ සේවා ස්ථානවල අනතුරු හේතුවෙන් මිය යන ශ්‍රමිකයින්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීමේ කටයුතු කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය මඟින් සිදු කරයි. 2024 වර්ෂය තුළ වාර්තා වූ අනතුරු සහ ඒ වෙනුවෙන් ගෙවීම් කරන ලද වන්දි සම්බන්ධයෙන් වන තොරතුරු පහත පරිදි වේ.

- 2024 වර්ෂයේ ආරම්භ කරන ලද රු.ලක්ෂ 20 හා ඊට වැඩි මුදලක් වන්දි මුදල් ලෙස ගෙවා ඇති ආයතන ගණන හා මුදල.

| ආයතන ගණන | මුදල රු.මි. |
|---|---|
| 14 | 85,790,185.00 |

- 2024 වර්ෂයේ ආරම්භ වී එම වර්ෂයේදීම අවසන් වූ මාරක හා මාරක නොවන නඩු සංඛ්‍යාව
  - උසාවි ගොස් අවසන් වූ නඩු - 86
  - උසාවි නොගොස් කාර්යාල මට්ටමින් අවසන් වූ නඩු - 74
- 2024.01.01 සිට 2024.12.31 දක්වා කාලය තුළ අවසන් කරන ලද නඩු ගොනුවල කාල විශ්ලේෂණය
  - 2024 වර්ෂයේ ආරම්භ කර එම වර්ෂයේම අවසන් කරන ලද නඩු සංඛ්‍යාව - 160
  - පෙර වර්ෂවල නඩු සංඛ්‍යාව - 233

**වගුව 2.36**- 2024.12.31 දිනට පැවති නඩු ගොනු සංඛ්‍යාව

| | |
|---|---|
| 2024.01.01 දිනට උසාවි ගත කිරීමට පැවති නඩු ගොනු සංඛ්‍යාව | 422 |
| 2024.01.01 සිට 2024.12.31 දක්වා ආරම්භ කරන ලද නඩු ගොනු සංඛ්‍යාව ( මාරක - 145 හා මාරක නොවන - 244) - | 389 |
| 2024.12.31 දිනට පවතින මුළු නඩු ගොනු සංඛ්‍යාව | 811 |
| 2024.01.01 සිට 2024.12.31 දක්වා කාලය තුළ අවසන් කරන ලද නඩු ගොනු සංඛ්‍යාව | 418 |
| 2024.12.31 දිනට පවතින නඩු ගොනු සංඛ්‍යාව | 393 |

## 2.7. ශ්‍රම වාසනා අරමුදල

### 2.7.1. සේවක සුභසාධන ප්‍රවර්ධනය

ශ්‍රම වාසනා අරමුදල මඟින් කම්කරු ප්‍රජාවගේ ජීවන තත්ත්වය නංවාලීම සඳහා අක්ෂි කඳවුරු එසේම කම්කරු නීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරි තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයේ පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිද කරන ලදී.

පැවැත්වීම, වෛද්‍ය කඳවුරු පැවැත්වීම, මියගිය සේවකයින්ගේ පවුල්වල පාසල් දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දීම, පාසල් උපකරණ ලබා දීම, ජීවනෝපාය ආධාර සඳහා තාක්ෂණික අධ්‍යාපනය ලබා දීම සහ අනෙකුත් සුභසාධන වැඩසටහන් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි.

- **දැනුවත් කිරීමේ වැඩසටහන්**

ශ්‍රම වාසනා අරමුදල පිහිටුවීමේ මූලික අරමුණ අතර සේවා නියුක්තිකයන්ගේ සුබසාධනය ප්‍රවර්ධනය කිරීම ප්‍රමුඛ වේ. පසුගිය වසර කිහිපය දෙස බලන විට ලංකාවේ සිදුවන කාර්මික අනතුරු වලින් බොහෝ ප්‍රමාණයක් සේවක සේවිකාවන්ගේ නොසැලකිලිමත් බව, ආරක්ෂක උපකරණ භාවිතයට නැඹුරු නොවීම වැනි හේතු තුලින් සිදු වී ඇති බව පැහැදිලි විය.

මෙම හේතු නිසා අනතුරු වැලැක්වීමේ පූර්ව සූදානමක් ලෙස පසුගිය වසර වල අනතුරු වාර්තා වී ඇති හා අවදානම් තත්වයන් ඇති කර්මාන්තශාලා හඳුනාගෙන ආරක්ෂිතව වැඩ කිරීම පිළිබඳ පුහුණු වැඩමුළු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ඒ පිළිබඳව දැනුමක් ඇති ඉංජිනේරුවරුන් මාර්ගයෙන් සිදුකරන ලදී.

එසේම කම්කරු නීති අණපනත් පිළිබඳව සේවක සේවිකාවන් මෙන්ම ආයතන හිමිකරුවන්ට පැන නගින ගැටළුකාරි තත්වයන් පිළිබඳ දැනුවත් කිරීමේ අරමුණින් ක්ෂේත්‍රයේ පළපුරුදු සම්පත් දායකවරුන් මාර්ගයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් සිද කරන ලදී.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉතා සාර්ථක වූ අතර කම්කරු අණපනත් පිළිබඳ සේවක සේවිකාවන් හා සේවා ප්‍රජාව දැනුවත් වූ අතර වෘත්තීය ආරක්ෂාව හා සෞඛ්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් තුලින් කාර්මික අනතුරු අවම කිරීමටත් හැකියාව ඇති විය.

ඉහත ක්ෂේත්‍ර යටතේ 2024 වර්ෂයේ දී දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක ප්‍රමාණයක් මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදු කර ඇති අතර, මේ තුලින් සේවක සේවිකාවන් 1000ක් පමණ සෘජුවම ප්‍රතිලාභ හිමිකර ගන්නා ලදී

- **අධ්‍යාපනික ආධාර වැඩසටහන්**

රට තුළ පවතින ආර්ථික තත්ත්වය හමුවේ ශ්‍රමික පවුල් වෙත සහන සැලසීම අරමුණ කර ගනිමින් ලංකාවේ සියලුම දිස්ත්‍රික්කයන්හි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය වන පරිදි තෝරාගත් අඩු ආදායම්ලාභී ශ්‍රමික පවුල් වල අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් අධ්‍යාපනික ආධාර ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදු කරනු ලබයි.

2024 වර්ෂය තුළ දූ දරුවන් 28,983 දෙනෙකු සඳහා පාසල් උපකරණ කට්ටල ලබාදෙන ලදී.

- **මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන**

ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලා වල සිදුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ බෙලහීනත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

යම් කර්මාන්තශාලාවක, වැඩබිමක හෝ සේවා ස්ථානයක සිදු වන කාර්මික අනතුරු පිළිබඳ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් මාර්ගයෙන් ලබාගන්නා තොරතුරු හා කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය හරහා ලබා ගන්නා තොරතුරු පදනම් කරගෙන ප්‍රතිලාභීන් හඳුනාගැනීම සිදු කරයි. මියගිය හෝ පූර්ණ ආබාධිත තත්වයට පත් වන සේවක සේවිකාවන්ගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් (පෙර පාසල් අධ්‍යාපනයේ සිට විශ්ව විද්‍යාල අධ්‍යාපනය දක්වා එනම් වයස අවු. 3-25 දක්වා) මේ සඳහා සුදුසුකම් ලබන අතර, මෙම දරුවන් සඳහා රු.50,000 ක ඉතිරිකිරීමේ තැන්පතුවක් හා අධ්‍යාපන උපකරණ ලබා දේ.

මේ යටතේ 2024 වර්ෂය තුල ශිෂ්‍යත්වලාභීන් 18 දෙනෙකු වෙත ප්‍රතිලාභ ලබා දීමට හැකි වී ඇත.

- **නීති ආධාර ලබාදීමේ වැඩසටහන**

පෞද්ගලික අංශයේ සේවකයන් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කර ඇති අවස්ථා වලදී, පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දමන අවස්ථාවකදී සහ කම්කරු වන්දි කොමසාරිස් ඉදිරියේ පැමිණිල්ලක් ගොනුකර ඇති අවස්ථාවකදී සේවකයන්ට සහන ලබාදීම වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය තුල ක්‍රියාකාරි සැලැස්ම අනුව වෙන්කර ඇති ප්‍රතිපාදන වලින් සේවකයින් 06 දෙනෙකු සඳහා ප්‍රතිලාභ ලබා දී ඇත.

- **වෛද්‍ය කඳවුරු පැවැත්වීම**

වෘත්තීය රෝගවලට ගොදුරු වූ සේවක සේවිකාවන් වෙනුවෙන් සහන සැලසීම ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු අතර ඇති තවත් එක වැදගත් අරමුණකි. වෘත්තීය රෝගවලට ගොදුරු විය හැකි අවදානම් සහිත පාරිසරික තත්වයන් යටතේ සේවය කරන සේවක සේවිකාවන් අතරින් තෝරාගත් පිරිස් ඉලක්ක කර වෛද්‍ය කඳවුරු පවත්වනු ලැබේ .

සේවක සේවිකාවන්ගේ සෞඛ්‍ය තත්වයන් හා සැබෑ ලෙසම වෘත්තීය රෝගවලට ගොදුරු වූ සේවක සේවිකාවන් හඳුනා ගැනීමත්, ඉදිරියේ දී වෘත්තීය රෝගවලට ගොදුරුවීමේ අවදානමක් ඇති පිරිස් ඉන් මුදවා ගැනීමත් මෙමගින් සිදු කල හැකිය.

**වගුව 2.37-** 2024 වසර තුල පවත්වන ලද වැඩසටහන් වල මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| **වැඩසටහන් වර්ගය** | **භෞතික ප්‍රගතිය** | | **මූල්‍ය ප්‍රගතිය** | | **ප්‍රතිශතය** |
|---|---|---|---|---|---|
| | **පැවැත්වූ වැඩසටහන් ප්‍රමාණය** | **ප්‍රතිලාභින් සංඛ්‍යාව** | **වෙන් කරන ලද මුදල රු.මි** | **වියදම් වූ මුදල රු.මි.** | |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | | | 1.44 | 0.32 | 22% |
| අධ්‍යාපනික ආධාර වැඩසටහන් | | | විශේෂ ව්‍යාපෘතිය - 100 | 66 | 66% |
| | | | සාමාන්‍ය- 12.5 | 6.7 | 54% |
| මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන | | | 5.6 | 1.13 | 20% |
| නීති ආධාර ලබාදීමේ වැඩසටහන | | | 1 | 0.14 | 14% |
| වෛද්‍ය කඳවුරු පැවැත්වීම | | | 0.42 | 0.24 | 58% |
| දැනුවත් කිරීමේ වැඩසටහන් | 19 | 550 | | | |
| අධ්‍යාපනික ආධාර වැඩසටහන් | විශේෂ ව්‍යාපෘතිය - 24 | 28983 | | | |
| | සාමාන්‍ය - 04 | 309 | | | |
| මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන | 1 | 18 | | | |
| නීති ආධාර ලබාදීමේ වැඩසටහන | 1 | 6 | | | |
| වෛද්‍ය කඳවුරු පැවැත්වීම | 1 | 180 | | | |

ශ්‍රම වාසනා අරමුදල සඳහා අරමුදල් අරමුදල් සපයාගනු ලබන්නේ ජාතික ලොතරැයි මණ්ඩලය මගින් අලෙවි ලකී සෙවන් ලොතරැයි ආදායම මගිනි. ඒ අනුව 2024 වර්ෂයේ දී මෙමගින් රු.මි. 56.9 ක ආදායමක් ලබා ඇත.

**සටහන -** මෙම වාර්තාව සකස් කිරීමේදී 2024.11.25 දිනැති අංක 2412/08 දරණ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව කම්කරු අමාත්‍යාංශයට අනුබද්ධිතව පවතින ආයතනයන්ගේ ප්‍රගතිය පමණක් ඇතුලත් කර ඇත.

## 2.8. අමාත්‍යාංශයේ ඉදිරි සැලසුම් සහ වැඩසටහන්

වර්තමාන ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික තත්වයන්ට අනුකූල වන අයුරින් සහ සුනිසි වැඩ පරිසරයක් තුළ සේව්‍ය - සේවක හිතකාමී වාතාවරණයක් ඇති කිරීම උදෙසා නෛතික ප්‍රතිපාදන ඇති කිරීම අමාත්‍යාංශය සතු කාලීන වගකීමකි. ඒ අනුව යහපත් සේව්‍ය - සේවක සම්බන්ධතාවයක් සහිත ඵලදායී ශ්‍රමික ප්‍රජාවක් රට තුළ ඇති කරනු වස් අපරානුමත අන්තර්ජාතික කම්කරු සම්මුතීන්වලට අනුකූල වෙමින් හා රටේ පවතින සමාජ-ආර්ථික ප්‍රවණතා හා අවශ්‍යතා අනුව වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන අයුරින් පවතින කම්කරු අණ පනත්, නීති රීති සංශෝධනය කරනු ලැබේ. වැඩ කරන ජනතාවගේ අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට හා සුබසාධනය තහවුරු කිරීමටද මෙම අමාත්‍යාංශය බැඳී සිටියි. ඒ සඳහා අමාත්‍යාංශය හා ඊට අනුබද්ධිත ආයතන මගින් ඉදිරි සැලසුම් සකස් කිරීමේ දී පහත සඳහන් කරුණු පදනම් කරගෙන ඇත.

- රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්"
- අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර සහ අරමුණු
- 2024/11/25 දිනැති අංක 2412/08 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් අමාත්‍යාංශය වෙත පවරා ඇති කාර්යයන් හා කර්තව්‍යයන්
- අමාත්‍යාංශයේ විෂය පථයට අදාළ තිරසර සංවර්ධන අරමුණු
- කම්කරු ක්ෂේත්‍රයට අදාළ ශ්‍රී ලංකාව එකඟ වී ඇති ජාත්‍යන්තර සම්මුතීන් හා එකඟතාවල ඇතුලත් කරුණු

### 2.8.1. කම්කරු අමාත්‍යාංශය

#### 2.8.1.1. කම්කරු ක්ෂේත්‍රයට අදාළ නීතිමය රාමුව ශක්තිමත් කිරීම

යල්පැන ගිය කම්කරු නීති වර්තමාන වැඩ ලෝකයට ගැලපෙන ආකාරයට සහ පනත් අතර පවතින සංකීර්ණතා ඉවත් කර සරල කොට සියලු පාර්ශවයන්ට ප්‍රතිලාභ සහතික කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මතුව ඇති බව හඳුනාගෙන ඇත.

ඒ අනුව මූලික වශයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව, පනත් අතර පවතින විෂමතා ඉවත් කරමින් නම්‍යශීලී සේවා කොන්දේසි ද ඇතුළත් ව සේවා නියුක්ති පනත් කෙටුම්පතක් සකස් කර ඇත. මෙලෙස සකස් කරන ලද කෙටුම්පත වර්තමාන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වේ ද යන්න නැවත සලකා බැලීම සඳහා කමිටුවකට පවරා ඇති අතර එහි නිර්දේශ මත අවශ්‍ය වෙනස්කම් සහිතව කෙටුම්පත සංශෝධනය කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

ශ්‍රී ලංකාවේ වෘත්තීය ආරක්ෂණ සංස්කෘතියක් ඇති කර සුරක්ෂිත,සෞඛ්‍ය සම්පන්න හා වෘත්තීය අනතුරු අවම වන වැඩ පරිසරයක් ඇති කිරීම සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතන පනත සංශෝධනයට අපේක්ෂා කෙරේ. එමඟින් සෞඛ්‍ය ආරක්ෂිත වැඩ පරිසරයක් තුළ සුරක්ෂිත හා සෞඛ්‍ය සම්පන්න ශ්‍රම බලකායක් ඇති කිරීමට අවශ්‍ය මානව සම්පත ගොඩ නැගීම මෙන්ම ආදායම් උත්පාදන මාර්ගයන් ඇති කිරීමට ද අපේක්ෂිතය.

#### 2.8.1.2. ගෝලීයකරණ හා විවෘත ආර්ථික ප්‍රතිපත්ති තුළ සේව්‍ය සේවක අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම

වර්තමානය වන විට රැකියා වියුක්ති ප්‍රතිලාභ සහ මාතෘත්ව ප්‍රතිලාභ සේවා යෝජකයා විසින් දරනු ලැබේ. මෙම පිළිවෙත රක්ෂණ ක්‍රමවේදයක් කරා ගෙන යාම වැදගත් වන අතර, අමාත්‍යාංශය විසින් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය නීතිමය රාමුව ගොඩනැගීම අඛණ්ඩ ව ක්‍රියාත්මක කෙරෙනු

ඇත. ඊට අමතරව, සේවකයින්ගේ සමාජ ආරක්ෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා පවත්නා ක්‍රමවේදයන් ඵලදායී නොවන බැවින්, පෞද්ගලික අංශය සඳහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් සහ වෘත්තීය අනතුරු සඳහා රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියත්මක කිරීම, සමාජ ආරක්ෂණ ආවරණය අවිධිමත් අංශයට පුළුල් කිරීම පිළිබඳව ද සළකා බලනු ඇත. සමාජ ආරක්ෂණය වැඩිදියුණු කිරීම බොහෝ රාජ්‍ය ආයතන මත රඳා පවතින අතර, මේ සම්බන්ධයෙන් ඔවුන් සමඟ සහසම්බන්ධ වී කටයුතු කිරීමට පියවර ගැනීමෙන් සමාජ ආරක්ෂණ ආවරණය වැඩිදියුණු කිරීම සහ පුළුල් කිරීම අපේක්ෂා කෙරේ.

දශක ගණනාවක් තිස්සේ 31% ක් ලෙස පවතින ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වය ඉහළ නැංවීමට පියවර ගනු ලැබේ. මෙහිදී, කාන්තා සහභාගීත්වය වැඩි දියුණු කිරීම උදෙසා, සේවා ස්ථානයන්හිදී වෙනස් කොට සැළකීම, සේවා ස්ථාන ප්‍රචණ්ඩත්වය සහ නම්‍යශීලී සේවා පරිසරයන් සකස් කිරීමට අදාළ ව අවශ්‍ය නීතිමය විධිවිධාන හඳුන්වාදීමට යෝජිත කම්කරු නීති සංශෝධනයේදි කටයුතු කරනු ලැබේ. මාතෘ ප්‍රතිලාභ ලබා දීමේදී දැනට පවතින සේවා යෝජකයා වගකීමට බර ක්‍රමවේදය ශ්‍රම බලකායේ කාන්තා සහභාගීත්වයට අහිතකර ලෙස බලපාන බැවින්, මාතෘ රක්ෂණ ක්‍රමයක් හඳුන්වාදීම මගින් කාන්තා ශ්‍රම සහභාගීත්වය ඉහළ නැංවීමට ද උපකාරී වනු ඇත.

### 2.8.1.3. සුනිසි මෙහෙවර වැඩසටහන

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහාය ඇතිව, වෘත්තීය සමිති සහ සේවායෝජකයින් සමඟ සාකච්ඡා කර කම්කරු ප්‍රතිපත්ති විධිමත් කිරීම උදෙසා 2025–2030 වසර සඳහා පස් අවුරුදු දේශීය සුනිසි මෙහෙවර වැඩසටහනක් සකස් කිරීමට දැනටමත් පියවර ගෙන ඇත. මීට අමතරව, ධීවර ප්‍රජාව සඳහා සුනිසි මෙහෙවර තත්ත්වයන් වැඩිදියුණු කිරීමට උපකාරී වන ධීවර කටයුතු පිළිබඳ වන C188 සම්මුතිය අපරානුමත කිරීමට අවශ්‍ය පියවර ගනිමින් තිබෙන අතර 2025 වසර අවසානයේ දී නිම කිරීමට අපේක්ෂා කෙරේ.

## 2.8.2. කම්කරු දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකාවේ ඩිජිටල් රාජ්‍යකරණයක් සඳහා අවශ්‍ය ඩිජිටල් පොදු යටිතල පහසුකම් (Digital Public Infrastructure) සංවර්ධනය කිරීම උදෙසා වන රජයේ ප්‍රතිපත්තිවලට අනුකූල වෙමින් සේවාලාභීන් වෙත බාධාවකින් තොරව වඩාත් පහසු සහ කාර්යක්ෂම සේවාවක් සැපයීමට හැකි වන පරිදි කම්කරු දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණ අවශ්‍යතා සුදුසු උපදේශනායතනයක තාක්ෂණික සහය ලබා ගනිමින් හඳුනාගැනීමටත් ඒ අනුව දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලීන් සහ පද්ධතිවල සිදු කල යුතු පර්වර්තනීය වෙනස්කම් ආරම්භ කිරීමටත් සැලසුම් කර ඇත.

එසේම, ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ සහ අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදෙන සේවකයන්ගේ සමාජ ආරක්ෂණය වඩාත් පුළුල් කිරීම සඳහා කටයුතු සිදු කිරීමට ද අපේක්ෂිතය. ඒ අනුව, සේවායෝජක ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම මගින් සහ සේවකයෙකු සේවයට බැඳී දින 30 ක් තුළ සේවක අර්ථසාධක අරමුදලෙහි සාමාජිකයෙකු වශයෙන් ලියාපදිංචි කර ගැනීමේ ක්‍රියාවලිය මගින් සේවකයින්ගේ සමාජ ආරක්ෂණය සහතික කිරීමට අපේක්ෂා කෙරේ. එසේම, සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රමවේදය සේවාලාභීන්ට වඩාත් පහසු සහ සරල කිරීම සඳහා සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ඉල්ලුම් පත්‍රයන්හි සිදු කල යුතු කාලීන සංශෝධනයන් සහ දත්ත පද්ධතිවලට දත්ත ඇතුළත් කිරීම සම්බන්ධයෙන් සිදු කල යුතු සංවර්ධනයන්ද 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. සේවක අර්ථසාධක අරමුදල් 30% පූර්ව ප්‍රතිලාභ සහ නිවාස ණය ලබා ගන්නා සාමාජිකයන් විසින් අවසාන ප්‍රතිලාභ ලබා ගන්නා අවස්ථාව වන විට විශ්‍රාම ප්‍රතිලාභ වශයෙන් භුක්ති විඳීමට ශේෂ වන මුදල ඔවුන්ගේ විශ්‍රාම දිවිය පහසුවෙන් ගත කිරීම සඳහා ප්‍රමාණවත් වේද යන්න තහවුරු කරගැනීම සඳහා අධ්‍යයනයක් කිරීමටද අපේක්ෂා කෙරේ.

වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්බන්ධයෙන් කර්මාන්තශාලාවන්හි

සේවායයන්ගේ සහ සේවකයන්ගේ දැනුම වර්ධනය කිරීම තුළින් කාර්මික අංශයේ සිදු වන අනතුරු සහ සේවකයන්ට වැළදෙන වෘත්තීය ලෙඩරෝග අවම කර ගැනීමේ හැකියාව ලැබේ. ඒ අනුව, අනතුරු සිදු වීමේ වැඩි ඉඩකඩක් පවතින අවිධිමත් අංශයේ රැකියා ක්ෂේත්‍රයන්හි සේවායයන් සහ සේවකයන් ප්‍රමුඛ කර ගනිමින් වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

එක්සත් ජාතීන්ගේ තිරසර අරමුණු අංක 8.7 පරිදි 2025 වර්ෂය වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය තුරන් කිරීමට ශ්‍රී ලංකාව බැඳී සිටී. ඒ අනුව, ළමා ශ්‍රමය සම්බන්ධයෙන් සේවායයන්, සේවකයන්, රාජ්‍ය නිලධාරීන් පමණක් නොව බිම් මට්ටමේ සිට සියලුම මහජනතාව දැනුවත් කිරීම තුළින් ළමා ශ්‍රමය වළක්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා පොලිස් දෙපාර්තමේන්තුවේ ප්‍රජා පොලිස් කමිටු යාන්ත්‍රණය සමඟ සම්බන්ධ වෙමින් අවිධිමත් ක්ෂේත්‍රය තුළ පැවතිය හැකි ළමා ශ්‍රමය හඳුනාගනිමින් යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමටත්, විධිමත් ක්ෂේත්‍රයන්හි ආයතන වල සේවායෝජකයන් වෙතින් සිය ආයතන විසින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමටත්, ළමා ශ්‍රමය පැවතීමේ වැඩි ඉඩකඩක් පවතින සංචාරක ක්ෂේත්‍රය වැනි ක්ෂේත්‍රයන්හි සහ කුඩා හා මධ්‍ය පරිමාණ ආයතනයන්හි ළමා ශ්‍රමය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් සිදු කිරීමටත් අපේක්ෂිතය. එසේම, ළමා ශ්‍රමයට බලපාන හේතු හඳුනා ගැනීම සඳහා කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි ළමා ක්‍රියකාරකම් පිළිබඳව 2024 වර්ෂයේ දී සිදු කරන ලද මූලික අධ්‍යයනය ව්‍යාප්ත කරමින් බස්නාහිර පළාතේ ළමා ක්‍රියාකාරකම් පිළිබඳ අධ්‍යයනයක් 2025 වර්ෂයේ දී සිදු කිරීමට සැලසුම් කර ඇත.

දිවයින පුරා පිහිටි පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවා සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය තහවුරු කෙරෙන සුනිසි වැඩ පරිසරයක් නිර්මාණය කරගනිමින් ආයතනික ඵලදායිතාවය ඉහළ නංවා ගැනීම සඳහා කම්කරු දෙපාර්තමේන්තුව සහය ලබා දෙනු ලබයි.

ඒ අනුව, ආයතනයන්හි සේවා සේවක සම්බන්ධතාවය වර්ධනය සඳහා සමාජ කතිකාව ප්‍රවර්ධනය කිරීම සහ දෙපාර්ශවය තුළ කම්කරු නීති පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා දිවයින පුරා පිහිටි ආයතනයන්හි සේවායයන් සහ සේවකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2025 වර්ෂයේදී ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඕනෑම ආකාරයේ කම්කරු පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබන පුද්ගලයෙකුට එම පැමිණිල්ල, පැමිණිලි කළමනාකරණ පද්ධතිය (Complaint Management System) මගින් මාර්ගගත ක්‍රමය ඔස්සේ පහසුවෙන් කම්කරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමටත් එම පැමිණිල්ල විසඳීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමටත් අවස්ථාව සලසා දී ඇත. ඒ අනුව එම පද්ධතිය තවදුරටත් විධිමත් හා ශක්තිමත් කිරීම සඳහා 2025 වර්ෂයේදී ක්‍රියාමාර්ග ගැනීමට සැලසුම් කර ඇත. මෙමගින් කම්කරු නීති මගින් සේවකයන් වෙත ලැබී ඇති හිමිකම් තහවුරු කිරීමට අපේක්ෂා කෙරේ.

### 2.8.3. මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව

ජාතික මානව සම්පත් හා සේවා නියුක්ති ප්‍රතිපත්තිය සකස් කිරීම, ව්‍යුහාත්මක සේවා වියුක්ති ගැටළු විසඳීම, ශ්‍රම වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් නිවැරදි වෘත්තීය දිශානතිය නිශ්චය කර ගැනීම සඳහා මඟපෙන්වීම, මිනිස්බල සැලසුම් සකස් කිරීම,සංවර්ධනය හා පුරෝකතනය කිරීම සහ අවිධිමත් හා අඩු වරප්‍රසාද සහිත කණ්ඩායම් සංවර්ධනය යන අරමුණු ඉටු කර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාකාරකම් මෙම දෙපාර්තමේන්තුව මගින් 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

- දිස්ත්‍රික් හා ප්‍රාදේශීය රැකියා පොළ පැවැත්වීම තුළින් රැකියා අපේක්ෂිතයින් රැකියාගත කිරීම් සඳහා අවශ්‍ය මඟ පෙන්වීම සිදු කිරීම හා

කුසලතා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් හා සහය ලබා දීමට අපේක්ෂා කෙරේ.

- රැකියා අපේක්ෂිතයින් සහ තෝරා ගත් අවිධිමත් රැකියා ක්ෂේත්‍ර වල නිරත ස්වයං රැකියාලාභීන්ගේ සේවා තත්වයන් (Service Standards) වර්ධනය කිරීමට එනම් රැකියා ගරුත්වය ඇති කිරීමේ වැඩසටහන් සහ නිෂ්පාදනයන් ගුණාත්මක කිරීමට අදාළව ඔවුනට අවශ්‍ය දැනුම සහ පෙළඹුම ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කෙරන අතර ඒ අනුව පුද්ගල කේන්ද්‍රීය වෘත්තීය මාර්ගෝපදේශ ලබා දීම , RPL ක්‍රමවේද හරහා NVQ සහතික ලබා ගැනීම සඳහා යොමු කිරීම, ව්‍යාපාර අංශ ජාලගත වීමට අවශ්‍ය පෙළඹුම ඇති කිරීම සිදු කෙරේ. මෙම වැඩසටහන් ග්‍රාමීය මට්ටමින් කුඩා කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.
- සමස්ථයක් වශයෙන් දෙපාර්තමේන්තුවත් , දෙපාර්තමේන්තුවේ සේවය සපයනු ලබන සේවා යෝජකයන් අතරත් යහපත් සම්බන්ධතාවයක් ඇති කර ගැනීම මගින් සේවා ලබා ගැනීම හා සැපයීම, අනයෝන්‍ය වශයෙන් ප්‍රතිලාභ සලසා ගැනීම මූලික අරමුණ කරගෙන සේවා යෝජක සමුළු පැවැත් වේ. මෙම සමුළු 2025 වර්ෂයේදී පළාත් 9 ආවරණය වන පරිදි පැවැත්වීමට අපේක්ෂිතය
- පාසල් හැර ගිය සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය/ NEET ප්‍රතිලාභීන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය/ ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ලියාපදිංචි වූ රැකියා අපේක්ෂිතයින් අතරින් වෘත්තීය මාර්ගෝපදේශ සේවා ලබා දී ස්වයං රැකියාවක් කිරීමට හෝ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා යෝග්‍ය හැකියාවන් හා ලැදියාවන් සහිත පිරිස තෝරා ගෙන ස්වයං රැකියා පෙළඹුව හා ව්‍යයසායකත්ව පෙළඹුම සඳහා මාර්ගෝපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. NEET group, ආබාධිත පුද්ගලයන්, පාසල් හැර ගිය තරුණ තරුණියන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දී ආදායම් උත්පාදන ක්‍රියාවලීන් සඳහා යොමු කිරීම සිදු කෙරේ.
- රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම යටතේ දෙපාර්තමේන්තුවේ රැකියා පොළ මගින් සහ දිස්ත්‍රික් ලේකම්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචි කරන අතර, එම රැකියා අපේක්ෂිතයන් මාර්ගගතව (Google Form) ලියාපදිංචි කර දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියකට (Google Sheet) ඇතුලත් කර රැකියා සපයන ආයතන හා පවතින පුරප්පාඩු ලියාපදිංචි කොට රැකියා අපේක්ෂිතයින් ඒ අනුව රැකියා සඳහා යොමු කිරීම කරනු ලැබේ. එමෙන්ම ලියාපදිංචි වූ රැකියා අපේක්ෂිතයින් අතරින් රැකියාවකට වඩා වෘත්තීය පුහුණුවක් ලබා ගැනීමට සුදුසු වයස් මට්ටමේ හා හැකියාවෙන් යුතු පිරිස හඳුනාගෙන වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වෙත ඔවුන් සම්බන්ධීකරණය කිරීම සිදු කෙරේ. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් අවම වශයෙන් ප්‍රතිලාභීන් 100 ක් වත් මේ යටතේ වෘත්තීය පුහුණු ආයතන වෙත යොමු කිරීමට අපේක්ෂිතය. වෘත්තීය මාර්ගෝපදේශ සේවා සැපයීම මගින් ඔවුන්ට වඩාත් සුදුසු පුහුණු වැඩසටහන් හඳුන්වා දීමද සිදු කෙරේ

## 2.8.4. ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය

ශ්‍රම අධ්‍යයන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, සංවර්ධනය හා ප්‍රවර්ධනය, ශ්‍රම අධ්‍යයනයන් පිළිබඳ පර්යේෂණ සහ පාඨමාලා පැවැත්වීම, රජය පිළිගත් දේශීය පුහුණු ආයතන හා විදේශීය පුහුණු ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ ගුණාත්මක සංවර්ධනය උදෙසා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව මේ වන විට ශ්‍රම අධ්‍යයනය සම්බන්ධයෙන් සහතික පත්‍ර පාඨමාලා සහ ඩිප්ලෝමා පාඨමාලා පමණක් ක්‍රියාත්මක කරන අතර ඩිප්ලෝමා පාඨමාලාවෙන් පසු උපාධිය දක්වා වැඩි දියුණු කිරීමට රාජ්‍ය විශ්වවිද්‍යාල හෝ

ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සමග සබඳතා ඇති කර ගැනීම සඳහා මූලික සාකච්ඡා පැවැත්වීමට අපේක්ෂා කෙරේ.

ඉදිරියේදී ආරම්භ කිරීමට අපේක්ෂිත පාඨමාලා.

- විදේශ රැකියා සේවා සපයන නියෝජිත ආයතනවල ගුණාත්මකබව ඉහළ නැංවීම සඳහා සාමාන්‍ය කළමනාකරණය හා කම්කරු සංක්‍රමණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- තේ වතු සේවකයන් හා ආයෝජන ප්‍රවර්ධන කලාපවල පිහිටා ඇති කර්මාන්ත ශාලාවල ශ්‍රම බලකාය සවිබල ගැන්වීමට අවශ්‍ය දැනුවත් කිරීමේ වැඩසටහන් , පුහුණු පාඨමාලා

එමෙන්ම ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය ස්වයං මූල්‍යකරණයෙන් තව දුරටත් පවත්වා ගෙනයාම සඳහා නව තාක්ෂණික ක්‍රම භාවිත කොට ජනතාව වෙත පාඨමාලා සමීප කිරීමේ අරමුණින් නව දේශනාගාර පහසුකම් ස්ථාපිත කිරීමට අපේක්ෂා කරන අතර පුහුණුලාභීන්ගේ පහසුව සඳහා ප්‍රධාන දිස්ත්‍රික්කවල ද ශ්‍රම අධ්‍යයන පාඨමාලා පැවැත්වීමට කටයුතු කෙරේ. තවද රාජ්‍ය අංශය මෙන්ම පුද්ගලික අංශය කෙරෙහි ඉලක්කගත පුහුණු වැඩසටහන් හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට අදහස් කෙරේ.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ රසායනාගාර පහසුකම් ස්ථාපනය කිරීම සඳහා කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ ඉඩ පහසුකම් ලබා දීමට අදහස් කෙරේ. එබැවින් දැනට කම්කරු මහ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලෙහි ස්ථාපිත ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය 2025 වර්ෂයේදී මෙහෙවර පියෙස ගොඩනැල්ලේ ස්ථාපිත කිරීමට කටයුතු සැලසුම් කර ඇත.

## 2.8.5. ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය

කුඩා හා මධ්‍ය පරිමාණ ආයතන ආවරණය වන පරිදි වැඩබිම් තුළ සිදුවන අනතුරු හා රෝගාබාධ අවම කර ගැනිම අරමුණු කර ගනිමින් 2025 වර්ෂය තුළ Self Learning Platform එකක් නිර්මාණය කර කර්මාන්තවලට හඳුන්වාදීමට කටයුතු කරමින් පවතී. මෙහිදි වැඩබිමෙහි සේවකයින් හට සිදු විය හැකි වෘත්තීමය අනතුරු හා රෝගාබාධ වලින් ආරක්ෂා වීම සඳහා නවීන තාක්ෂණය යොදා ගනිමින් මෙම පද්ධතිය නිර්මාණය කිරීමට අපේක්ෂා කෙරේ.

එමෙන්ම කර්මාන්ත වල වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරිම, අනතුරු හා වෘත්තීය ලෙඩරෝග පිළිබඳ දත්ත ලබා ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දිමට නියමිතය.

තවද 2024 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ සමත්, ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍යය පාඨමාලාව හදාරන ලද සිසුන් විසිපස්දෙනෙකු (25) සඳහා 2025 වර්ෂයේ කොරියාවේ වැංසිං විශ්ව විද්‍යාලයේ Safety Engineering උපාධිය හැදෑරිමට අවශ්‍ය කටයුතු සකස් කරමින් පවති. ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය ප්‍රචලිත කිරීමට හා මෙහි අරමුණ දැනුවත් කිරීම පදනම් කර ගනිමින් නොවැම්බර් මස දෙවන සතියේ දි ජාතික වෘත්තීය සුරක්ෂිතතා සතිය සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සම්මන්ත්‍රණය - 2025 පැවැත්විමට සැලසුම් කර ඇත. එමෙන්ම වැඩ කරන සේවක සේවිකාවන්ගේ වෘත්තීය සුරක්ෂිතතාවය සඳහා කැපවි සේවය කළ ව්‍යාපාර හා ආයතන ඇගයීම අරමුණින් ජාතික වෘත්තීය සුරක්ෂිතතා සම්මාන උළෙල 2025 නොවැම්බර් මස මැද භාගයේ දි පැවැත්විමට සැලසුම් කර ඇත.

## 2.8.6. ශ්‍රම වාසනා අරමුදල

අඩු ආදායම්ලාභී සේවා නියුක්තිකයන්ගේ වෘත්තීය ආරක්ෂාව, අයිතීන් තහවුරු කිරීම හා රැකියා සුරක්ෂිතතාව සඳහා 2025 වර්ෂයේදී විශේෂ අවධානය යොමු කෙරෙනු ඇත. ඊට අමතරව සේවා නියුක්තිකයින්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ සුබසාධනය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව ශ්‍රමික ප්‍රජාව ආරක්ෂා කර ගැනීම සඳහා අවදානම් සහිත වැඩ පරිසරයන්හි සේවක සේවිකාවන් හට වෛද්‍යාධාර ලබා දීම, ශ්‍රී ලංකාව තුළ කර්මාන්තශාලාවල සිදුවන අනතුරු වලින් මියගිය හෝ පූර්ණ බෙලහීන තත්වයට පත් කම්කරු ජනතාවගේ අධ්‍යාපනය ලබන දූ දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව වැඩසටහන් පැවැත්වීම, පෞද්ගලික අංශයේ සේවකයන් අසාධාරණ ලෙස සේවයෙන් ඉවත් කර ඇති අවස්ථාවලදි හා පූර්ව දැනුම්දීමකින් තොරව ආයතන වසා දමන අවස්ථාවක දි සේවක ප්‍රජාව වෙත නීති ආධාර ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. 2025 වර්ෂය තුළ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි.48.52 ක මුදලක් වෙන් කර ඇත. ඒ අතරම ශ්‍රම වාසනා අරමුදල, ජාතික ලොතරැයි මණ්ඩලය සමග ගිවිසුමකට එළඹීමට ද කටයුතු කරනු ලැබේ.

# මූල්‍ය ප්‍රගතිය

## 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

ඒසීඒ-එෆ්

2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2024 රු. | | සටහන | සත්‍ය 2024 රු. | සත්‍ය 2023 රු. | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | ඒසීඒ-1 |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | ඒසීඒ-1 |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,586,211,217 | 1,398,857,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 343,505,548 | 392,874,198 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 51,224,516 | 49,933,627 | ඒසීඒ-5 |
| - | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,980,941,281** | **1,841,664,825** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,980,941,281** | **1,841,664,825** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)** | | 3,732,365 | 3,403,513 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)** | | **1,977,208,916** | **1,838,261,313** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | | | |
| 1,247,000,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 1,311,233,480 | 1,173,168,363 | ඒසීඒ-2(ii) |
| 338,700,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 262,835,499 | 233,726,563 | ඒසීඒ-2(ii) |
| 103,050,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 92,408,502 | 87,151,535 | ඒසීඒ-2(ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | ඒසීඒ-2(ii) |
| 250,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 21,020 | 1,243 | ඒසීඒ-2(ii) |
| 1,689,000,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **1,666,498,502** | **1,494,047,704** | |
| | **මූලධන වියදම්** | | | | |
| 18,700,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 9,319,407 | 15,197,606 | ඒසීඒ-2(ii) |
| 10,900,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 7,985,143 | 3,401,810 | ඒසීඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | ඒසීඒ-2(ii) |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | - | - | ඒසීඒ-2(ii) |
| 5,700,000 | හැකියා වර්ධනය | 14 | 898,034 | 1,673,371 | ඒසීඒ-2(ii) |
| 289,700,000 | වෙනත් මූලධන වියදම් | 15 | 209,072,219 | 337,759,987 | ඒසීඒ-2(ii) |
| 325,000,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **227,274,802** | **358,032,774** | |
| | තැන්පතු ගෙවීම් | | 346,525,067 | 401,712,784 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 55,862,138 | 48,469,040 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **402,387,205** | **450,181,824** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 2,296,160,508 | 2,302,262,302 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | (318,951,593) | (464,000,990) | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (319,315,325) | (464,000,990) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 363,732 | - | ඒසීඒ-3 |
| | | | 363,732 | - | |

## 3.2. 2024.12.31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-පී

**2024 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2024 රු. | 2023 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 894,432,663 | 926,280,143 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 126,835,229 | 122,197,608 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 363,732 | - |
| **මුළු වත්කම්** | | **1,021,631,624** | **1,048,477,751** |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය රඳවන ශුද්ධ වත්කම් | | 121,437,068 | 113,779,927 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 894,432,663 | 926,280,143 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | - |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| සැන්පත් ගිණුම් | ඒසීඒ-4 | 5,398,161 | 8,417,681 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 363,732 | - |
| **මුළු වගකීම්** | | **1,021,631,624** | **1,048,477,751** |

පිටු අංක 7 සිට 36 දක්වා ඒසීඒ 2 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 37 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ...................... | ...................... | ...................... |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2025.02. 21 | දිනය : 2025.02. 21 | දිනය : 2025.02. 21 |

එස්.එම්. පියතිස්ස
ලේකම්
කම්කරු අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියස",
නාරාහේන්පිට, කොළඹ 05.

2

ආර්.ටී.බී.ඒ.ඒ. රත්නායක
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කම්කරු අමාත්‍යාංශය
7 වන මහල, "මෙහෙවර පියස",
නාරාහේන්පිට, කොළඹ 05.

## 3.3. 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ඒසීඒ-3

**2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | [illegible] 2024 රු. | 2023 රු. |
|---|---|---|
| <u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | 22,248,628 |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 77,651,613 | 71,802,809 |
| අග්‍රිම ලැබීම් | 1,586,211,217 | 1,398,857,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 52,044,150 | 47,037,138 |
| තැන්පතු ලැබීම් | 343,505,548 | 392,874,198 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,059,412,527** | **1,932,819,773** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 1,499,319,227 | 1,352,377,314 |
| සහනාධාර සහ මාරුකිරීම් | 92,408,502 | 87,151,535 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 360,645 | 651,227 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 3,732,365 | 3,403,513 |
| අත්තිකාරම් ගෙවීම් | 49,902,878 | 43,047,540 |
| තැන්පතු ගෙවීම් | 346,525,067 | 401,712,784 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **1,992,248,684** | **1,888,343,913** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **67,163,843** | **44,475,860** |
| <u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| නිශ්චල වත්කම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | 8,220,000 |
| උපණය අයකර ගැනීම | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **8,220,000** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 66,800,111 | 52,695,860 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **66,800,111** | **52,695,860** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | **(66,800,111)** | **(44,475,860)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | **363,732** | **0.00** |
| <u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | - | - |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | - | - |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | - | - |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

3

## 3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

1) <u>පිළියෙල කිරීමේ අරමුණ</u>

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2024.12.16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) <u>වාර්තාකරණ කාලපරිච්ඡේදය</u>

2024 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) <u>මිනුම්කරණ පදනම</u>

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) <u>ආදායම් හඳුනාගැනීම</u>

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) <u>දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම</u>

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

6) <u>දේපළ, පිරියත හා උපකරණ සංචිතය</u>

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) <u>මුදල් හා මුදල් සමාන දෑ</u>

2024 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

- යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

- තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය

## 3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

**වගුව 3.1** ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු.) | අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස |
| හිස් වාර්තාවකි | | | | | |

## 3.6 වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

**වගුව 3.2** වෙන් කරන ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| පුනරාවර්තන | 1,689,000,000/- | 1,779,824,000/- | 1,666,498,502/- | 94 |
| ප්‍රාග්ධන | 325,000,000/- | 362,400,000/- | 227,274,802/- | 63 |

## 3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

**වගුව 3.3** වෙනත් අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම අමාත්‍යාංශයට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන රු. ,000

| අ. අ. | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණු | වෙන් කරන ලද ප්‍රතිපාදනය | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුල් ප්‍රතිපාදනය | අවසාන ප්‍රතිපාදනය | | |
| 01 | රාජ්‍ය සේවා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | නවක උපාධිධාරී අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | | - | - | - |
| 02 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු මුදල් නිරවුල් කිරීම | | - | - | - |

## 3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

**වගුව 3.4** මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2024 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 31.12.2024 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 31,823,502/- | 31,823,502/- | - | 100% |
| 9152 | යන්ත්‍රෝපකරණ | 862,074,161/- | 862,074,161/- | - | 100% |
| 9153 | ඉඩම් | - | - | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | 535,000/- | 535,000/- | - | 100% |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | - | - | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } LSW/B/MOL/SR/01/2024 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2025 ජුනි 24 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය

**ශීර්ෂය 193 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 193 - කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 23 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 6/2024 අනුව කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරය සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එමනිසා මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව අමාත්‍යාංශය, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

### 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 6/2024 අනුකූලව සියළුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

(අ) වැය විෂයයන් 7 කට අදාලව සලසා තිබූ රු.21,650,000 ප්‍රතිපාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී කිසිදු වියදමක් දරා නොතිබීමෙන් සියයට සියයක ප්‍රතිපාදන ඉතිරිවීම් නිරීක්ෂණය විය.

(ආ) වැය විෂයයන් 12 කට අදාලව සලසා තිබූ රු.75,898,000 ක ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.32,733,311 ක් පමණක් උපයෝජනය කර තිබුනි. මෙම වැය විෂයයන් ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 50 සිට සියයට 99 දක්වා පරාසයක් තුල පැවතුනි.

## 3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| | XXIV පරිච්ඡේදය 4.5 හා 4.6 වගන්ති | (i) ජාතික එළදායීතා ලේකම් කාර්යාලයේ ධූරය හැරගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.56,501 ක ණය මුදලක් හා කම්කරු අංශයේ ධූරය හැරගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු.114,575 ක ණය මුදලක් සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයකරගත නොහැකිව පැවතුනි.<br>(ii) කම්කරු අංශයේ සේවයේ යෙදී සිටියදී මියගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.230,300 ක ණය ශේෂයක් අයකර ගැනීමට නොහැකිව පැවතුනි. |
| | XLVII පරිච්ඡේදය | ජයගමු ශ්‍රී ලංකා වැඩසටහන පැවැත්වීමේදී අදාල උත්සව කළමනාකරු සමඟ ඇතිකරගත් ගිවිසුමෙහි 3.1.1 (IX) කොන්දේසිය පරිදි වැඩසටහන් කළමනාකරුගේ වියදමින් සංගීත සංදර්ශනයක් පැවැත්විය යුතු බවට හා එහි (X) කොන්දේසිය අනුව වැඩසටහනට සහභාගි වන සියලුම නිලධාරීන්ට රාත්‍රී භෝජන සංග්‍රහයක් පැවැත්විය යුතු බවට කොන්දේසි පනවා තිබූ අතර මෙම කර්තව්‍ය ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ නිලධාරීන්ගේ හැසිරීම හා විනය පිළිබඳ නියෝගයන්ට පටහැනිව ක්‍රියා කිරීමට අනුබල දීමක් ලෙස නිරීක්ෂණය කෙරේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මු.රෙ. 104 (1) | පාඩුවක් හෝ අලාභහානියක් හෝ සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැනගැනීමත්, එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණ ආරම්භ කල යුතු වුවද, 2023 මැයි 20 දින දක්ෂිණ අධිවේගී මාර්ගයේදී අනතුරට ලක්වූ දරණ කැබ් රථයක හානිය සම්බන්ධව වසර 2 කට ආසන්න කාල පමාවක් සිදුවී තිබුනද පරීක්ෂණ සිදුකර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වා ඇතත් කම්කරු අංශයේ හානි හා පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා නොතිබුණි. |

(ඇ) 2016 දෙසැම්බර් 16 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

| | |
|---|---|
| **(i) 3.1** වගන්තිය | අමාත්‍යාංශය සතු රථවාහන 17 ක් සඳහා ඉන්ධන දහන පරීක්ෂාවන් සිදුකර නොතිබුනි. |
| **(ii) 06** වගන්තිය | සියලුම නිල වාහන සඳහා අනුයුක්ත කරන ලද රියදුරන් මාසයේ රාජකාරි සඳහා කරන ලද ප්‍රවාහන සේවා සටහන් පවත්වා නොතිබුනි. |

**3.3 අවිධිමත් ගනුදෙනු**

(අ) ජයගමු ශ්‍රී ලංකා (Glocal Fair) නමින් දිවයින පුරා දිස්ත්‍රික්ක 24ක් ආවරණය කරමින් ජංගම සේවා මාලාවක් පැවැත්වීම සඳහා උත්සව කළමණාකරුවෙකු (Event Manager) තෝරාගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටුව වෙත සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ සමාගම් ලියාපදිංචියට අදාල තොරතුරු ලැබී තිබුනද එකී තොරතුරු නොසලකා එකම අධ්‍යක්ෂ මණ්ඩලයක් මඟින් පාලනය වන ආයතනික වශයෙන් පමණක් වෙනස් නම් දෙකක් සහිත ආයතන දෙකක් තෝරාගෙන තිබුණි.

(i) ඒ අනුව, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව විසින් උත්සව කළමණාකරුවෙකු තෝරාගැනීමේදී එකම පාලනයක් සහිත සමාගම් නාම දෙකක් යටතේ ලියාපදිංචි ආයතනයන් යන වගට අනවධානයෙන් උත්සව කළමනාකරු තෝරාගැනීමේ ක්‍රියාවලිය සිදුකර තිබුනි.

(ii) ඉහත වැඩසටහන ස්වයං මූල්‍යමය ක්‍රමයක් අනුව ක්‍රියාත්මක කරන බවට 2023 දෙසැම්බර් 05 දින යෝජනා ඉදිරිපත් කර තිබුණද, වියදම් ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර නොතිබුණි. 2024 ජනවාරි 08 දින ආයතන දෙකම සමඟ ඇතිකරගත් ගිවිසුමේ 3.2(ix) වගන්තිය ප්‍රකාරව විදේශ රැකියා නියෝජිතායතන සඳහා කුටි 20ක් මුදල් ගෙවීමේ පදනම මත ලබා දිය යුතු බවත් ඒ සඳහා නියෝජිතායතන වෙතින් මුදල් ලබාගත යුතු බවත් සඳහන් කර තිබූ නමුත් අමාත්‍යාංශය විසින් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සෙස් බද්ද අදායම මඟින් ගෙවන ලෙස ලිඛිතව කාර්යාංශය වෙත දන්වා තිබුණි.

**(ආ)** ආර්ථික අර්බුදය තුරන් කිරීමෙහිලා "විගමනික ශ්‍රමිකයන් විසින් ලබා දුන් මහඟු දායකත්වය ඇගයීම පිණිස විගමනික හරසර වැඩසටහනක් පැවැත්වීම" සඳහා කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා 2024 ජූනි 26 දින ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශයට අදාලව දකුණු, උතුරු සහ බස්නාහිර පළාත්වල වැඩසටහන් තුනක් (03) පැවැත්වීමට අනුමැතිය ලබා දී තිබුණි.

(i) අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව උතුරු පළාතේ උත්සවය සංවිධානය කිරීම වෙනුවට 2024 ජුලි 21 දින කුරුණෑගල (වයඹ පළාත) උත්සවයක් සංවිධානය කර පවත්වා තිබුණි.

(ii) විගමනික හරසර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශ 3.1 පරිදි පුද්ගලික සමාගමක් වෙත සෘජු ප්‍රසම්පාදනයක් ප්‍රදානය කර තිබූ අතර, සමාගම ඉදිරිපත් කරන ලද රු.19,592,000 ක ඇස්තමේන්තුවෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ ඉල්ලීම පරිදි අයිතම 9ක් සඳහා රු.1,680,000 ක මිලගණන් අඩුකිරීමක් සිදුකර එකඟතාවය පලකර තිබුණි. මේ අනුව, මිල ගණන් ඉදිරිපත් වීමේ විධිමත් බවක් නිරීක්ෂණය නොවීය.

(iii) විගමනික හරසර වැඩසටහනේ කාර්යභාරය සෘජු ප්‍රසම්පදනයක් මඟින් ලබා ගත් පුද්ගලික සමාගම ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු මිලගණන් අනුව අමාත්‍යාංශය විසින් සමාගම වෙත රු.62,756,540 ක මුදලක් ගෙවා තිබූ අතර එම සමාගම මිලගණන් කැඳවා වෙනත් ආයතන වෙතින් ඊට වඩා අඩු මුදලකට සේවාවන් ඉටු කරවාගෙන ගෙවා තිබූ මුදල රු.56,463,140 ක් වූ බැවින් එකී වියදම්වල රු.6,293,400 ක අධි ඇස්තමේන්තු අගයක් පැවති බවට නිරීක්ෂණය විය.

(iv) මෙම හරසර වැඩසටහන සඳහා රු.මි.63 ක මුදලක් උත්සව වැඩසටහන් වෙනුවෙන් වැයදරා තිබූ නමුත්, උත්සව අවස්ථාවේ ලබාදුන් අහාරපාන හැර ඉදිරි සුබසාධනය සඳහා ස්වයං රැකියා හෝ වෙනත් ප්‍රතිලාභ ලැබී නොතිබුණි. පැමිණි ශ්‍රමිකයන් වෙත උපහාර පිදීම සඳහා ජනාධිපතිතුමාගේ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ සහ රාජ්‍ය අමාත්‍යතුමාගේ සුභ පැතුම් තුනක් සහිතව ලිපිගොනුවක් ප්‍රදානය කිරීමට රු.1,935,000 ක් වැයබරක් දරා තිබුණි. අදාල විගමනික ශ්‍රමිකයන් උත්සව සඳහා කැඳවාගෙන ඒමට බස්රථ 226ක් සඳහා ලංකා ගමනාගමන මණ්ඩලය වෙත රු.8,041,476 ක වියදම් දරා තිබුණි. මේ අනුව ශ්‍රමිකයන්ගේ ප්‍රතිලාභ වලට වඩා අමතර වියදම් වැඩිපුර දරා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) පහත සඳහන් අරමුණුවල අපේක්ෂිත මට්ටමට ලඟාවීමට අමාත්‍යාංශයට නොහැකිව තිබුනි.

(i) රජයේ ජාතික ප්‍රතිපත්තිය මත පිහිටා කම්කරු විෂයන්ට අදාලව ප්‍රතිපත්ති සම්පාදනය, වැඩසටහන් සැලසුම් ක්‍රියාත්මක කිරීම, අධීක්ෂණය හා පසු විපරම දක්වා ඇතත්, වර්තමාන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි කම්කරු නීති ප්‍රතිසංස්කරණයන්ගෙන් (unified Labour Law Reform) අවසන්ව නොතිබීම හා 2024 වර්ෂයේ දී නව නීති සංශෝධනයන් 2 ක් පමණක් සිදුව තිබූ බවට නිරීක්ෂණය විය.

(ii) අමාත්‍යාංශ විෂය පථයට අවශ්‍ය වන මහජන සේවාවන් කාර්යක්ෂමව හා මහජන හිතකාමී අයුරින් ලබාදීම දක්වා තිබුණද කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක

අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම් තීරණ ක්‍රියාත්මක වීම සියයට 50-74 මට්ටමක පැවතීම හා කම්කරු දෙපාර්තමේන්තුවේ පැමිණිලි කළමනාකරණ පද්ධතිය ක්‍රියාත්මක වීම නිසි පරිදි සිදු නොවීම.

(iii) වෘත්තීය සමිති ලියාපදිංචි කිරීම සහ රාජ්‍ය සහ පෞද්ගලික අංශවල සියලුම වෘත්තීය සමිතිවල කටයුතු රටේ සංවර්ධනයට යොදා ගැනීම සඳහා අවශ්‍ය සාධනීය පියවරක් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම දක්වා තිබුණද,කම්කරු දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන 1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කරන වෘත්තීය සමිති සිය ක්‍රියාකාරීත්වය අලුත් කරවා ගැනීම පිණිස අවශ්‍ය කටයුතු සම්පාදනය කර නොමැති අවස්ථාවලදී ඒවායේ ලියාපදිංචිය අවලංගු කර මහජනතාව දැනුවත් කරන ක්‍රමවේදයක් නොතිබීම.

(iv) ජාතික මිනිස්බල රැකී රක්ෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය වෙත කාර්යභාරයක් පැවරී තිබුණද 2025 වර්ෂය වන විටත් ජාතික මිනිස්බල හා රැකි රක්ෂා ප්‍රතිපත්තිය සම්පාදනය වී නොතිබීම.

(v) නාස්තිය හා දූෂණය පිටු දකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමණාකරන ක්‍රම සහ තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යය ලෙස දක්වා තිබුනද, වන්දි ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව සේවක වන්දි ගෙවීම් ක්‍රියාවලිය අනුගමනය කිරීමේ දී දීර්ඝ කාලයක් ගතවීම සහ වන්දි කොමසාරිස් කාර්යාලයේ ලිපිගොනු තොරතුරු පරිගණක ගත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් යාවත්කාලීන තොරතුරු ලබා ගැනීමේ ප්‍රමාදයන් පැවතීම.

(vi) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයට අනුයුක්ත කර ඇති සංවර්ධන නිලධාරින්ගේ 2024 වර්ෂයේ ආරම්භක සැලසුම් හා ප්‍රගතිය පිළිබඳ බස්නාහිර පළාත තුල සිදුකරන ලද නියැදි පරීක්ෂාවකදී කුඩා පරිමාණ ව්‍යාපාර ඵලදායිතා සංකල්ප හරහා බලගැන්වීම, රාජ්‍ය අංශ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම, 5s සහතිකරන වැඩසටහන, ඵලදායිතා ප්‍රවර්ධන වැඩසටහන් පැවැත්වීම යනාදී අරමුණු ප්‍රමාණවත් පරිදි ඉටුකරගැනීමට හැකිවී නොතිබීම.

(ආ) කම්කරු නිතිරීති හා පටිපාටිවල නම්‍යශීලීත්වය ඉහල නැංවීම අමාත්‍යාංශයේ අරමුණක් වුවද, කම්කරු දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන අණ පනත් 20 ක් අතුරින් ආඥා පනත් 5 ක් පැවතීම හා ඉතිරි අණ පනත් වර්තමානයට ගැලපෙන පරිදි අවශ්‍ය සංශෝධනයන් සිදුවීම මන්දගාමී තත්ත්වයක පැවතුනි.

**4.1.2 වත්කම් කළමනාකරණය**

2023 මැයි 20 දින දක්ෂිණ අධිවේගී මාර්ගයේදී අනතුරට ලක්වූ කැබ් රථය වර්ෂ දෙකකට ආසන්න කාලයක් ගතවී තිබුනද අලුත්වැඩියා කටයුතු හා පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබූ අතර අනතුර වෙනුවෙන් දක්ෂිණ අධිවේගී මාර්ගයට සිදුවූ හානිය රු.260,716 ක මුදලක් අමාත්‍යාංශය විසින් දරා තිබුනි.

### 4.1.3 අනාර්ථික ගනුදෙනු

ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේදී මූලික පිරිවැය රු.1,465,200ක් දරා ප්‍රසම්පාදනය කරන ලද ebreeze පරිගණක පද්ධතියේ නඩත්තුව සඳහා 2024 වර්ෂය අවසාන වන විට රු.5,434,095ක් වැය දරා තිබුනද, අධ්‍යාපන වැඩසටහන් කළමනාකරණ උත්සව වැඩකටයුතු සම්පාදනය යන අවස්ථාවන් සඳහා පරිගණක පද්ධතිය භාවිතා නොවීම හේතුවෙන් යොදවන ලද මුදල ආර්ථික වශයෙන් ඵලදායි වී නොතිබුණි.

## 5. මානව සම්පත් කළමනාකරණය

(අ) දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති ඵලදායිතා සංවර්ධන නිලධාරීන් අවුරුදු 5ට වඩා වැඩිකාලයක් එකම කාර්යාලයක සේවයෙහි නිරතවී තිබූ අතර, නිලධාරීන්ගේ ස්ථාන මාරු විධිමත් පරිදි සිදු නොකිරීම හේතුවෙන් ස්ථාන මාරු අවශ්‍ය නිලධාරීන්ට අවස්ථාවක් අහිමි වී ඇති බවට නිරීක්ෂණය විය.

(ආ) අමාත්‍යාංශයට අනුබද්ධිත ආයතන වන ජාතික ශ්‍රම අධ්‍යාන ආයතනය සහ ජාතික වෘත්තීය සුරක්ෂිතතා සහ සෞඛ්‍ය ආයතන යන ආයතන දෙකෙහි ප්‍රධාන විධායක තනතුර වන අධ්‍යක්ෂ ජනරාල් තනතුරෙහි වැඩ බැලීමේ පදනමින් හා කොන්ත්‍රාත් පදනමට නිලධාරීන් පත්කර තිබුණි.

එච්.එම්.ද සොයිසා,
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,
විගණකාධිපති වෙනුවට

# කාර්යසාධක දර්ශක

**වගුව 4.1** අමාත්‍යාංශයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

**කම්කරු අමාත්‍යාංශය**

| | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | **100% - 90%** | **75% - 89%** | **50% - 74%** |
| 1 | කම්කරු ක්ෂේත්‍රයට අදාළ අලුතින් පනවන ලද/ සංශෝධනය කරන ලද නීති සංඛ්‍යාව | 2 | - | 3 |
| 2 | ජාතික කම්කරු සංවිධානය වෙත වාර්තා සම්පාදනය- | | | |
| | i. අපරානුමත කරන ලද ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන් සඳහා වාර්ෂික වාර්තා කිරීම් සංඛ්‍යාව | √ | | |
| | ii. අපරානුමත නොකරන ලද සම්මුතීන් සඳහා වාර්තා කිරීම් සංඛ්‍යාව | √ | | |
| | iii. Article 24 යටතේ සම්පාදනය කළ යුතු වාර්තා | √ | | |
| 3 | නව අපරානුගමනය කරන සම්මුතිය<br>i. Working Fishing Convention - C 188 | √ | | |
| 4 | වෙනත් ජාත්‍යන්තර ආයතන, අමාත්‍යාංශ, විවිධ පාර්ශවකරුවන් වෙත සම්පාදනය කළ යුතු වාර්තා | | | |
| i | i. Human Trafficking in Persons | √ | | |
| | ii. US Child Report | √ | | |
| | iii.Central Bank | | | √ |
| | vi. Convention on the Elimination of Discrimination against Women | √ | | |
| 5 | ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පැවැත්වීම(NSCE) | | √ | |
| 6 | DWCP (Decent Work Country | √ | | |

| | | | | |
|---|---|---|---|---|
| | Programm) Task Force | | | |
| 7 | පිළිතුරු ලබාදුන් විගණන විමසුම් සංඛ්‍යාව | √ | | |
| 8 | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් | √ | | |
| 9 | විගණන විමසුම් හැර අනෙකුත් වාර්තා | √ | | |
| **කම්කරු දෙපාර්තමේන්තුව** | | | | |
| 11 | සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ගෙවීම සඳහා තීරණ ලිපි දින 14 ක් තුළ යැවීම | | | √ |
| 12 | 2025 වර්ෂය වන විට ශ්‍රී ලංකාව ළමා ශ්‍රමයෙන් තොර දේශයක් කිරීමේ තිරසාර අරමුණ පෙරදැරිව 2024 වර්ෂය තුළ ඉටු කිරීමට ඉලක්කගත ක්‍රියාකාරකම් ඉටු කිරීම | √ | | |
| 13 | ආයතනයන්හි පිහිටුවීමට ඉලක්කගත ද්වීපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාවෙන් පිහිටුවනු ලැබූ ද්වීපාර්ශවීය සුරක්ෂිතතා කමිටු සංඛ්‍යාව | | √ | |
| 14 | කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අදාළ කොන්දේසි කඩකිරීම් සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි සම්බන්ධයෙන් පරීක්ෂණ සිදු කර විසඳීම | √ | | |
| 15 | සමාජ කතිකාව ප්‍රවර්ධනය සඳහා ආයතන මට්ටමේ වැඩසටහන් පැවැත්වීමට ඉලක්කගත ප්‍රතිශතයෙන් වැඩසටහන් පවත්වන ලද සංඛ්‍යාව | √ | | |
| **මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුව** | | | | |
| 16 | රැකියා අපේක්ෂිතයන් ලියාපදිංචිය | √ | | |
| 17 | රැකියා ඇබෑර්තු ලියාපදිංචිය | √ | | |
| 18 | රැකියා අපේක්ෂිතයන් රැකියාගත කිරීම | | √ | |
| 19 | පාසැල් සිසුන් සඳහා සිදු කරන වෘත්තීය මාර්ගෝපදේශන වැඩසටහන් ගණන | √ | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 20 | ස්වයං රැකියා හා ව්‍යවසාය ආරම්භ කිරීම | | | | √ |
| 21 | පුහුණුව සඳහා යොමු කිරීම | | √ | | |
| **ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය** | | | | | |
| 22 | රාජ්‍ය හා පෞද්ගලික අංශ වෙනුවෙන් පුහුණු වැඩසටහන් හා විභාග පැවැත්වීම | | √ | | |
| **කම්කරු වන්දි කොමසාරිස් කාර්යාලය** | | | | | |
| 23 | අවසන් කළ නඩු සංඛ්‍යාව | | √ | | |
| 24 | දෙපාර්ශවයේ එකඟතාවයෙන් සාමදානයට පත් වීමට අදාල ගිවිසුම් සංඛ්‍යාව | | | | √ |
| 25 | මියගිය සේවකයින්ගේ වයස අවු.18ට අඩු දරුවන් සඳහා අරඹන ලද ගිණුම් සංඛ්‍යාව | | | √ | |
| 26 | දරුවන්ගේ වයස 18 සම්පූර්ණ වීම නිසාවෙන් මුදාහළ ගිණුම් සංඛ්‍යාව | | √ | | |
| **ශ්‍රම වාසනා අරමුදල** | | | | | |
| 27 | දැනුවත් කිරීමේ වැඩසටහන් | | √ | | |
| 28 | අධ්‍යාපනික ආධාර වැඩසටහන් | විශේෂ | √ | | |
| | | සාමාන්‍ය | √ | | |
| 29 | නීති ආධාර හා ආයාචනා වැඩසටහන | | | | √ |
| 30 | මරණීය අනතුරු ශිෂ්‍යත්ව වැඩසටහන | | | | √ |
| 31 | වෛද්‍ය කඳවුරු පැවැත්වීම | | | | √ |

# තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරාගැනීමේ කාර්යසාධනය

## 5.1. හඳුනා ගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| ඉලක්කය / අරමුණ | | ඉලක්ක | | ජයග්‍රහණ දර්ශක | | 2024.01.01 දින සිට 2024.12.31 දින දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය |
|---|---|---|---|---|---|---|
| 01 | සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම | 1.1 | 2030 වන විට ලෝකයේ සියලුම ස්ථානවල වෙසෙන පුද්ගලයින්ගේ අන්ත දරිද්‍රතාව තුරන් කිරීම. වර්තමාන තක්සේරුව අනුව දිනකට ඩොලර් 1.25ට වඩා අඩුවෙන් අදායම් ලබන අය අන්ත දිළිඳු කාණ්ඩයට අයත් වේ. | 1.1.1 | ස්ත්‍රී පුරුෂභාවය, වයස, සේවා නියුක්ති මට්ටම සහ භූගෝලීය පිහිටීම (නාගරික, ග්‍රාමීය) යන සාධකයන්ට අනුව අන්තර්ජාතික දරිද්‍රතා රේඛාවෙන් පහල ජනගහණයේ අනුපාතය | • තේ වැවීමේ හා සෑදීමේ කර්මාන්තයේ සහ රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තයේ අවම දෛනික වේතන ප්‍රමාණය යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී.<br>• "Analysis of Reducing the Gap between Minimum Wage and Nominal Wage in Sri Lanka" අධ්‍යයනය සිදු කරන ලදී. ජාතික අවම වේතනය (මාසික) අවම වශයෙන් රු. 24,120.00 ක් විය යුතු බව මෙම අධ්‍යයනයේ නිර්දේශ මගින් යෝජනා කර ඇත. |
| 05 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ළඟාකර සියලු කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම | 5.1 | කාන්තාවන්ට හා ගැහැණු ළමුන්ට එරෙහිව සියලුම ස්ථායන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම | 5.1.1 | ස්ත්‍රී පුරුෂභාවයට අදාළව සමානාත්මතාවය සහ වෙනස්කොට නොසැලකීම ප්‍රවර්ධනය බලාත්මක කිරීම සහ අධීක්ෂණය පිණිස වන නෛතික රාමුවක් පවතින්නේද නැද්ද යන්න | • 2024.03.08 දිනට යෙදී තිබූ ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරනු ලැබූ කාන්තා දින සැමරුම් වැඩසටහන 2024.03.07 දින කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී පවත්වන ලදී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 5.2 | මානව කුට්ටනය ලිංගික සහ වෙනත් ආකාරයේ දූෂණයන්ද ඇතුලත්ව කාන්තාවන්ට සහ ගැහැණු ළමුන්ට එරෙහිව පොදු සහ පෞද්ගලික ස්ථානයන්හි සිදුවන්නා වූ සියලුම ආකාරයේ ප්‍රචණ්ඩත්වයන් තුරන් කිරීම | 5.2.1 | පසුගිය මාස 12ක කාලය තුලදී, හිංසනයේ ස්වභාවය, සහ වයස අනුව, සහකරුවෙක් සිටි/සිටින, වයස අවුරුදු 15ට වැඩි කාන්තාවන් සහ ගැහැණු ළමුන් අතරින් කායික, ලිංගික, හෝ මානසික හිංසනයට ලක්වූ ප්‍රමාණය | • "කාන්තාවන්ට බලපාන කම්කරු නීතිය" සම්බන්ධයෙන් සමාජ මාධ්‍ය මගින් ප්‍රජාව දැනුවත් කිරීම සඳහා කෙටි වීඩියෝ පට නිර්මාණ තරඟයක් පවත්වා එම තරඟයේ ජයග්‍රාහකයන් වෙත සහතිකපත්‍ර ලබා දීම සිදු කරන ලදී. එමෙන්ම විශ්ව විද්‍යාල සිසුන් වෙනුවෙන් කාන්තාවන්ට බලපාන කම්කරු නීතිය පිළිබඳව විවෘත සාකච්ඡා මණ්ඩපයක් ද පවත්වන ලදී. කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමේ කොන්දේසි කඩවීම් පිළිබඳව ලැබුණු පැමිණිලි 09 ක් සම්බන්ධයෙන් වර්ෂය තුළදී පරීක්ෂණ සිදු කර අවසන් කරන ලදී. <br>• කාන්තාවන්ට බලපාන නීති පිළිබඳව සේවයේ නියුතු කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 12 සිදු කරන ලද අතර එමගින් කාන්තා සේවිකාවන් 418 ආවරණය වී ඇත. කාන්තාවන් සවිබලගැන්වීම හරහා නීති කඩවීම් වැලැක්වීමට මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් ඉවහල් වනු ඇති බවට අපේක්ෂා කෙරේ. |
| | | 5.6.ඇ. | ස්ත්‍රී පුරුෂ සමානත්වය සහ සියලුම මට්ටම්වල කාන්තාවන් සහ ගැහැණු ළමුන් සවිබල ගැන්වීම සඳහා යහපත් ප්‍රතිපත්ති යොදා ගැනීම,ශක්තිමත් කිරීම සහ නීතිමය ලෙස බලාත්මක කිරීම | 5.ඇ.1 | ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සහ කාන්තාවන් සවිබල ගැන්වීම හඳුනා ගැනීමට සහ රාජ්‍ය මුදල් වෙන් කිරීමක් සහිත ක්‍රමයන් පවත්නා රටවල් ප්‍රමාණය | |
| 08 | සියලු දෙනා සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ, ඵලදායී සහ යහපත් | 8.5. | 2030 වන විට ආබාධිත පුද්ගලයින් සහ යෞවනයින් ද ඇතුළත්ව සියලුම කාන්තාවන් සහ පිරිමින් සඳහා ඵලදායී හා සුනිසි රැකියා අවස්ථාවන් ලබා දීම | 8.5.1 | රැකියාව, වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව පිරිමි සහ ගැහැණු සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම ඉපැයීම | • කම්කරු නීති අනුව පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවා නියුක්තයන්ගේ පැයක සාමාන්‍ය ආදායම වයස සහ ආබාධ සහිත පුද්ගලයන් යන සාධක අනුව හෝ ස්ත්‍රී පුරුෂභාවය අනුව වෙනස් නොවේ. |
| | | | | 8.5.2 | ස්ත්‍රී පුරුෂ භාවය, වයස සහ ආබාධ සහිත පුද්ගලයන්ට අදාළව විරැකියා අනුපාතය | |
| | රැකියා ප්‍රවර්ධනය කිරීම | 8.7 | බලහත්කාරයෙන් ශ්‍රමය ලබා ගැනීම තුරන් කිරීම සඳහා වහාම ඵලදායී ක්‍රියාමාර්ග ගැනීම, කාන්තාවන් වහල් | 8.7.1. | ස්ත්‍රීපුරුෂභාවය සහ වයස අනුව අවුරුදු 5-17 අතර ළමා ශ්‍රමිකයින් ලෙස යොදාගෙන ඇති ප්‍රමාණය සහ සංඛ්‍යාව | • සෑම වර්ෂයකම ජුනි 12 දිනට යෙදෙන ‘ලෝක ළමා ශ්‍රම විරෝධී දිනයට’ සමගාමීව කම්කරු දෙපාර්තමේන්තුව විසින් 2024.06.18 දින සැමරුම් වැඩසටහනක් පවත්වන ලදී. එහිදී, විධිමත් ක්ෂේත්‍රයන්හි ආයතන වල, විශේෂයෙන් |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | සේවයේ යෙදවීම සහ මානව කුට්ටනය අවසන් කිරීම සහ ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම ද ඇතුළත්ව අතිශය නරක ආකාරයෙන් ළමා ශ්‍රමය යොදා ගැනීම තහනම් කිරීම සහ තුරන් කිරීම සහ 2025 වන විට සියලුම ආකාරයේ ළමා ශ්‍රමය යොදා ගැනීම අවසන් කිරීම | | | කාර්මික සංවර්ධන මණ්ඩලය යටතේ පවතින කාර්මික උද්‍යාන වල ස්ථාපිත ආයතන වල සේවායෝජකයන් වෙතින් සිය ආයතන විසින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ වැඩසටහන ආරම්භ කරන ලදී. එයට සමගාමීව දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය මගින් QR කේතයක් හඳුන්වා දී ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට දිවයිනේ සියලුම ආයතන වෙතින් ප්‍රතිඥාව ලබා ගැනීමේ කටයුතුද ආරම්භ කරන ලදී.<br>• පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ ආයතනවල සේවා සේවක දෙපාර්ශවය කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව පිළිබඳ දැනුවත් කිරීම සඳහා වැඩසටහන් මෙන්ම රාජකාරි කටයුතු සිදු කිරීමේදී කාන්තාවන් හා ළමයින් සම්බන්ධ කම්කරු නීති පිළිබඳව දැනුවත්භාවක් ලැබිය යුතු අනෙකුත් රාජ්‍ය ආයතනවල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්ද දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කොට පවත්වන ලදී.<br>• ක්ෂේත්‍ර පරීක්ෂණ වල යෙදෙන කම්කරු නිලධාරීන් විසින් අවිධිමත් ක්ෂේත්‍රය ප්‍රමුඛ කර ගනිමින් අනෙකුත් සියලුම ක්ෂේත්‍රයන්හි සේවායෝජකයන් වෙතින් ළමා ශ්‍රමය යොදා නොගන්නා බවට ප්‍රතිඥා ලබා ගැනීමේ කටයුතුද ආරම්භ කරන ලදී.<br>• කොළඹ දිස්ත්‍රික්කයෙහි ළමා ශ්‍රමය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම, ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | ඇගයීම, ළමා ශ්‍රමිකයන් සිටින පවුල් වල සමාජ ආර්ථික තත්ත්වය පිළිබඳ දත්ත රැස් කිරීම සහ ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව අධ්‍යයනය කිරීම අරමුණු කර ගනිමින් ළමා ශ්‍රමය පිළිබඳ අධ්‍යයනයක් 2024 වර්ෂයේදී සිදු කරන ලදි.<br>ළමා ශ්‍රමය තුරන් කිරීම හා පුරවැසි වගකීම පිළිබඳ පණිවුඩය බිම් මට්ටම දක්වා රැගෙන යාමේ කටයුතු ශ්‍රී ලංකා පොලිසියේ ප්‍රජා පොලිස් කමිටු හරහා සිදු කිරීම වඩාත් ප්‍රායෝගික බවට හඳුනාගන්නා ලදී. ඒ අනුව, 2024 වර්ෂයේ දී කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි සහ 2025 වර්ෂයේ දී මුළු දිවයිනම ආවරණය වන පරිදි මෙම ජාතික වගකීම සඳහා සහයෝගයෙන් කටයුතු කිරීමට අදාළ ක්‍රියාකාරකම් සිදු කිරීම ආරම්භ කරන ලදී.<br>• ළමා ශ්‍රමය පිළිබඳව ලද පැමිණිලි 101ක් සම්බන්ධයෙන් 2024 වර්ෂයේදී පරීක්ෂණ සිදු කරන ලදී. එහිදී ළමා ශ්‍රමයක් ඇති බවට අනාවරණය වූ පැමිණිලි 02 ක් වන අතර ඒ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | 8.8 . | කම්කරු අයිතිවාසිකම් ආරක්ෂා කරගැනීම, විශේෂයෙන්ම සංක්‍රමණික කාන්තාවන් ඇතුලු සංක්‍රමණිකයින් සහ අවධානම් සහගත රැකියාවල නිරත වුවන් ඇතුලත්ව වැඩ කරන සියලුදෙනා සඳහා ආරක්ෂාකාරී සහ ප්‍රවේසම් සහගත සේවා ස්ථාන සහිත පරිසරයන් ප්‍රවර්ධනය කිරීම | 8.8.1 | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික තත්ත්වය අනුව රැකියාව ආශ්‍රිත මාරක සහ මාරක නොවන අනතුරු සිදුවීමේ අනුපාතයන් | 2024 වර්ෂය තුලදී සේවා ස්ථාන ආශ්‍රිතව ඇතිවූ මරණීය අනතුරු 47ක් හා මරණීය නොවන අනතුරු 1606ක ප්‍රමාණයක් දෙපාර්තමේන්තුව වෙත වාර්තා වී ඇත. මෙම අනතුරු විමර්ශනය කර අදාළ නීතිමය පියවර ගැනීමට කටයුතු කිරීමත් අනතුරට හේතු සොයා ගැනීම තුළින් එවැනි අනතුරු නැවත සිදු නොවන ආකාරයට කටයුතු කිරීමට සේවායෝජකයින් දැනුවත් කිරීමත් දෙපාර්තමේන්තුව විසින් සිදු කර ඇත. ඒ අනුව, කර්මාන්තශාලා ආඥා පනත උල්ලංගනය වන පරිදි කටයුතු කළ සේව්‍යයන් 16 දෙනෙකුට එරෙහිව වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් නෛතික ක්‍රියා මාර්ග ගන්නා ලදී. |
| | | | | 8.8.2 | ස්ත්‍රී පුරුෂභාවය සහ සංක්‍රමණික මට්ටම් අනුව, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ ලේඛන මූලාශ්‍ර ජාතික ව්‍යවස්ථාව පදනම්ව කම්කරු අයිතිවාසිකම් (රැස්වීමේ සහ සාමූහික කේවල් කිරීමේ නිදහස) සම්බන්ධයෙන් ඇති ජාතික අනුකූලතාවයේ මට්ටම | සමාගමයේ හා කේවල් කිරීමේ නිදහස වර්ධනය කිරීම උදෙසා වෘත්තීය සමිති ඇති කර ගැනීමට, පවත්වාගෙන යාමට හා ඒ අනුව සිය අයිතිවාසිකම් පිළිබඳ කටයුතු කිරීමට සේවකයන් හට අවස්ථාව ලබා දී ඇත. ඒ අනුව 2024 වර්ෂය තුළදී වෘත්තීය සමිති 123ක් ලියාපදිංචි කරන ලදී. එම සමිතිද ඇතුළත්ව 2024.12.31 දිනට මෙරට වලංගු වෘත්තීය සමිති 2024 වර්ෂය සඳහා අදාළ සංඛ්‍යාව 2141 කි .<br>වාර්ෂික වාර්තා ILO වෙත යැවීමට කටයුතු කර ඇත. |

## 5.2. තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනිමේ අභියෝග

2030 වර්ෂය වන විට ශ්‍රී ලංකාව විසින් සාක්ෂාත් කර ගත යුතු තිරසාර සංවර්ධන අභිමතාර්ථයන් අතරින්, කම්කරු අමාත්‍යාංශයේ මෙහෙවර අනුව අමාත්‍යාංශය වෙත සෘජුව අදාළ වනුයේ 08 වන අභිමතාර්ථයයි. එනම්, සියල්ලන් සඳහාම පෝෂිත, පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායී සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම යන අභිමතාර්ථය වේ. ඒ අනුව, අමාත්‍යාංශයේ දැක්ම සහ මෙහෙවර මෙම අභිමතාර්ථය හා සමපාත වන අතර මෙම අමාත්‍යාංශයේ හා අනුබද්ධිත ආයතනවල සියලු ක්‍රියාකාරකම්හි අවසාන නිමැවුම වනුයේ මෙම අභිමථාර්තය සාර්ථකව සාක්ෂාත් කර ගැනීම වේ. ඒ අනුව ගත් කල අමාත්‍යාංශයේ සමස්ත ප්‍රගතිය මඟින් 08 වන අභිමතාර්ථය සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය විද්‍යමාන වේ. මේ හැරුණු කොට අංක 01 සහ 05 වන අභිමතාර්ථ වන පිළිවෙලින් සියළු තැන්හි පවතින සෑම ආකාරයකම දුගී බව අවසන් කිරීම සහ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය ලඟා කර සියළු කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම යන අභිමතාර්ථ දෙක ද අමාත්‍යාංශයේ ක්‍රියාකාරකම් අනුව අදාළ වේ. අදාළ වන තිරසර සංවර්ධන අරමුණු/ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා සෘජුව සහ වක්‍රව දායක වන පරිදි වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කොට ක්‍රියාත්මක කරනු ලබයි.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගත හැකි වන සේ වාර්ෂික ක්රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී සහ ප්‍රගති මෙහෙයුම්කරණයේදී ප්‍රතිඵල (Outcome) හා බලපෑම (Impact) ගණනය කිරීමේ ක්‍රමවේද හා මෙවලම් භාවිතයේ පවතින දුර්වලතා සහ අදාළ දත්ත විශේෂයෙන් ම පදනම් දත්ත (Baseline Data) සංචිත නොමැති වීම හා නිසි පරිදි යාවත්කාලීන නොවීම අහිතකර ලෙස බලපා ඇත. මේ සඳහා ජාතික මට්ටටමෙන් ක්‍රමවේද සකස් කොට මැදිහත් වීමේ අවශ්‍යතාවය පවතී.

# මානව සම්පත් පැතිකඩ

## 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

**වගුව 6.1** 2024.12.31 දිනට අමාත්‍යාංශයේ සහ අනුබද්ධිත කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | 2022.12.31 දිනට තත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව අනුමත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 278 | 159 | 119 | 43% |
| තෘතිය මට්ටම | 700 | 519 | 181 | 26% |
| ද්විතිය මට්ටම | 2691 | 2349 | 342 | 13% |
| ප්‍රාථමික මට්ටම | 545 | 462 | 83 | 15% |
| **එකතුව** | **4214** | **3489** | **725** | **17%** |

## 6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපා ඇති ආකාරය

අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතනවල මානව සම්පත් හිඟය පහත පරිදි වේ.

ජ්‍යෙෂ්ඨ මට්ටම 119

තෘතියික මට්ටම 181

ද්විතියික මට්ටම 342

ප්‍රාථමික මට්ටම 83

එකතුව 725

රා.ප. චක්‍රලේඛ 14/2022 අනුව දේශීය/ විදේශීය නිවාඩු ලබා ඇති නිලධාරීන් සංඛ්‍යාව ද පුරප්පාඩු ලෙස සැලකීමට සිදු වේ. මෙලෙස අමාත්‍යාංශය සහ අනුබද්ධ ආයතනවල මානව සම්පත් හිඟය හේතුවෙන් නිලධාරීන්ට තමාට නියමිත රාජකාරීවලට අමතරව පුරප්පාඩු තනතුරුවල ද රාජකාරි ඉටුකිරීමට සිදු වේ.

විශේෂයෙන්ම ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීනිගේ පවතින හිඟය ආයතනික අරමුණු සහ කාර්යභාරය කාර්යක්ෂමව, කඩිනම්ව හා අඛණ්ඩව පවත්වා ගෙන යාමට බාධාවක්ව පවතින බව නිරීක්ෂණය වේ.

## 6.3. කාර්ය මණ්ඩලයේ ධාරිතා සංවර්ධනය

**වගුව 6.2.** අමාත්‍යාංශ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| අනු අංකය | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | පුහුණු පැය ගණන | සමස්ත ආයෝජනය රු. | වැඩසටහනේ ස්වභාවය | ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| 1 | නීති සම්පාදනයට අදාළ මෑත කාලීන ප්‍රවණතා පිළිබඳ පුහුණු වැඩසටහන | 4 | 24 | 52,000.00 | Skills Development Foundation | නීති සම්පාදනයට අදාළ මෑත කාලීන ප්‍රවණතා පිළිබඳ දැනුම |
| 2 | පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 24 | 26,000.00 | Skills Development Foundation | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව පිළිබඳ විෂයානුකූල දැනුම |
| 3 | පෞද්ගලික ලිපි ගොනු නිවරදිව නඩත්තුව පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 12 | 10,000.00 | National Institute of Labour Studies | |
| 4 | විදේශ පුහුණු සඳහා නිවාඩු ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 12 | 14,000.00 | Skills Development Foundation | විදේශ පුහුණු සඳහා නිවාඩු ලබාදීමේ ක්‍රමවේදය පිළිබඳ දැනුම |
| 5 | කාර්යාල සහායක රාජකාරී හා වගකීම පිළිබඳ පුහුණු වැඩසටහන | 2 | 24 | 20,000.00 | National Institute of Labour Studies | කාර්යාල සහායක රාජකාරී හා වගකීම් පිළිබඳ දැනුම |
| 6 | රියදුරු සහ කණිෂ්ඨ නිලධාරීන් සඳහා විනය සහ ආචාර ධර්ම පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | 24 | 39,000.00 | Skills Development Foundation | රියදුරු සහ කණිෂ්ඨ නිලධාරීන් සඳහා විනය සහ ආචාර ධර්ම පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | රජයේ වැටුප් සැකසීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | 12 | 5,000.00 | National Institute of Labour Studies | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව රජයේ වැටුප් සැකසීම සඳහා අවශ්‍ය දැනුම |
| 8 | රජයේ වැටුප් සැකසීමේ ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | 36 | 54,000.00 | Metropolitan Campus KDU | |
| 9 | ප්‍රසම්පාදන ලියවිලි සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | 12 | 13,500.00 | Prag Institute | ප්‍රසම්පාදන ලියවිලි සැකසීම පිළිබඳ දැනුම |
| 10 | කාර්යාල ක්‍රම සහ කාර්යාල කළමනාකරණය පිළිබඳ පුහුණුව | 1 | 24 | 13,000.00 | Skills Development Foundation | කාර්යාල ක්‍රම සහ කාර්යාල කළමනාකරණය පිළිබඳ දැනුම |
| 11 | කාර්යාල සහයක රාජකාරී සහ වගකීම පිළිබඳ පුහුණු වැඩසටහන | 3 | 24 | 39,000.00 | Skills Development Foundation | කාර්යාල සහයක රාජකාරී සහ වගකීම් පිළිබඳ දැනුම |
| 12 | අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 4 | 12 | 28,000.00 | Skills Development Foundation | අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම පිළිබඳ දැනුම |
| 13 | පරිපාලන නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන | 1 | 36 | 15,000.00 | National Institute of Labour Studies | ධාරිතා සංවර්ධනය පිළිබඳ දැනුම |
| 14 | ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිළිබඳ පුහුණු වැඩසටහන | 4 | 24 | 52,000.00 | Skills Development Foundation | ආයතන සංග්‍රහය සහ මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම |
| 15 | මූලික විමර්ශණ සම්බන්ධ වැඩමුළුව | 2 | 24 | 26,000.00 | Skills Development Foundation | මූලික විමර්ශණ පිළිබඳ දැනුම |
| 16 | මුදල් රෙගුලාසි පිළිබඳ වැඩමුළුව | 2 | 12 | 14,000.00 | Skills Development Foundation | මුදල් රෙගුලාසි පිළිබඳ දැනුම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 17 | වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන | 1 | 24 | 13,000.00 | Skills Development Foundation | වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව තම වැටුප් පරිවර්තනය කිරීම පිළිබඳ විෂයානුකූල දැනුම |
| 18 | අත්තිකාරම් බී ගිණුම සම්බන්ධ පුහුණු වැඩසටහන | 1 | 12 | 7,000.00 | Skills Development Foundation | අත්තිකාරම් බී ගිණුම සම්බන්ධ දැනුම |
| 19 | Power BI සම්බන්ධ පුහුණු වැඩසටහන | 1 | 24 | 6,000.00 | APFASL | Power BI සම්බන්ධ දැනුම |
| | | **40** | | **446,500.00** | | |

**වගුව 6.3** අමාත්‍යාංශ නිලධරයන් විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| **අංකය** | **වැඩසටහනේ නම** | **පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව** | **වැඩසටහනේ කාලසීමාව** | **සමස්ථ ආයෝජනය** | | **නිමැවුම/ලබාගත් දැනුම** |
|---|---|---|---|---|---|---|
| | | | | දේශීය | විදේශීය | |
| 01 | Tripartite High-Level visit to India for Strengthening Social Protection System in Sri Lanka | 04 | From 13th – 15th March 2024 | | ✓ | To get knowledge on Strengthening Social Protection System in Sri Lanka |
| 02 | Executive Leadership Programs for NPOs, Fontainebleau, France | 01 | From 29th April – 03rd May 2024 | | ✓ | To participating Executive Leadership Programs for NPOs |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 03 | International Training on Evidence based Policy Making for Decent Work | 02 | From 06th – 31st May 2024 | | | To get knowledge on Policy Making for Decent Work |
| 04 | Knowledge Co-Creation Program (Country Focus) for the Project on Promoting Employment Support of Person with Disabilities, Japan | 02 | From 04th -15th June 2024 | | ✓ | To get knowledge Co- Creation Program (Country Focus) for the Project on Promoting Employment Support of Person with Disabilities |
| 05 | 14th ADBI-OECD-ILO Roundtable on Labour Migration in Asia: Maximizing the Impact of Labour Migration on Development, Tokyo, Japan | 01 | From 28th – 29th May 2024 | | ✓ | To get knowledge on Labour Migration on Development |
| 06 | Training Course of Assessors for the Green Productivity Specialist Certification Program New Delhi, India | 02 | From 22nd -26th April 2024 | | ✓ | To get knowledge in Green Productivity |
| 07 | ITC/ILO-International Labour Standards Turin, Italy | 01 | From 27th - 31st May 2024 | | ✓ | To get knowledge International Labour Standards |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 08 | Seminar on Capacity Building for Female Officials Participating in Social Management from Developing Countries, China | 02 | From 04th - 17th June 2024 | | ✓ | To get knowledge Capacity Building for Female Officials Participating in Social Management from Developing Countries |
| 09 | 2024 KOICA Invitational Fellowship Training Programme, Capacity Building or Old-Age Income Security Schema and National Pension Scheme Management, Korea | 01 | From 22nd September – 02nd October 2024 | | ✓ | To get knowledge Capacity Building or Old-Age Income Security Schema and National Pension Scheme Management |
| 10 | Development of Productivity Practitioners for the Youth, Ulaanbaatar, Mongolia. | 01 | From 10th – 14th June 2024 | | ✓ | To get knowledge on Development of Productivity Practitioners for the Youth |
| 11 | JICA Knowledge Co- Creation Program – Promotion of Employment of Persons with Disabilities, Japan | 01 | From 23rd September to 12th October 2024 | | ✓ | To get knowledge Promotion of Employment of Persons with Disabilities |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 12 | Training Course on Productivity-linked Wage System, Cambodia | 02 | From 01st – 05th July 2024 | | ✓ | To get knowledge on Productivity-linked Wage System |
| 13 | Third Mid-Career Training Programme for island Service Officers of Sri Lanka under the Indian Technical & Economic Co-operation (ITEC) 2024/2025, India | 02 | From 22nd July – 02nd August 2024 | | ✓ | To get knowledge Third Mid-Career Training Programme for island Service Officers of Sri Lanka |
| 14 | Training Course on Good Regulatory Practice, Manila, Philippines | 02 | 23rd – 27th September 2024 | | ✓ | To get knowledge on Good Regulatory Practice |
| 15 | Multicounty Observational Study Mission on Implementing the Sufficiency Economy Theory to Sustain Community Development, Thailand | 01 | 31st July- 02nd August 2024, | | ✓ | To get knowledge on Implementing the Sufficiency Economy Theory to Sustain Community Development |
| 16 | MTCP: "Occupational Safety and Health Management for Asian Countries", Malaysia | 02 | From 14th – 25th October 2024 | | ✓ | To get knowledge on Occupational Safety and Health Management for Asian Countries |
| 17 | Training Course on Smart Manufacturing | 01 | From 26th -30th August 2024 | | ✓ | To get knowledge on Smart Manufacturing |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | Specialists, China | | | | | Specialists |
| 18 | Forth Mid-Career Training Programme for island Service Officers of Sri Lanka under the Indian Technical & Economic Co-operation (ITEC) 2024/2025, India | 02 | From 19th August – 30th August 2024 | | ✓ | To get knowledge on Field Administration, Public Policy and Good Governance |
| 19 | ITEC: International Certificate Programme on Social Welfare Administration in India | 01 | From 18th September to 08th October 2024 | | ✓ | To get knowledge on Social Welfare Administration in India |
| 20 | Training Course for Assessors for the Productivity Specialists Certification Program, Ho Chi Minh City, Vietnam | 01 | From 16th – 20th September 2024 | | ✓ | To get knowledge on Productivity Specialists Certification Program |
| 21 | Training Course for Assessors of the APO Certification Bodies, Bangkok, Thailand | 01 | From 25th -29th November 2024 | | ✓ | To get a knowledge Assessors of the APO Certification Bodies |

**වගුව 6.4** කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| අ.අ. | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | | කාල සීමාව | සමස්ථ ආයෝජනය (රු.) | නිමැවුම / ලබා ගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | තනතුර | සංඛ්‍යාව | | දේශීය | |
| සැලසුම්, පර්යේෂණ, පුහුණු හා ප්‍රකාශන අංශය විසින් පවත්වන ලද වැඩසටහන් | | | | | | |
| 1 | සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ නව ක්‍රමවේදය සම්බන්ධයෙන් නිලධාරී පුහුණු වැඩසටහන | බස්නාහිර කලාප II හා III ට අයත් දිස්ත්‍රික් කම්කරු කාර්යාලවල අදාළ නිලධාරීන් | 18 | 2024.01.11 | 26,250.00 | සේවක අර්ථසාධක අරමුදල සඳහා සාමාජිකයන් ලියාපදිංචි කිරීමේ නව ක්‍රමවේදය සම්බන්ධයෙන් අවශ්‍ය දැනුම ලබා දීම |
| 2 | නව කම්කරු නීතිය සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන (Zoom මාධ්‍යයෙන් අදියර දෙකක් යටතේ පවත්වන ලදී) | සියළුම කම්කරු නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් පවත්වන ලද වැඩසටහනකි. | 2024.02.08 | - | කම්කරු නීති සම්බන්ධ නවතම සංශෝධන පිළිබඳව නිලධාරීන් දැනුවත් වීම |
| 3 | වැටුප් පරිවර්තනය හා සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | ආයතන අංශයේ සහ වැටුප් අංශයේ අදාළ විෂය භාර නිලධාරීන් | 34 | 2024.02.29 | 12,890.00 | වැටුප් පරිවර්තනය හා සැකසීම පිළිබඳව නිලධාරීන් දැනුවත් වීම |
| 4 | නඩු ලේඛනය පවත්වාගෙනයාම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | ශාඛා ප්‍රධානීන් සහ අදාළ භාර නිලධාරීන් | Zoom මාධ්‍යයෙන් පවත්වන ලද වැඩසටහනකි | 2024.04.17 | - | නඩු ලේඛනය පවත්වාගෙනයාම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් වීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 5 | කම්කරු කොමසාරිස් ගිණුම නිරවුල් කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | ශාඛා ප්‍රධානීන් සහ අදාළ භාර නිලධාරීන් | Zoom මාධ්‍ය යෙන් පවත්ව න ලද වැඩස ටහන කි | 2024.04.25 | - | කම්කරු කොමසාරිස් ගිණුම නිරවුල් කිරීම සම්බන්ධයෙ න් දැනුම වර්ධනය |
| 6 | පැමිණිලි කළමනාකරණ පද්ධතිය සම්බන්ධයෙන් සහ පෙත්සම් ලේඛනය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන | කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලයන්හි, දිස්ත්‍රික් කම්කරු කාර්යාලයන්හි හා උප කම්කරු කාර්යාලයන්හි අදාළ විෂයභාර නිලධාරීන් | Zoom මාධ්‍ය යෙන් පවත්ව න ලද වැඩස ටහන කි | 2024.04.22 | - | පැමිණිලි කළමනාකර ණ පද්ධතිය යාවත්කාලීන ව පවත්වාගෙන යාම සම්බන්ධයෙ න් සහ පෙත්සම් ලේඛනය පවත්වාගෙන යාම සම්බන්ධයෙ න් දැනුම වර්ධනය |
| 7 | නවක කම්කරු නිලධාරීන්ගේ සේවාරම්භක පුහුණු වැඩසටහන | කම්කරු නිලධාරීන් | 57 | 2024.05.08 සිට 2024.09.06 | 2,329,850 | රාජකාරි ඉටුකිරීම සඳහා අවශ්‍ය දැනුම සහ සේවාරම්භක පුහුණුව ලබා දීම |
| 8 | කම්කරු දෙපාර්තමේන්තු වේ විධායක මට්ටමේ නිලධරයන් සඳහා නායකත්ව පුහුණු වැඩසටහන් මාලාව නේවාසික පුහුණු වැඩමුළුව (අදියර දෙකක් යටතේ පවත්වන ලදී) | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල්වරුන්, කම්කරු කොමසාරිස්වරු න්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරු න්, නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්), සහකාර කම්කරු කොමසාරිස්වරු න්, විශේෂඥ කර්මාන්තශාලා | පළමු අදියර සඳහා නිලධා රීන් 35 ක්ද දෙවන අදියර සඳහා නිලධා රීන් 80 ක්ද සහභා ගී විය | පළමු අදියර 2024.05.30 සිට 2024.06.01 දක්වා ද දෙවන අදියර 2024.08.29 සිට 2024.08.31 දක්වාද පවත්වන ලදී | 1,785,095.0 0 | විධායක මට්ටමේ නිලධාරින්ගේ නායකත්ව ගුණාංග, කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ හැකියාව, උපායමාර්ගික තීරණ ගැනීමේ හැකියාව, සුපිළිපන් නිලධාරියෙකු සතු ගුණාංග |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | පරීක්ෂක ඉංජිනේරුවරුන්, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්, කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්, පර්යේෂණ නිලධාරීන්, ගණකාධිකාරීන්, සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) සහ නීති නිලධාරීන් | | | | ආදී මෘදු කුසලතා වර්ධනය කිරීම |
| 9 | සේවක අර්ථසාධක අරමුදලේ 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ පුහුණු වැඩසටහන | සියලුම කලාප නියෝජ්‍ය කම්කරු කොමසාරිස් කාර්යාලවල සේවය කරන අදාළ විෂය භාර නිලධාරීන් සහ කුරුණෑගල දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ අදාළ විෂය භාර නිලධාරීන් | Zoom මාධ්‍ය යෙන් පවත්ව න ලද වැඩස ටහන කි | 2024.08.08 | - | සේවක අර්ථසාධක අරමුදලේ 30% පූර්ව ප්‍රතිලාභ ගෙවීම් සිදු කරනු ලබන ආකාරය සම්බන්ධයෙ න් දැනුම වර්ධනය |
| 10 | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන (අදියර දෙකක් යටතේ පවත්වන ලදී) | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් විෂයට අදාළ සියළුම නිලධාරීන් | Zoom මාධ්‍ය යෙන් පවත්ව න ලද වැඩස ටහන කි | 2024.07.31 දින සහ 2024.08.07 දින | - | සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ ගෙවීම් ක්‍රියාවලිය සම්බන්ධයෙ න් දැනුම වර්ධනය |
| 12 | භාණ්ඩ වට්ටෝරු ලේඛනය කළමනාකරණය, වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සහ වෙන්දේසි සම්බන්ධ පුහුණු වැඩසටහන | සියළුම ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරීන් සහ අංශ ප්‍රධානීන් | Zoom මාධ්‍ය යෙන් පවත්ව න ලද වැඩස ටහන කි | 2024.08.06 | - | භාණ්ඩ වට්ටෝරු ලේඛනය නඩත්තු කිරීම, භාණ්ඩ සමීක්ෂණය සහ වෙන්දේසි සිදු කිරීම |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | සම්බන්ධ ක්‍රියාවලි පිළිබඳව දැනුම වර්ධනය |
| 13 | රියදුරු වගකීම් හා ආචාරධර්ම පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුවේ රියදුරු සේවයේ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුළුව | සියළුම රියදුරන් | 65 | 2024.09.07 | 100,297.00 | රියදුරු වගකීම් හා ආචාරධර්ම පිළිබඳව දැනුම ලබා දීම |
| 14 | කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන (උතුරු කලාපය සහ නැගෙනහිර කලාපය සඳහා වැඩසටහන් දෙකක් අදියර දෙකක් යටතේ සිදු කරන ලදී) | උතුරු කලාපයේ සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් | 76 | 2024.10.12 සහ 2024.12.07 | 272,477.00 | සේවක අර්ථසාධක අරමුදල් ගෙවීම් ක්‍රියාවලිය සහ සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ දත්ත පද්ධතිය සම්බන්ධයෙන් දැනුම් වර්ධනය සහ මහජන සම්බන්ධතා පිළිබඳ කුසලතා වර්ධනය |
| 15 | ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධ වැඩමුළුව | ප්‍රසම්පාදන කටයුතු විෂය සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන නිලධාරීන් | 30 | 2024.12.10 | 65,995.00 | ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව නිලධාරීන්ගේ දැනුම වර්ධනය |
| 16 | Training on Personal data protection and Cyber Security | තොරතුරු තාක්ෂණ ශාඛාවේ නිලධාරීන් | 18 | 2024.12.20 | 25,600.00 | පරිගණක දත්ත ආරක්ෂාව සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය සහ ඒ හා සම්බන්ධ නීති |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | පිළිබඳ දැනුම වර්ධනය |
| 17 | කම්කරු නිලධාරින්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ පුහුණු වැඩමුළුව (සියලුම කලාප ආවරණය වන අයුරින් අදියර 07ක් යටතේ සිදු කරන ලදී) | කම්කරු නිලධාරීන් | 371 | 2024.08.21, 2024.10.05, 2024.10.09, 2024.10.19, 2024.10.23, 2024.11.23 සහ 2024.11.27 | 781,455.00 | නායකත්ව කුසලතා, සන්නිවේදනය සහ මෘදු කුසලතා වර්ධනය සහ සුපසන් රාජ්‍ය සේවකයෙකුගේ ගුණාංග පිළිබඳව දැනුවත් කිරීම |
| **බාහිර පුහුණු ආයතනයන්හි පුහුණුව සඳහා නිලධාරීන් යොමු කිරීම්** | | | | | | |
| **වැඩමුළු** | | | | | | |
| 1 | පුස්තකාල සම්පත් ඩිජිටල්කරණය සහ එහි තාක්ෂණික ප්‍රවණතා පිළිබඳ එක්දින වැඩමුළුව | පුස්තකාලයාධිපති | 1 | | 2,500.00 | පුස්තකාලයේ කටයුතු කාර්යක්ෂම වීම |
| 2 | විශේෂ සහ විශ්වවිද්‍යාල පුස්තකාල කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු අනුක්‍රමණිකාකරණය පිළිබඳ එක්දින වැඩමුළුව | පුස්තකාලයාධිපති | 1 | | 5,600.00 | පුස්තකාලයේ කටයුතු කාර්යක්ෂම වීම |
| 3 | ලංසු ලියවිලි සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන | ගණකාධිකාරිවරුන් සහ මුදල් අංශයේ විෂයභාර නිලධාරීන් | 4 | | 48,000.00 | ලංසු ලියවිලි සැකසීමේ කටයුතු වඩා විධිමත් වීම |
| 4 | Government Payroll System(GPS) | ගණකාධිකාරී (වැටුප්) සහ මුදල් අංශයේ විෂයභාර නිලධාරීන් | 4 | | 72,000.00 | Government Payroll System(GPS) හා |
| 5 | විදේශ පුහුණු කටයුතු සඳහා නිවාඩු හා දීමනා ලබා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ එක්දින පුහුණු | ආයතන ශාඛාවේ සහකාර කම්කරු කොමසාරිස් | 2 | | 14,000.00 | විදේශ පුහුණු සඳහා සහභාගීවන නිලධාරීන්ගේ නිවාඩු කටයුතු |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | වැඩසටහන | සහ සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ විෂයභාර නිලධාරී | | | | හා දීමනා ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුම වර්ධනය |
| 6 | Roundtable on Strengthening Social Dialogue in Sri Lanka | කම්කරු කොමසාරිස්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, සහකාර කම්කරු කොමසාරිස්වරුන් සහ කම්කරු නිලධාරීන් | 10 | | - (ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය විසින් පවත්වන ලද වැඩසටහනකි .) | සමාජ කතිකාව ප්‍රවර්ධනය සඳහා දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීම |
| **ඩිප්ලෝමා, උපාධි සහ පශ්චාත් උපාධි සඳහා යොමු කිරීම්** | | | | | | |
| 1 | ග්‍රාමීය සංවර්ධනය හා සැලසුම් පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | සහකාර කම්කරු කොමසාරිස් | 1 | | 200,000.00 | නිලධාන්ගේ රාජකාරි සඳහා අවශ්‍ය දැනුම වර්ධනය වීම |
| 2 | සමාජ විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව | සහකාර කම්කරු කොමසාරිස් | 2 | | 310,500.00 | |
| 3 | නීතිය පිළිබඳ පශ්චාත් උපාධිය | සහකාර කම්කරු කොමසාරිස් | 1 | | 250,000.00 | |
| 4 | Msc. in Computer Science (Cyber Secuirity) | කළමනාකරණ සේවා නිලධාරි | 1 | | 450,000.00 | |
| 5 | Msc in Occupational Safety & Health Management | විශේෂඥ කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු සහ දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | 5 | | 1,750,000.00 | |
| 6 | තොරතුරු පද්ධති කළමනාකරණය පිළිබඳ පාඨමාලාව | සහකාර කම්කරු කොමසාරිස් | 1 | | 87,500.00 | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 7 | Process Safety and Asset Integrity | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු | 1 | | 17,200.00 | |
| 8 | Diploma in Networking and Cyber Security | සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) | 1 | | 45,000.00 | |
| 9 | ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලා | කම්කරු කොමසාරිස් සහ සහකාර කම්කරු කොමසාරිස් | 2 | | 81,000.00 | |
| **ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ අනුග්‍රහය යටතේ පවත්වන ලද වැඩමුළු, සම්මන්ත්‍රණ සහ පුහුණු වැසටහන්** | | | | | | |
| 1 | Law Reforms and International Labour Standards : South Asia Information and Knowledge Ledge Sharing Event | සහකාර කම්කරු කොමසාරිස්, නීති නිලධාරී සහ කම්කරු නිලධාරී | 3 | 2024.11.19 සිට 2024.11.21 දක්වා | - - | අදාළ විෂයන් සම්බන්ධයෙන් අනෙකුත් රටවල Best Practices, ජාත්‍යන්තර ප්‍රමිති ආදිය පිළිබඳව දැනුම බෙදා ගැනීම |
| 2 | Labour Inspection in Sri Lanka (With Focus on Occupational Safety and Health) | අතිරේක කම්කරු කොමසාරිස් ජනරාල් (ඉංජිනේරු), සහකාර කම්කරු කොමසාරිස්වරුන්, දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් සහ කම්කරු නිලධාරීන් | 63 | 2024.10.09 සිට 2024.10.11 දක්වා | | |
| 3 | Capacity Building Training on Collective Bargaining, Social Dialogue, Workplace Cooperation and Grievance Handling | නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, සහකාර කම්කරු කොමසාරිස්වරුන්, සහ කම්කරු නිලධාරී | 30 | 2024.05.29 සිට 2024.05.30 දක්වා | | |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| 4 | Training of Trainers in WIND and WISE Methodologies for Occupational Safety and Heaith | දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන් සහ පර්යේෂණ නිලධාරී | 8 | 2024.06.04 සිට 2024.06.06 දක්වා | | |
| 5 | Dispute Resolution Diagnostic Workshop | කම්කරු කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්වරුන්, සහකාර කම්කරු කොමසාරිස්වරුන් සහ කම්කරු නිලධාරීන් | 22 | 2024.05.27 සිට 2024.05.28 දක්වා | | |
| 6 | Validation Workshop on Unemployment Insurance Scheme in Sri Lanka | කම්කරු කොමසාරිස් ජනරාල්, නියෝජ්‍ය කම්කරු කොමසාරිස්, සහකාර කම්කරු කොමසාරිස් | 5 | 2024.02.13 | | |

**වගුව 6.5 -** මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| | **වැඩසටහනේ නම** | **පුහුණු කරනලද සේවක සංඛ්‍යාව** | **වැඩසටහනේ කාලසීමාව** | **සමස්ථ ආයෝජනය** | **නිමැවුම/ලබාගත් දැනුම** |
|---|---|---|---|---|---|
| 1 | වෘත්තීය මාර්ගෝපදේශන පාඨමාලාව | නිලධාරීන් 16 | 2022 | 595,000 | වෘත්තීය මාර්ගෝපදේශ නිලධාරීන් ලෙස කටයුතු කිරීමට අවශ්‍ය වැඩිදුර දැනුම ලබාගැනිම |
| 2 | රජයේ වැටුප් සැකසීමේ ක්‍රියාවලිය සම්බන්ධ පුහුණුව | නිලධාරීන් 01 | 2024.03.11, 12,13 | 21000 | වැටුප් සකස් කිරිමේ ක්‍රියාවලිය සම්බන්ධ දැනුම |
| 3 | උපදේශන පාඨමාලාව | නිලධාරීන් 01 | 2024.03.27 | 40000 | උපදේශනය පිළිබඳ ඩිප්ලෝමාව |
| 4 | වැටුප් පරිවර්තන හා නිවාඩු සම්බන්ධ පුහුණුව | නිලධාරීන් 16 | 2024.07.29-2024.08.02 | 16840 | වැටුප් පරිවර්ථන හා නිවාඩු විෂය පිළිබඳ දැනුම |

**වගුව 6.6 -** මිනිස්බල හා රැකීරක්ෂා දෙපාර්තමේන්තුවේ නිලධරයන් විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| | **වැඩසටහනේ නම** | | **වැඩසටහනේ කාලසීමාව** | **සමස්ථ ආයෝජනය** | **නිමැවුම/ලබාගත් දැනුම** |
|---|---|---|---|---|---|
| 1 | Co-coordination for the project on promoting Employment Support of Person with Disabilities | නිලධාරීන් 02 | 2024.06. 04 – 2024.06. 15 | 242,831.30 | ආබාධ සහිත පුද්ගලයින් රැකියාගත කිරීම් සම්බන්ධව කටයුතු කළයුතු ආකාරය |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | Third Mid-career Training program for Island services of Sri Lanka under the Indian Technical and Economic Co-operation 2024/2025 | නිලධාරීන් 04 | 2024.07. 22 – 2024.08. 02 | 137,817.77 | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම |

**වගුව 6.7-** ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| | **වැඩසටහනේ නම** | **පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව** | **වැඩ සටහනේ කාල සීමාව** | **සමස්ත ආයෝජනය (රු)** | **නිමැවුම / ලබා ගත් දැනුම** |
|---|---|---|---|---|---|
| 01 | ප්‍රසම්පාදනය සම්බන්ධ මූලික වැඩමුළුව | 06 | 2025.01.30 | | ප්‍රසම්පාදනය පිළිබඳව |
| 02 | AI Tools and Blockchain application for /MSMEs Success ප්‍රායෝගික වැඩමුළුව | 02 | 2024.11.24 සිට සෑම ඉරිදා දින 12 ක් | 25 000.00 | AI Tools සම්බන්ධව |
| 03 | ඩිජිටල් අලෙවිකරණය පිළිබඳ පාඨමාලාව | 01 | 2024.08.24 සිට සෑම සති අන්තයේම දින 08 ක් | 25 000.00 | ඩිජිටල් අලෙවිකරණය සම්බන්ධව |
| 04 | රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 02 | | | රාජ්‍ය ප්‍රසම්පාදනය සහ කොන්ත්‍රාත් පරිපාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සම්බන්ධව |
| 05 | Facebook, Instagram, Linkedin & Tiktok සම්බන්ධ පාඨමාලාව | 04 | 2024. මැයි 18,25, ජුනි 01,08 | 12 000.00 | Facebook, Instagram, Linkedin & Tiktok පාඨමාලාව සම්බන්ධව |

| | | | | | |
|---|---|---|---|---|---|
| 06 | Decision Making Skill Workshop, Problem Solving and Negotiation workshop, Customer Care Excellence workshop, Communicational Presentation skills | 01 | 2024 මැයි 15,19 හා ජුනි 5,19 | 15 000.00 | About Communicational Presentation skills |
| 07 | වෘත්තිමය 5S විගණන කණ්ඩායම් පුහුණු කිරීමේ වැඩසටහන | 03 | 2024 ජුනි 03,04 | 22 500.00 | 5S විගණනය සම්බන්ධ දැනුම |
| 08 | Artificial Intelligence Fundamentals & Applications | 01 | 2024.03.22 සිට සති 18 ක් | 60 000.00 | කෘතිම බුද්ධිය සම්බන්ධ දැනුම |
| 09 | Training on ISO 21001:2018 - EOMS | 01 | 2024 ජනවාරි 14,15,16 | 20 000.00 | About Process of ISO 21001:2018 - EOMS |
| 10 | "ධනාත්මක ආකල්ප වර්ධනය" විශේෂ පුහුණු වැඩසටහන | | 2024.01.05 | 78 240.00 | ධනාත්මක ආකල්ප සම්බන්ධ දැනුම |

**වගුව 6.8 -** ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනයේ නිලධරයන් විදේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| | **වැඩසටහනේ නම** | **පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව** | **වැඩ සටහනේ කාල සීමාව** | **සමස්ත ආයෝජනය (රු)** | **නිමැවුම / ලබා ගත් දැනුම** |
|---|---|---|---|---|---|
| 01 | Good Regulatory Practices | 01 | 2024.09.23 සිට 2024.09.27 දක්වා | 20 873.52 | About Regulatory Practices |
| 02 | Workshop on the Business Model Canvas for Startups and Entrepreneurs වැඩසටහන | 01 | 2024.06.25 සිට 2024.06.28 දක්වා | 141 503.00 | About Business Model Canvas |

**වගුව 6.9 -** වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ නිලධරයන් දේශීය පුහුණු පාඨමාලා සඳහා සහභාගී වීම

| | වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ථ ආයෝජනය(රු.'000 ) | නිමැවුම/ලබාගත් දැනුම* |
|---|---|---|---|---|---|
| | | | | දේශීය | |
| 01 | SIDA Training | 1 | දින 01 | 4,000 | ආයතනයේ ලිපි ගොනු කළමණාකරනය |
| 02 | SL Library association | 2 | සති 01 | 20,000 | ආයතනයේ පුස්තකාලය කළමනාකරණය |
| 03 | Bureau veritas lanka | 1 | සති 02 | 46,000 | ආයතනයට ISO ප්‍රමිතිකරණය ලබා ගැනීම |

| | | | | | |
|---|---|---|---|---|---|
| 04 | Skill development Fund ltd | 1 | දින 02 | 5,000 | ආයතනය සතු වත්කම් කලමනාකරණය |
| 05 | ICBT Campus Ltd | 1 | මාස 03 | 19,950 | පාරිභෝගික කටයුතු මනාව හැසිරවීම |
| 06 | EB Exams training - NILS | 15 | දින 02 | 178,193 | සේවකයින් කාර්යක්ෂමතා කඩයිම් විභාග සඳහා සූදානම් කරවීම |
| 07 | Dip in Business finance. | 1 | වසර 01 | 75,000 | ආයතනයේ ගිණුම්කරන කටයුතු මනාව සිදුකරගෙන යාම සඳහා |
| 08 | VTEC | 1 | වසර 01 | 25,000 | පරිගණක ආශ්‍රිත කටයුතු කාර්යක්ෂමව සිදුකර ගැනීම සඳහා |

# අනුකූලතා වාර්තාව

වගුව **7.1 -** අනුකූලතා වාර්තාව

| | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ / අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේද** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අදාළ නැත | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නැත | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු. රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනව පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියලුම මාසික ගිණුම සාරාංශ (CIGAS) පිළියෙල කර | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම. (මූ.රෙ 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | | |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| | සකස් කිරීම | | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කර ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගනන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ. | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ. | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාරතාවල පිටපත් තළමනාකරන විගණන දෙපාර්තමේනතුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් | අනුකූල වේ. | | |

| | | | | |
|---|---|---|---|---|
| | කර තිබීම | | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රෙල්බ 1-2016-9 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ. | | |
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධිකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්භිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ. | | |
| 9.2 | වාහන ගර්භිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල වේ. | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ. | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ. | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ. | | |
| 9.6 | කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම. | අනුකූල නොවේ. | 2022 වර්ෂයේ මුල් කාර්තුවේ දී බදු වාහනවල සම්පූර්ණ අයිතිය පවරා ගෙන ඇත. | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම | | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබෙන ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| **12** | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමවන්ට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **අදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා /චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම | | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08වන හා 10වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ | | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ අමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන | අනුකූල වේ | | |

| | | | | |
|---|---|---|---|---|
| | සමස්ත කාර්යමණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | | | |
| 19.4 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |